කර්ම විපාක

සහ

සතර ආහාර

පූජ්‍ය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ.
පූජ්‍ය පලුගස්වැවේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ.
පූජ්‍ය මාන්කඩවල සමාහිත ස්වාමීන් වහන්සේ.

(දේශනා එකතුවකි.)

පිට කවරයේ ඇතුල් පැත්ත.

කර්ම විපාක

සහ

සතර ආහාර

පූජ්‍ය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ,

පූජ්‍ය පලුගස්වැවේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ

සහ

පූජ්‍ය මාන්කඩවල සමාහිත ස්වාමීන් වහන්සේ.

2020.04.13වැනි දින
බක් පුර පස්ළොස්වක පොහොය වෙනුවෙන්
ලබුනෝරුකන්ද අරණ්‍ය සේනාසනයේ සිට
Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද ධර්ම දේශනා
එකතුවයි.

පළමුවන මුද්‍රණය - 2020 ඔක්තෝබර් - (පිටපත් 5000)

ධම්දනය පිණිස යි.

පිටපත් කිරීම හා සංස්කරණය :

එච්.ඒ.අමරතුංග

සෝදුපත් බැලීම:

පූජ්‍ය පලුගස්වැවේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ,

තාක්ෂණ සහාය:

චමිලා අමරතුංග

පිටපත් ලබා ගැනීමට:

හෝමාගම - 011 2752352

මහනුවර - කේ. දයානන්ද මහතා - 077 7665198

මාතලේ බෝගහකොටුව විහාරය - 071 4466838

මාතර - දේශබන්ධු කේ. ජී. මුණිදාස මහතා -
071 4438747 - 077 3295174

ප්‍රකාශක:

දේශබන්ධු කේ. ජී. මුණිදාස මහතා,
33/6, අකුරැස්ස පාර, මාතර.

මුද්‍රණය:

කොලිටි ප්‍රින්ටර්ස්
17/2 පැගිරිවත්ත පාර, නුගේගොඩ
දු.කෑ: 011 4 870 333

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

2020 අප්‍රේල් මස 13වැනි දිනට යෙදුණුබක් පුර පසළොස්වක් පොහොය දිනරට තුළ පැවැති දුර්භික්ෂ තත්ත්‍වය නිසාලබුනෝරුවකන්ද අරණ්‍ය සේනාසනයේ දීZoom තාක්ෂණය හරහා පවත්වන ලදධම් දේශනා මාලාවඉමහත් ශ්‍රද්ධාවෙන් සහ ඔබ සැම කෙරෙහි උපන් කරුණාවෙන් යුතුවහැකිතාක් දුරට උන්වහන්සේලාගේ දේශනා විලාසයෙන් මලිබිත මාධ්‍යයෙන් සකස් කොට ඔබ අතට පිදීමකි.

සාකච්ඡාවක් ලිඛිතව සකස් කිරීමේදී, විශේෂයෙන් ම නව තාක්ෂණය පරිහරණය කිරීමේ දී දේශනාවිලාශය, වචන උච්චාරණ විලාශය, ශ්‍රවණ තත්ත්‍වය, කාර්මික තත්ත්‍වය, ආදී විවිධ ගැටලු හමුවන තැන් නිතිපතා විද්‍යමානවේ.කෙසේ වුව ද වර්තමානයෙහි බොහෝ දෙනා නිබඳ විමසන පැරණි කම්, නව කම්, සතර ආහාරපිළිබඳව වූ බුද්ධ දේශනාව අශ්‍රැතවත් හුදී ජනයාට පැහැදිලි කර දිමේ අරමුණෙන් අප ස්වාමිපාදයන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් කරන ලද මෙම දේශනය හොඳින් හදරා පරිශීලණය කොට සමාධිමත්වීමේ උත්සාහය ගන්නා මෙන් ඔබ සැමගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

පටුන

පිටු අංකය

1. උදේ වරුවේ දේශනය. 1 - 25
   පූජ්‍ය පලුගස්වැවේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ.

2. දහවල් දේශනය. 26 - 49
   පූජ්‍ය මාන්කඩවල සමාහිත ස්වාමීන් වහන්සේ.

3. පස් වරුවේ දේශනය. 50- 88
   පූජ්‍ය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ.

2020.04.13

බක් පෝය උදේ වරුවේ දේශනය.

පූජ්‍ය පලුගස්වැවේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

සදෘ පූජණීය, වන්දනීය, අප ධර්මාචාර්‍යයන් වහන්සේ ප්‍රධාන කොට ඇති ශ්‍රීමත් මහා සඞ්ඝරත්නයෙන් අවසර යි. සැදැහැති පින්වත්නි. බක් පුර පසළොස්වක් පොහෝ දවස වෙහෙර විහාරස්ථානවලට සම්බන්ධ වෙලා, ආගමික කටයුතු සිද්ධ කරන්නට නො හැකි වුනත්, තමන්ගේ නිවෙස්වලට වෙලා ආගමානුකූලව කටයුතු කරන්නට උත්සාහවත්වෙන දවසක් විදියට අද දවස පුරාවට අපි ජීවිතයේ ආධ්‍යාත්මික පැත්ත දියුණුකරගන්නට උත්සාහවත් වෙන්නට ඕන.

අද පෝය දවස ගත්තහම, වෙන ද, නම් මේ වෙන කොට අරණ්‍ය සේනාසනයකට, විහාරස්ථානයකට ගිහිල්ලා, ඒ ආගමික වැඩ කටයුතුවලට සම්බන්ධ වෙලා, ඒ දහම් දැනුම එකතුකරගන්නවා. නමුත් අද දවසේ අපි ඒ පිළිබඳව කල්පනා කරලා කණගාටුවෙන්නට අවශ්‍ය වෙන්නේ නැති වෙයි. ගෞරවණීය අපේ ස්වාමීන් වහන්සේත් මතක් කළේ ඒක යි. පෝය දවසේ මේ විදියේ වැඩ සටහණක් කරළා අපි ධර්මයෙන් අනුග්‍රහය දක්වමු කියන කාරණයඅපිත් එක්ක කථා කළා.

අද පෝය දවසේ වැදගත්කම් අතර ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ ශ්‍රී ලංකාවට දෙවැනි වතාවට වැඩම කරවන්නට යෙදුනා. එදා ඒ චූලෝදර-මහෝදර දෙන්නා අතර ඇතිවෙච්චි කළහය සංසිඳුවීම පිණිස, නාගදීපයට වැඩම කරන්නට යෙදුනේ අද වාගේ පුන් පොහෝ දවසක යි. ඉතින් පෝය දවස්වල, ඒ ඒ දවසට විශේෂිත වූ වැදගත්කම් තියෙනවා. නමුත් මේ වේලාවේ, ඒ පිළිබඳව දීඝ ව විස්තරයක් කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ලොවුතුරා බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළවෙලා, ඒ ලෝකවාසී සියලුම සත්ත්වයා කෙරෙහි හිතානුකම්පාවෙන්, මෙලොවට, පරලොවට, දෙලොවට ම යහපත පිණිස පවතින්නට විතරක් නෙවෙයි, මේ සංසාර ගමණ කෙළවර කරළා, නිවන් දකින්නට උපකාරවෙන ධර්මයක් ලෝකයාට දේශනා කරන්නට යෙදුණා. මෙලොව-පරලොව, දෙලොව යහපත සලස්වා ගැනීම පිණිස වන ප්‍රතිපදාවක් අනුගමණය කිරීමෙන් මෙලොව ජීවිතය සාර්ථක කරගන්නට ත්, පරලොව ජීවිතය සැපවත් කරගන්නට ත් පුළුවන්කම ලැබෙනවා. නමුත් නිර්වාණගාමී ප්‍රතිපදාවක් අනුගමණය කිරීම තුළින්, සාසංසාරික ගමණ කෙළවර කරළා නිවන් දකින්නට පුළුවන්කම ලැබෙනවා.

මේ දෙක අපි හඳුනාගන්නට ඕනේ. පුණ්‍ය ප්‍රතිපදාව තුළින් යහපත් ජීවිතයක්, යහපත් විදියට ගතකරන්නට පුළුවන් පරිසරය හදලා දෙනවා. ඒ පරිසරය උපකාර කරගෙන යි නිර්වාණගාමී ප්‍රතිපදාව පූරණය කරන්නට පහසුව ලැබෙන්නේ. මොකද පුණ්‍ය ප්‍රතිපදාව තුළින් කුසල කර්මයන් කරළා පින් රැස්කරගන්නට නො හැකි වුනොත්, අපි සතරමහා අපායට වැටුනොත්, ඒ දුක්ඛිත ජීවිත ගතකරමින් ඒ දුගතියේ ඉඳගෙන මේ දහම් මග යන්නට, ධර්ම අවබෝධ කරගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා සුගතියකට පත්වෙළා, මනුෂ්‍ය-දේව, මේ භවයන්වලට පත්වෙලා, ඒ තුළ ඉඳගෙන කටයුතු කරමින්, සැපවත් වූ දුක්ඛිත ජීවිතයක්,

එහෙම නැතිනම්, දුගතියට සාපේක්ෂව මහා සැපවත් වූ ජීවිතයක් ගතකරමින් තමයි, අපට මේ ධර්මය අහලා, නිර්වානගාමී ප්‍රතිපදාව පූරණය කරන්නට පුළුවන්කම ලැබෙන්නේ.

ඒ නිසා මේ කාරණාවත් සිහියේ තබාගෙන, බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නට යෙදුන සූත්‍ර ධර්මයක් උපකාර කරගෙන, මම අද මේ පින්වත් සෑම දෙනාට ම කරුණු කිහිපයක් විස්තර කරලා දෙන්නට බලාපොරොත්තු වෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර ධර්මයන් අතර **කම්ම සූත්‍රය**[1] අපට මුණගැසෙනවා සංයුත්ත නිකායේ සළායතන වග්ගයේ. මේ නව පුරාණ වාද කොටසේ කම්ම සූත්‍රය කියලා සූත්‍ර දේශනාවත් තිබෙනවා. මේ සූත්‍ර දේශනාවේ දී බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා ආමන්ත්‍රණය කරළා, 'මහණෙනි, මම ඔබට අලුත් කර්මය හා පැරණි කර්මය ද, කර්ම නිරෝධය ද, කර්ම නිරෝධ කරන ප්‍රතිපදාව ද, දේශනා කරනවා. එය අහන්න, මැනැවින් මෙනෙහි කරන්න' කියලා දේශනාව ආරම්භ කරනවා.

එතැන දී බුදුරජාණන් වහන්සේ,'මහණෙනි, පැරණි කර්මය කවරේ ද යත්' කියලා, ඒ පැරණි කර්මය පිළිබඳව විස්තරයක් දේශනා කළා. 'මහණෙනි, ඇස, ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලද, චේතනා විසින් පිළියෙළ කරන ලද, වේදනාවට වස්තුව ය යි දැක්විය යුතු, පැරණි කර්මයකි. කන ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලද, චේතනා විසින් පිළියෙළ කරන ලද, චේතනාවට වස්තුව ය යි දැක්විය යුතු, පැරණි කර්මයකි.' මේ විදියට, මේ ක්‍රමයට ම, නහය පිළිබඳව, ඒ වාගේ ම දිව පිළිබඳව, කය පිළිබඳව, සිත පිළිබඳව දේශනා කරළා, 'මේ ධර්මයන් ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලද, චේතනාව විසින් පිළියෙළ කරන ලද, වේදනාවට වස්තුව ය යි දැක්විය යුතු, පැරණි කර්මයකි' කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා.

[1]බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය (4) 266 වැනි පිටුව

මෙතැන දී අපි පැරණි කර්මයක් කියලා කිව්වහම තේරුම් ගත යුතු යි, මේ විපාක මට්ටමක්. ඇහැ කියලා කියන්නේ විපාක මට්ටමක්. එහෙම නම්, ඒ විපාකය ලැබෙන්න නම්, පෙර කර්මයකින් ම සකස්වෙන්න ඕන. පෙර කර්මයකින් සකස් කරන ලද්දක් කියලා කිව්වහම, අද වර්තමානයේ අපට මේක විපාක මට්ටමින් තියෙන්නේ. එහෙම නම් මේ විපාක මට්ටම ලැබෙන්න, පෙර ප්‍රත්‍යයන් එකතුවෙලා තමයි මේක හදලා තියෙන්නේ. මෙතැන දී ප්‍රත්‍යයන් හැටියට පැහැදිළි කරගන්නට තිබෙනවා **අවිද්‍යාවෙන්, කර්මයෙන්, තණ්හාවෙන් සහ ආහාරවලින් කියන මේ ප්‍රත්‍ය ටිකෙන් තමයි, මෙහේ ඇහැ සකස් කරන්නේ. කන සකස් කරන්නේ. නහය, දිව, ශරීරය, මනස කියන මේ හය ම සකස් කරන්නේ ප්‍රත්‍යයන් විසින්.** ඒකයි මේ හැම තැනේ දී ම මතක් කළේ ප්‍රත්‍යයන් විසින් එක්ව කරන ලද්දක්. ප්‍රත්‍යයන් විසින් තමයි මේ ටික සකස් කරළා දෙන්නේ. එතැන දී ප්‍රත්‍යයන් හැටියට **අවිද්‍යාව, කර්මය, තණ්හාව සහ ආහාර** කියන ප්‍රත්‍ය හතර සඳහන් කරන්න පුළුවන්කම තියෙනවා.

ඊළඟට පෙන්නනවා, **චේතනාව විසින් පිළියෙළ කරන ලද්දක්.** මේ ඇහැ චේතනාන්විත බවකින් යුක්ත යි. එහෙම නැති නම් කන-නහය-දිව-ශරීරය කියන මේ කාරණා ටික චේතනාවකින් යුක්ත යි. එතැන දී චේතනාව කියන එක අර්ථය තව දුරටත් ගත්තොත්, **කර්මය විසින් ම** කියන කාරණාව කියන තැන පැහැදිළි කරගන්න පුළුවන්කම තියෙනවා. මොකද, චේතනාව කියලා කියන එකෙන් අපට කර්මය පිළිබිඹු කරන නිසා. එතකොට කර්මය විසින් ම සකස් කරන ලද්දක් නිසා තමයි, මේක මේ පැරණි කර්මයකින් කියන කාරණාවක් පැහැදිළිකරගන්න පුළුවන්කම තියෙන්නේ.

<u>පැරණි කර්මය</u>:- එතකොට **වේදනාවට වස්තුව** ය යි දැකිය යුතු පැරණි කර්මයකි. මේ කර්මය තුළින්, පැරණි කර්මය තුළින් සකස් කරළා තියෙනවා වේදනාවට වස්තුවක් විදියට. ඒක අපි පැහැදිළි කර ගත්තොත්, මේ ඇහැ-කන-නහය-දිව-ශරීරය-මනස කියන මේ

ධර්මතා හය ම, පෙර කර්මයෙන් සකස් කරළා තියෙන්නේ, කුමක් උපදවා ලීම සඳහා ද, කුමක් සකස් කරන්න ද, කියලා ගත්තහම, මේ හැම ධර්මයකින් ම පෙන්නන්නේ, ඇහැත්-රූපයත්-චක්ඛුවිඤ්ඤාණයත් නිසා ස්පර්ශයක් ඇතිවෙලා වේදනාවක් උපදවනවා. කනත්-ශබ්දයත්-සෝතවිඤ්ඤාණයත් නිසා ස්පර්ශයක් ඇතිවෙලා වේදනාවක් උපදවනවා. මේ විදියට මේ ආයතන ටිකේ ක්‍රියාකාරකම ගත්තහම මෙන්න **මේ ආයතනයන් හයෙන් ම අවසානයේ දී කරලා තියෙන්නේ වේදනාවක් උපද්දවාපු එක යි.** එහෙම නම් මේ වේදනාව උපද්දවන්නට වස්තුව වෙලා තියෙන්නේ මෙන්න මේ ඇහැ-කන-නාසය-දිව-ශරීරය-මනස කියන මේ සය ආයතන යි.

මේ ටික පැරණි කර්මයෙන් සකස් කරලා තියෙන්නේ. එහෙම නම් මේ පැරණි කර්මයෙන් සකස් කරපු මේ ආයතන ටික වේදනාවට ම වස්තුවක් වෙලා තියෙනවා. ඒ කියන්නේ වේදනාව උපදවාලීම පිණිස උපකාර කරපු වස්තුවක් බවට පත්වෙනවා.

- ඉතින් මෙන්න මේ ධර්මතා ටික එකට කැටිකරළා ගත්තහම ප්‍රත්‍යයන්ගෙන් සකස්වෙලා තියෙන්නේ.
- චේතනා විසින් පිළියෙළ කරළා තියෙන්නේ.
- ඒ වාගේ ම වේදනාවට වස්තු විෂයක්, එහෙම නැතිනම් වස්තුවක් විදියට කටයුතු කරළා තියෙන්නේ.

මෙන්න මේ ටිකේ ක්‍රියාකාරකම් ටික ඔක්කෝම එකට එකතු කරළා ගත්තහම, **මෙයින් නියෝජනය කරළා තියෙන්නේ පැරණි කර්මය යි.**

<u>අලුත් කර්මය</u>:- ඊළඟට, 'මහණෙනි, අලුත් කර්මය කවරේ ද යත්', කියලා. බුදුරජාණන් වහන්සේ අලුතෙන් කරන කර්මය පෙන්නනවා. 'මහණෙනි, දැන් කයින්-වදනින්-සිතින් යම් කර්මයක් කෙරේ නම්, මහණෙනි, මේ අලුත් කර්මය යි කියනු ලැබේ'. වර්තමානය තුළ කායකම්ම-වචීකම්ම-මනෝකම්ම කියන, එහෙම නැතිනම් කයින්-

වචනයෙන්-මනසින් යම් ආකාරයක කර්මයක් කෙරෙනවා නම්, මේ කර්මයන් නව කර්ම හැටියට එහෙම නැතිනම් අලුත් කර්ම හැටියටපෙන්නනවා. (මේ පිළිබඳව මම පසුව නැවත විස්තර කරන්නනම්, පැහැදිළි කරන්නම්.)

මෙතැන දී කයින් කෙරෙන කර්මයන් හැටියට, කාය කර්ම හැටියට කුසල අකුසල වශයෙන් ප්‍රබේධ කරන්න පුළුවන්. වචනයෙන් කරන කර්ම හැටියට කුසල අකුසල විදියට වර්ග කරන්න පුළුවන්. මනෝකර්මත් කුසල අකුසල වශයෙන් වර්ග කරන්න පුළුවන් කියලා තියෙනවා.

- මේ විදියට කයෙන් යම් ක්‍රියාවක් කරනවා නම්, ඒ ක්‍රියාව තමන්ටත් යහපත් වෙන, අන් අයටත් යහපත් වෙන විදියට නම් ඒ ක්‍රියාව කරන්නේ, එය කුසල කර්ම හැටියට සලකනවා. වචනය ත් ඒ විදියට ම යි. මනෝකර්ම ත් ඒ විදියට ම යි. තමන්ට ත් යහපත් වෙන, අනුන්ටත් යහපත් වෙන යම් යම් ක්‍රියාවක්, යම් වචනයක්, යම් සිතක් සිතුවිල්ලක් පහළවෙනවා නම් මෙය කුසල කර්ම හැටියට ගැනෙනවා.
- තමන්ට ත් අයහපත ගෙන දෙන, අනුන්ට ත් අයහපත ගෙනදෙන, එක්කෝ තමන්ට හෝ අනුන්ට හෝ අයහපත ගෙන දෙන යම් ක්‍රියාවක්, වචනයක්, චේතනාවක්, එහෙම නැතිනම් සිතක් තිබෙනවා නම් ඒ කායකර්ම-වචීකර්ම-මනෝකර්ම අකුසල කර්මයක් මෙන් ගැනෙනවා.

මේ සියලුම ධර්මතා, මේ සියලුම කාරණා ටික එකට කැටි කළහම ඒ සියල්ලට ම කියනවා. නව කර්ම එහෙම නැතිනම් අලුත් කර්ම කියලා.

<u>කර්ම නිරෝධය</u> :-ඊළඟට බුදුරජාණන් වහන්සේ,'මහණෙනි, කර්ම නිරෝධය කවරේ ද යත්', කියලා කර්ම නිරෝධයත් දේශනා කරනවා. 'මහණෙනි, යම් කායකර්මයක්, වාග්කර්මයක්,

මනෝකම්මයාගේ නිරෝධයක්, විමුක්තියක් ස්පර්ශ කෙරේ නම්, ඒ කියන්නේ යම් කායකම්මයක්, වාග්කම්මයක්, මනෝකම්මයක් තියනවා නම්, මේවා නිරෝධයෙන් විමුක්තිය ස්පර්ශ කරනවා නම්, අන්න ඒකට කියනවා කර්‍ම නිරෝධය යි කියලා'.

මෙතැන දී විස්තර කරගන්න ඕනේ මේ කර්‍මයන්ගේ නිරෝධයෙන් විමුක්තිය ස්පර්ශ කරනවා නම් කියන්නේ කුමක් ද කියලා. **නිරෝධයෙන් කියලා කියන එකෙන් අදහස් කරන්නේ නැවත හට නො ගන්නා මට්මක්, එහෙම නැතිනම්, නො හටගන්නා වූ කාරණාවක්.** එහෙම නැතිනම් එහි හේතුව දුරු කිරීමක්. හේතුව දුරුවුණහම ඒ ක්‍රියාව නතරවෙනවා. එහෙම නම් ඒ හේතුව නැතිකළහම ක්‍රියාවලිය නතරවෙන්න ත් ඕනේ, ඒ විතරක් නෙවෙයි, විමුක්තිය ස්පර්ශ කරන්න ත් ඕනේ. මෙන්න මේ ක්‍රියාවලිය, එහෙම නැතිනම් හේතුව නතරවෙලා, නිරෝධය ස්පර්ශ කරන්න, එහෙම නැති නම් විමුක්තිය ස්පර්ශ කරන්න පුළුවන් මට්ටමට පත්වුණොත්, අන්න එදට යි කර්‍ම නිරෝධයකට පත්වුණා කියලා කියන්නේ.

<u>කම්ම නිරෝධ ගාමිණී ප්‍රතිපදාව</u>:- ඊළඟට බුදුරජාණන් වහන්සේ මතක් කරනවා, 'මහණෙනි, කම්ම නිරෝධ ගාමිණී ප්‍රතිපදාව කවරේ ද යත්' කියලා, බුදුරජාණන් වහන්සේ මේ ආර්‍ය අෂ්ඨාඞ්ගික මාර්‍ග කම්ම නිරෝධ ගාමිණී ප්‍රතිපදාව හැටියට දේශනා කරනවා. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියන මේ කම්ම නිරෝධ ගාමිණී ප්‍රතිපදාව යි කියලා මේ ආර්‍ය අෂ්ඨාඞ්ගික මාර්‍ග දේශනා කරනවා.

ඉන් අනතුරුව, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, 'මහණෙනි, මෙසේ මා විසින් තොපට පැරණි කර්‍ම දේශනා කරන ලදී. අලුත් කර්‍ම දේශනා කරන ලදී. කර්‍ම නිරෝධය දේශනා කරන ලදී. කර්‍ම නිරෝධ ගාමිණී ප්‍රතිපදාව දේශනා කරන ලදී. මහණෙනි, ශ්‍රාවකයින්ට හිතෛෂී, අනුකම්පා කරන ශාස්තෘවරයකු

විසින්, අනුකම්පාව නිසා ම, යමක් තොපට කටයුතු නම්, මා විසින් එය තොපට කරන ලදී. මහණෙනි, තෙල රුක්මුල් ඇත්තේ ය, ශූණ්‍යාගාර ඇත්තේ ය, මහණෙනි, ධ්‍යාන කරවු. පමා නො වී විපිළිසර බවකින් යුක්ත නො වී තොපට මේ කටයුතු සිද්ධ කරන්නට අපගේ අනුශාසනාව යි' කියලා බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව හමාර කරනවා.

ඉතින් මෙතැන දී මේ සූත්‍ර දේශනාවේ දේශනා අර්ථය, දේශනාව ගත්තහම, ඔන්න ඔය ප්‍රමාණයකින්, ඔය කියන කාරණා ටිකෙන්, සූත්‍රය දේශනාව සිද්ධ කරනවා. නමුත් මේ සූත්‍රය තුළ සඳහන්වෙන දහම් අර්ථය අපි එකින් එක එකින් එක විස්තර කරමින් උකහා ගතයුතු යි. අර්ථාන්විත බවකින් ගන්නට ඕනෑ වෙනවා. එතැන දී පැරණි කර්මයත්, නව කර්මයත්, කර්මයාගේ නිරෝධයත්, කර්ම නිරෝධ කරන ප්‍රතිපදාවත් කියලා, ධර්මතා හතරක් දේශනා කරන්නට යෙදුණා. එතැන දී මේ ධර්මතා හතර අපි වෙන් කරළා හඳුනාගත්තොත් අද මේ අපි ඇහැ-කන-නහය-දිව-ශරීරය-මනස කියන මේ ධර්මතා ටික පැරණි කර්ම හැටියට යි පැහැදිළි කර ගත්තේ. එහෙම නම් එයින් ලැබෙන විපාක ටිකක් තමයි අද අපි මේ, මේ ආයතන ටික පරිහරණය කරමින් ජීවත්වෙන අපේ මේ වර්තමාන ජීවිතය. ඒ තමයි විපාක මට්ටම. එහෙම නැතිනම් අපේ ලෝකය, එහෙම නැතිනම් අපේ ජීවිතය කියලා අපි කතා කරන්නේ.

තව විදියකට කිව්වොත් **අපි ජීවත්වෙනවා කියලා කියන්නේ ම දුක ජීවත් කරවනවා කියන එක යි**. එහෙම නම් මේ ආයතන ටිකෙන් අපි අද කටයුතු කරනවා, එහෙම නැතිනම් මේ පැරණි කර්ම ටිකේ අර්ථය ගත්තහම මේ දුක ම යි මේ සඳහන් කරලා තියෙන්නේ. දුක් විපාක උපදවන, දුකට පමුණුවන, දුක ම උරුම කරවන, දුකට ම බහාලන, ධර්මතා ටික තමයි අද මේ පරිහරණය කරන මට්ටමට අපි කටයුතු කරළා තියෙන්නේ. මේ ටික පැරණි කර්මයකින් ලැබෙන විපාකයක් විදියට යි.

<u>නව කම්</u> :-ඊළඟට බලමු නව කම් පිළිබඳව. නව කම් කියලා කියන්නේ කයෙන්-වචනයෙන්-හිතෙන් කරන කම්යන් ටික යි. කයෙන්-වචනයෙන්-සිතෙන් යම් කම්යක් කරනවා නම් මේ ටික නව කම් හැටියට ගැනෙනවා.

දැන් මෙතැන අපි මේ සම්බන්ධය කොහොම ද ගොඩනැගෙන්නේ කියලා බලන්න ඕන. ඒ කියන්නේ සිත තිබුණාට, කය තිබුණාට, වචනය තිබුණු පමණකින් ම කම් වෙනවා ද? එහෙම නැතිනම් කයෙන් කම් කරන්න පුළුවන් වෙන්නේ කොහොම ද? වචනයෙන් කම්යක් වෙන්නේ කොහොම ද? මනසින් කම්යක් වෙන්නේ කොහොම ද? කියලා අපි මේ අර්ථය විස්තර කරගන්න වෙනවා. මේ සඳහා අපට මේ කම්යන් සිද්ධවෙන්නේ කොහොම ද, මොන ප්‍රත්‍යයකින් ද කියන එක පිළිබඳව දැනගතයුතු වෙනවා.

අවිද්‍යා ප්‍රත්‍යයකින් තමයි මේ කම් සිද්ධවෙන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ *අවිජ්ජා පච්චයා සංඛාරා* කියලා යි. සංඛාර කියන තැන තමයි පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර සහ ආණෙඤ්ජාභිසංඛාර කියලා මේ සංඛාරයන් වර්ගීකරණය කරන්නේ.

එතතොට මෙතැනදී ත් කම්යන් පිළිබඳව කතා කරනවා, කායකම්ම්-වචීකම්ම-මනෝකම්ම කියලා. යම් කෙනෙක් කායකම්ම්-වචීකම්ම-මනෝකම්මයන් සිද්ධකරනවා නම්, ඒ සිද්ධ කරන්නට පුළුවන් වෙලා තියෙන්නේ, යම් කම්යක් සිද්ධ කරනවා නම්, ඒ සියලුම කම්යන් සිද්ධකරන්නට පුළුවන්කම තියෙන්නේ අවිද්‍යාව මුල්කරගෙන යි. **එහෙම නම්, අවිද්‍යාව මුල්කරගෙන කම් සකස්වෙනවා නම්, කම්යන් කරන්න පුළුවන්කම ලැබෙනවා නම් එහෙම නම් මෙතැන දී නව කම්යක් සිද්ධකරන්නට ත් අනිවාර්‍යයෙන් ම අවිද්‍යාව මූලික විය යුතු වෙනවා.**

පැරැණි කම්යක විපාක විදියට අද ඇහැට රූප පෙනෙනවා, කනට ශබ්ද ඇහෙනවා, නාසයට ගඳ-සුවඳ දැනෙනවා, දිවට රස, කයට

ස්පර්ශයන් සහ හිතට ධර්ම අරමුණු පහළවෙනවා. මේ අරමුණු පහළවෙන කොට, මේ අරමුණුවල අවසාන ප්‍රතිඵලය විදියට සිද්ධවෙන්නේ වේදනාවක් උපද්දවන එක පමණ යි. ඒක යි අපට මේ පැරැණි කර්මය කවරේ ද කියලා විස්තර කරන කොට වේදනාවට ම වස්තුවක් විදියට මේ පැරැණි කර්මයන් දකින්න කියලා පෙන්නුවේ. වේදනාවට විතරම ම යි, ඒ කියන්නේ මේ පැරැණි කර්මයෙන් කරන්න පුළුවන් එක ම කායර්‍යය වේදනාවක් උපද්දවන එක විතරම ම යි. ***චක්ඛුං පටිච්ච රූපෙ උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංඝති ඵස්සෝ ඵස්ස පච්චයා වෙදනා*** කියන තැනකින් නතර කළේඒක යි.

නමුත් එතැනින් එහාට නතරවෙන්නේ නැහැ මේ කියන ධර්මතාවය අඳුනා නොගත්තොත්. වෙදනා පච්චයා කියන තැනකින් අන්න, ඊළඟ ක්‍රියාවලිය පෙන්නනවා. ***තණ්හා පච්චයා උපාදානං උපාදාන පච්චයා භවෝ භව පච්චයා*** තමයි ජාති-ජරා-ව්‍යාධි-මරණා දි මේ දුක් ටික හටගන්නේ.

එතකොට මේ දුක් ටික හටගන්නේ තණ්හාව යෙදුණා ම යි. තණ්හාව නොයෙදුණොත් දුක හටගන්නේ නැහැ කියලා අපට ධර්මයේ පැහැදිළි කරනවා **ලෝක සමුදය සූත්‍ර** දේශනාව එහෙම ගත්තහම.

එතැන දී පැහැදිළිකරගන්න පුළුවන් කාරණාවක් තියෙනවා, මේ පැරැණි කර්මයෙන් කරන්න පුළුවන්, එහෙම නැතිනම් පැරැණි කර්මයට ලැබෙන විපාක ටිකට කරන්න පුළුවන් එක ම කායර්‍යය ස්පර්ශයක් හදලා, ඒ ස්පර්ශයට අනුව විඳින බවක්, එහෙම නැතිනම් වේදනාවක් උපද්දවන එක විතර යි. එහෙම නම් වේදනාවක් උපද්දපුවහම මේ වේදනාව කායකර්මයක්, වචීකර්මයක්, මනෝකර්මයක් බවට පත්වෙන්නේ කොහොම ද? වේදනාව තුළ කායකර්ම-වචීකර්ම-මනෝකර්ම කියන කාරණා අන්තර්ගත වෙලා නැහැ. වේදනාව තුළ ඒ ධර්මතා නැහැ. නමුත් වේදනාව කියන එක තවදුරටත් ඉදිරියට ගමන් කරළා කර්මයක් බවට පත්කරනවා.

අවිද්‍යාව නිසා යි කර්මයක් සකස් වෙන්නේ. එහෙම නම් අවිද්‍යාව කියලා කියන්නේ ම මෙන්න මේ චතුරාර්‍ය සත්‍ය ධර්මය නොදන්නාකමට යි. නොදකිනකමට යි. මොකක් ද චතුරාර්‍ය සත්‍යය කියලා කියන්නේ? දුකත්, දුකට හේතුවත්, දුකේ නැතිවීමත්, නැතිකරණ ක්‍රමවේදය මොකක් ද කියලා ප්‍රතිපදාවත් දකින්නේ නැතිනම් යම් කෙනෙක්, අන්න ඒ නොදකිනකම හින්දා ම ඒ කෙනාට අවිද්‍යාවෙන් යුක්ත වෙනවා.

යම් තැනක අවිද්‍යාවක් තිබුණොත්, ඒ අවිද්‍යාව ප්‍රත්‍ය වෙනවා, කර්ම කිරීම සඳහා. යම් කෙනෙක් කායකර්ම-වචිකර්ම-මනෝකර්ම කරනවා නම්, ඒ කරන කායකර්ම-වචිකර්ම-මනෝකර්ම සඳහා, එහෙම නැතිනම්, නව කර්ම සඳහා ප්‍රත්‍ය වෙලා තියෙන්නේ චතුරාර්‍ය සත්‍යය නොදන්නාකම යි.

එහෙම නම් දුක දන්නේ නැති නම්, දුකට හේතුව දන්නේ නැතිනම්, දුකේ නැතිකිරීමක්, නිරෝධයක් දන්නේ නැති නම්, ඒ දුක නැතිකරන්න ප්‍රතිපදාවක්, ක්‍රමවේදයක් දන්නේ නැති නම්, අන්න ඒ අවස්ථාවේ මෙන්න මේ කර්මයන් රැස්වෙන ගනයට යනවා.

අපි මේක තව දුරටත් විස්තර කරගත්තොත් : ඇහැට රූපයක් පෙනිලා, ස්පර්ශයක් ඇතිවෙලා, වේදනාව කියන තැනින් ඇහේ කෘත්‍යය ඉවර යි. එහෙම නැතිනම් පැරණි කර්මයෙන් කරන කෘත්‍යය ඉවර යි. එහෙම සිද්ධියක් වෙන කොට ඒ සිද්ධවෙච්ච පැරණි කර්මය තුළ සිද්ධ කරන ලද ධර්මතාවල සිදුවීමේ ඇත්ත නොදකින කොට, නුවණකින් ඇත්ත දකින්නේ නැතිවෙන කොට, ඒ සිද්ධිය අරභයා, අරමුණු කරළා, හිතන, කල්පනා කරන ගතිය තුළ ආශ්‍රවයන් කෙලේසයන් මිශ්‍ර වෙලා, හිතලා, කල්පනා කරළා ඇතිකරගන්නා ප්‍රපංච ටිකක්. එහෙම නැතිනම් හිතන, කල්පනා කරන දේ තුළ සම්මුතියක් හදාගන්නවා.

අන්න ඒ හදගත්ත ප්‍රපංචවලින්, නැවත හිතන්න, කල්පනා කරන්න, එහෙම නැතිනම් කියන්න, කරන්න ගියහම අන්න ඒ තුළ තමයි නැවත කම් රැස්වෙන ගනයට යන්නේ.

මේක තවත් පැහැදිළි කරගත්තොත්: ඇහැට රූපයක් පෙනිලා වේදනාවත් ඇතිවෙන කොට ඒ ක්‍රියාවලිය ඇත්තට ම ධම්මානුකූලව දකින්නේ නැතුව, කම් විපාකයක් හැටියට දකින්නේ නැතුව, පැරණි කම්යක් කියලා දකින්නේ නැතුව, එතැන දකින්නේ "මට පෙනුනා" කියලා යි. එතැන දී ඒ පෙනීම තමාගේ දෙයක් බවට පත්කරගන්නේ ඒ පෙනෙන දේ අරහයා තණ්හා උපාදානය ඇතිකරගෙන දිට්ඨියක් ඇතිකරගන්නවා අත්තවාද වූ, එහෙම නැතිනම් සත්ත්ව-පුද්ගල වූ ආත්මීය හැඟීමක් හිතේ ඇතිකරගෙන, ඒ ඇතිකරගත්තා වූ පුද්ගල හැඟීමෙන් තමයි ඒ පැරණි කම්ය පරිහරණය කරළා තියෙන්නේ. ඒ කම්ය පැත්තට නැඹුරුවෙලා තියෙන්නේ.

එහෙම නම් පෙනුන දේ අරහයා දැකපු කෙනෙක් හදගන්නවා නම්,"මම දැක්කේ" කියලා හිතනවා නම්, ඒ හිතෙන එක පෙනෙන එකට අයිති එකක් නෙවෙයි. පෙනෙන දේට අයිති වෙලා තිබුණේ, පෙනෙන දේට අවසාන ප්‍රතිපලයක් ගෙනැල්ලා දුන්නේ ස්පර්ශයකට වේදනාවක් ගෙනැල්ලා දුන්න කාරණයක් විතර යි.

ඒ විඳින ස්වභාවය පුද්ගලයෙකුට අයිති කරගෙන, පුද්ගලයෙක් විඳිනවා කියන හැඟීමකට පත්කරගෙන, "මම යි, මගේ යි" කියන හැඟීමෙන් ඒ වේදනාවට නැඹුරුවුණහම තමයි, ඒ වේදනාව අරහයා හිතන, කල්පනා කරන බව නැවත ඇතිවෙන්නේ. ඒ වේදනාව පැත්තට නැඹුරුවෙලා, එහෙම නැතිනම් ඒ ආයතනය පැත්තට නැඹුරුවෙලා, නැවත හිතන, කල්පනා කරන ගතිය තුළ, යම් දෙයක් හිතයි, කල්පනා කරයි ද, ඒ වාගේ ම යමක් කියයි, කරයි ද, කායකම්ම-වචීකම්ම-මනෝකම්ම කියන මෙන්න මේ නව කම්යන් උපදින්න හේතු වෙනවා.

නව කර්මයක් උපදින සෑම අවස්ථාවක ම ඒ තුළ අවිද්‍යාව අන්තර්ගත බවක්තියෙනවා. අවිද්‍යාව ප්‍රත්‍ය වෙලා තියෙනවා. අවිද්‍යාව හේතු වෙලා තියෙනවා.

එහෙම නම් අවිද්‍යාවෙන් යුක්තව යම් කෙනෙක් හිතනවා නම්, කල්පනා කරනවා නම්, ඒ වාගේ ම කියනවා නම්, කරනවා නම් යමක්, ඒ කියන, කරන, හිතන හැම දේ ම කර්ම වශයෙන් ම සිද්ධවෙනවා. මොකද, එතැන ධර්මතා වශයෙන් හඳුනන්නේ නැතුව කරන කෙනෙක් ඉන්නවා; පුද්ගලයෙක් ඉන්නවා. පුද්ගලයෙක් හිතන්නේ, පුද්ගලයෙක් කියන්නේ, පුද්ගලයෙක් කරන්නේ කියන ගණයෙන් තමයි මේ කර්ම රැස්වෙන බවට පත්වෙන්නේ.

ඒක රූපාවචර මට්ටමේ කර්ම වෙන්න පුළුවන්. අරූපාවචර මට්ටමේ කර්ම වෙන්න පුළුවන්, ඒ වාගේ ම කාමාවචර සුගති හෝ දුගති මට්ටමේ වෙන්න පුළුවන්. යම් ම විදියේ කුසලමය මට්ටමෙන් හෝ අකුසලමය මට්ටමෙන් කර්මයක් කරන බවට පත්වෙනවා. මොකද, කරන්නෙක් ඉන්න නිසා. කරන පුද්ගලයෙක් ඉන්න නිසා.

එහෙම නම් මෙන්න මේ නව කර්ම, අලුත් කර්මයන් සිද්ධවෙන හැම තැනක ම මේ අවිද්‍යාව මිශ්‍ර වුණ, පුද්ගලභාවයෙන් යෙදුන, කර්ම කරන්නෙක් හම්බවෙනවා. මෙන්න මේ කර්ම කරන්නා ඉන්න තාක් කල්, කර්ම නො කර ඉන්නවා කියන කාරණාවකින්, එහෙම නැතිනම් කර්මය කරන එකෙන් වැළැකිලා ඉන්නවා කියන දෙයකින් මිදෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, ප්‍රත්‍ය හේතුව තිබෙනවා නම් ඵලය ලැබෙන කාරණයක්. අවිද්‍යාව ප්‍රත්‍ය වෙලා තියෙන තාක් කල්, ඵලය හැටියට කර්මය ලැබෙනවා ම යි. ඒ නිසා යි අවිද්‍යාව නිරෝධවීමෙන් ම සංඛාර නිරෝධයක් පනවන්නේ. අවිද්‍යාව නිරෝධවුණොත් පමණම යි කර්ම නිරෝධයක් පනවන්න පුළුවන්කම තියෙන්නේ.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ කම්ම නිරෝධයේ දී පෙන්නනවා, **"මහණෙනි, යමෙක් කායකම්ම, වචීකම්ම, මනෝකම්මයන්ගේ නිරෝධයෙන් විමුක්තිය ස්පර්ශ කෙරේ නම්, මහණෙනි, මේ කර්ම නිරෝධය යි කියනු ලැබේ".**

නිරෝධය පැනෙව්වේ යමක් නොකර ඉන්න එකෙන් නෙවෙයි. අපි හිතමුකොට කායකම්ම, වචීකම්ම නැතිකරන්න, එහෙම නැතිනම් නතරකරන්න අපි කතා නොකර ඉන්නවා. කිසි ම වැඩක් කරන්නේ නැතුව, කාය ක්‍රියාවලියක් නොකර ඉන්නවා. අපි මනෝකම්ම නැතිකරන්න හිතන්නේ කල්පනා කරන්නේ නැතුව ඉන්නවා.

නමුත් බුදුරජාණන් වහන්සේ මේ ක්‍රියාවලිය නතර කිරීමේ දී කම්ම නිරෝධය පැනෙව්වේ නැහැ. නිරෝධය පෙන්නුවේ නැහැ. එහෙම නිරෝධය කියලා පෙන්නුවේ විමුක්තිය ස්පර්ශකරන්නත් ඕන. නිවන ස්පර්ශකරන්න ඕන.

එහෙම නම් මෙතැන කම්ම නිරෝධය කොහොම ද සිද්ධවෙන්නේ කියලාබලමු. යම් කෙනෙක් කතා නොකර හිටියොත්, ඒ තුළින් වචීකම්මයක් නොවී තියෙනවා නම්, මම හිතන්නේ මේ ලෝකයේ උත්පත්තියෙන් ම කතා කරන්න බැරි අය වාග් කර්මය සිද්ධකරගන්නේ නැතුව, ඒ අයට විශාල වශයෙන් වචනය සංවරකරන්න පුළුවන්කම ලැබෙයි.

කායකම්මයෙන් වැළැකෙනවා කියලා කියන්නේ කිසිවක් නොකර ඉන්නවා නම්, අපි හිතමුකෝ මේ කය ක්‍රියාත්මක කරන්න බැරි මට්ටමට යම් කායික අපහසුවක් ඇතුව ම උපදිනවා නම්, ඒ අයට යන්න එන්න බැරුව, යම් ආකාරයක කායික දුර්වලකමකට පත්වෙලා ම උපදිනවා නම් ඒ අය මේ කයෙන් කර්ම රැස්කරන්නෙක් ගනයට ගන්න බැරි වෙයි, ඒ විදියට සැළැකුවොත්.

මනෝකර්මයෙන් හිතන්නේ, කල්පනා කරන්නේ නැතුව ඉන්නවා නම් මනෝකර්මය නතරවෙනවා කියන බවක් හිතනවා නම්, අපි

හිතමුකොා අසනීප තත්ත්වයන්වලට පත්වෙලා යම් ආකාරයකින් මේ මනසේ ඒ විදියට පවතිනවා වෙන්නත් පුළුවන්. එහෙම නැතිනම් අසංඥ මට්ටමට හිත දියුණුකරගත්ත කෙනෙකුටත් හිතන කල්පනා කරන බවකින් මිදිලා කටයුතු කරන්න පුළුවන්කම තියෙයි. ඒ මට්ටමට කටයුතු කරන කෙනෙකුටත් කර්ම රැස්වෙන්නේ නැතිවෙයි කියලා හිතෙන්න පුළුවන්.

එහෙම වුණොත්, කායකර්ම, වචීකර්ම, මනෝකර්ම කියන මේ කර්ම තුන ම නොකර ඉඳීමෙන් සිද්ධ කරගන්න පුළුවන් කියලා අපි කල්පනා කළොත්, එහෙම නම් එතැන දී නිරෝධය පනවන්න පුළුවන්වෙයි කියලා හිතෙයි. නමුත් බුදුදහමේ අපට නිරෝධය පනවන්නේ ඒ කියන කාරණාවකින් නෙවෙයි. **කර්මය ඇතිවෙන්න තියෙන හේතුව නැතිකිරීමෙන් ම යි කර්මය නැතිකරන්න කියලා කිව්වේ. එහෙම නැතුව ක්‍රියාව නතරකිරීමෙන් පමණක් ඒක සිද්ධකරන්න පුළුවන් කියලා දේශනා කළේ නැහැ.**

- කතා නොා කර ඉඳීමෙන් වචීකර්මය සම්පූර්ණයෙන් ම නතරකරන්න පුළුවන්කමක් නැහැ.
- ක්‍රියා නොා කර ඉඳීමෙන් කායකර්මය සම්පූර්ණයෙන් ම නතරකරන්න පුළුවන්කමක් නැහැ.
- හිතන්නේ කල්පනා නොා කර ඉඳීමෙන් පමණක් ම මනෝකර්මය නතරවෙන්නේ නැහැ.

එහෙම නම් කොහොම ද අපි මේක තේරුම්කරගන්නට ඕන? කායකර්ම, වචීකර්ම, මනෝකර්ම කියන මේ කර්ම තුන ම සිද්ධවෙන්නට හේතුවෙන්නේ අවිද්‍යාව යි. අවිද්‍යාව කොතෙකුත් තියාගෙන, කොච්චර අවිද්‍යාව තිබුණත්, හිතන්නේ කල්පනා කරන්නේ නැතුව හිටියා කියන එකෙන් කර්ම රැස්වෙන එක නතරවෙන්නේ නැහැ. අවිද්‍යාව කොතෙකුත් තියාගෙන වචනයක්වත් කතා නොා කර ඉන්නවා කියන තැනකින් වචී කර්මය සම්පූර්ණයෙන් ම නිරෝධයට පත්වෙන්නේ නැහැ. අවිද්‍යාව

කොතෙක් තියාගෙන කයෙන් කෙරෙන කර්මයන් නතරකරගෙන හිටියා කියලා ක්‍රියාවන් නතරකරගෙන හිටියා කියලා කායකර්මය නිරෝධයකට පත්වෙන්නේ නැහැ.

- එහෙම නම් නිරෝධ වෙන්නට නම් හේතු නිරෝධයෙන් ඵල නිරෝධයක් ක්ෂාත් ක්ෂාත් කරන්න ම වෙනවා.
- හේතුව හඳුනාගෙන ඒ හේතුව නිරෝධ කිරීමෙන් පමණක මයි, කර්ම නිරෝධයකට යන්න පුළුවන්කම තියෙන්නේ.

ඒ නිසා මෙතැන දී කායකර්ම, වචීකර්ම, මනෝකර්මයන්ගේ නිරෝධයෙන් පමණක මයි මේ කර්ම නිරෝධය කරන්න පුළුවන්කම ලැබෙන්නේ කියලා දේශනා කළ ධර්මය තුළ අන්තර්ගත වෙනවා කායකර්ම, වචීකර්ම, මනෝකර්ම වෙන්නේ කොහොම ද කියන එක බලන්න වෙනවා.

මේ සූත්‍ර දේශනාවේ දී පැහැදිළි කරන්නේකායකර්ම, වචීකර්ම, මනෝකර්ම වෙන එක යි. පැරණි කර්මයකින් කර්ම විපාකයක් විඳියට මේ ඇහැ හටගන්නවා, කන හටගන්නවා, නහය දිව ශරීරය කියන මේ ආයතනයන් හටගන්නවා. මේ හටගන්න මේ ධර්මතා තුළ ඒවා හටගත්තේ කොහොම ද කියලා හේතුව විඳියට දකින්න වෙන්නේ පෙර කර්මයක් හින්ද යි. පැරණි කර්මයක් හින්ද යි මේවා සිද්ධවෙලා තියෙන්නේ.

එහෙම නම් පැරණි කර්මය මොකක් ද? පෙර කරන ලද කර්මය මොකක් ද? පෙර කරපු කර්මය හැටියටත් ගන්න වෙන්නේ කායකර්ම, වචීකර්ම, මනෝකර්ම ම තමයි. එහෙම නම් පෙර කරලා තියෙන කර්මත් කායකර්ම, වචීකර්ම, මනෝකර්ම ම නම්, ඒ කර්මවලට විපාක විඳියට මේ ජීවිතයේ ලැබිලා තියෙන්නේ ඇහැ-කන-නහය-දිව-ශරීරය-මනස කියන මේ විපාක ටික ම යි. මේ විපාක ටික ලැබුණහම තියෙන දෝෂය තමයි, වර්තමානයෙත් මේ විපාක ටික මුල්කරගෙන, වර්තමානයෙත් කර්ම කරගන්න පුළුවන්

අවස්ථාව හැදිලා තියෙනවා. කම් කරගන්න පුළුවන් අවස්ථාව හැදිලා තියෙන්නේ පෙර කම්යට විපාක ටික හැදුණු නිසා යි.

එහෙම නම් මේ විපාක ටිකෙන් නව කම් කරගන්න පුළුවන් අවස්ථාව හැදිලා තියෙනවා කියලා කියන්නේ **මේ පෙර කම්වලට ලැබිච්චි විපාක ටික නව කම් නෙවෙයි** කියන එක යි. අතීතයේ කරපු කම්වලට ලැබිච්චි විපාක ටික නව කම් නෙවේ ම යි. එහෙම නම් ඇහැට රූපයක් පෙනිලා වේදනාවක් ඇතිවෙනවා කියන එක කම්යක් නෙවෙයි; නව කම්යක් නෙවෙයි. ඒක **පැරණි කම්යක විපාකයක්**. කනට ශබ්දයක් ඇහිලා, ඔය ඇහුණු ශබ්දයට අනුරූපව ස්පර්ශයක් වෙලා, වේදනාවක් ඇතිවෙනවා කියලා කියන්නේ කම්යක් නෙවෙයි; කම් විපාකයක්.

මේ කම් විපාකය නව කම්යක් බවට පත්වෙන්නේ කොහොම ද?

මෙන්න මේ විපාක ධම්යන්වලට තණ්හා උපාදාන කියන කෙලෙස් ටික යෙදුනහම, ඒ කෙරෙහි සතුටුවන බවක්, ඇලෙන බවක්, යෙදුනහම ඒ තුළ උපාදානයක් යෙදුනහම ඒ තුළට බැසගන්නා බවක්, එහෙම නැතිනම් එහෙම වෙලාගන්නා බවක් යෙදුන නිසා තමයි එයට අනුව කරණ කියන දේවල් සහ හිතන දේවල් නව කම් වශයෙන් සළකන්නේ. ඒ හිතන දේවල්, කියන දේවල්, කරන දේවල් සියල්ල කම් වශයෙන් ගැනෙනවා. එහෙමනම් ඒ කම් බවට පත් කළේ කෙලෙස් ටික යි. එතැන දී කෙලෙස් හැටියට සලකන්නේ තණ්හා-උපාදාන ආදී කෙලෙස් ටික යි.

ඇහැට පෙනිච්චි රූපයක රූපයත්, ඇහැත්, ස්පර්ශයත් එහෙම නැතිනම් විඤ්ඤාණයත් ස්පර්ශයත් වේදනාවත් කියන මේ ධම්තා පහ දකින්න පුළුවන් මට්ටමකට නුවණ නො තිබිච්චි නිසා ඇහැට පෙනුණු රූපය අරභයා ඒ රූපයට ම නැඹුරුවෙලා, ඒ රූපයට ම බරවෙලා කැමැත්තක් ඇතිකරගෙන ඒ රූපයට ම බැසගන්නවා. ඒ කැමැත්තෙන් ඒ රූපය තුළට ම, ඒ රූපය පැත්තට ම බැඳීමක් ඇතිකරගත්තහම අපට ඒ රූපය ඇති බවට ඉතුරුවෙනවා. ඇහැ ඇති බවට ඉතුරුවෙනවා. ඇහැට පෙනුණු රූපය ඇති බවට

ඉතුරුවෙනවා. ඒ ඇහැ ඇති බවට, ඇහැට පෙනුණු රූපය ඇති බවට ඉතුරු වුනේ ම, මේ ඇහැ ත් රූපය ත් චක්ඛු විඤ්ඤාණයත් නිසා කියන මේ කාරණා තුනේ ම නිසා ඇතිවන ස්පර්ශය නිසා වේදනාවක් ඇතිවුන බව කියන මේ විපාක ධර්මතා ටික දැක්කේ නැහැ. නුවණින් හඳුනාගන්නට හැකියාවක් ලැබුණේ නැහැ.

ඒ නිසා මේ ධර්මතා ටික දකින්න බැරිවුන නිසා ම යි ඊට නැඹුරුවුණු, ඊට බැසගත්ත මානසික මට්ටමක් ගොඩනැගෙන්නේ. ඒ කෙලෙස්වලින් කරපු දෙයක්. ආශ්‍රවවලින්, අනුශයන්වලින්, සංයෝජනවලින් ආදී මේ විදියට ගත්තහම යම් කෙලෙස් ධර්මයක් තියෙනවා නම්, ඒ කෙලෙස්වලින් කරපු කෘත්‍යය තමයි එහි ඇත්ත පෙනුනේ නැතිකමත්, ඒ තුළට ම නැවත කැමැත්තෙන් බැසගත්ත බවත් ඇතිවෙන්නේ.

අපි හිතමු ඇහැට රූපයක් පෙනුනා. ඇහැට රූපයක් පෙනෙන වෙලාවේ සිද්ධවෙලා තියෙන්නේ පැරණි කර්මයකින් හටගත්ත ඇහැත්-රූපයත්-චක්ඛුවිඤ්ඤාණයත් නිසා ම හටගත්ත ස්පර්ශයෙන් උපන් වේදනාවක් තියෙනවා කියලා මේ ධර්මතා ටික වෙන්කරලා හඳුනාගන්න බැරුව ගියා. හඳුනාගන්න බැරුව ගියා කියලා කියන්නේ එවකට තිබුණු, එහෙම නැතිනම් ක්‍රියාත්මක වෙමින් තිබුනු ඇත්ත, ඇති හැටියට ම හඳුනාගන්න බැරිවුණු එක යි.

යම් සිද්ධියක ඇත්ත ඇති හැටියට හඳුනාගන්න බැරිවෙන කොට තව දෙයක් වෙනවා. ඇත්ත හඳුනාගන්න බැරිවෙන කොට වෙන්නේ බොරුවක් ඇත්ත විදියට පෙනී හිටිනවා. එහෙම නම් අපට පෙනී හිටින බොරුව තමයි, අපි අපේ හිතේ ඒකට අනුරූපව හදාගන්න ප්‍රපංච ටික. ඇත්ත දකින්නේ නැතිවෙන කොට ප්‍රපංච ටිකක් හැදෙනවා. හිතේ හිතේ හදාගන්න සිද්ධි ටිකක්, සංඛාර ටිකක් තියෙනවා.

- දැන් ඇත්තට ම පවතින ඇත්ත දකින්නේ නැතිවෙන කොට ත්, එක දෝෂයක් තමයි, ඇත්ත දකින්නේ නැති දෝෂය.

- ඒ නිසා එයින් විපාක එහෙම නැතිනම්, එයින් ප්‍රතිඵලය විදියට හැදෙන ප්‍රතිඵලය තමයි, බොරුවක් ඇත්ත විදියට පෙනෙනවා.
- බොරුවක් ඇත්ත වෙලා පෙනෙන කොට එතැන තියෙන දෝෂය, ඒක බොරුව බොරුවක් කියලා හඳුනාගන්න බැරිකම එනවා. ඇත්ත පෙනෙන්නේ නැති තැන එක රැවටිල්ලක් තියෙනවා.
- ඇත්ත පෙනෙන්නේ නැති නිසා හදුගන්නා බොරුව, එහෙම නැතිනම් ප්‍රපංච ටික, බොරුවක් ඇත්ත වෙලා පෙන්නනවා.
- එතැන දී ත් බොරුව බොරුවක් හැටියට හඳුනාගන්න නුවණ යෙදෙන්නේ නැති නිසා එතැනත් රැවැටෙනවා.

ඊට පස්සේ මේ හදුගත්ත එක තියෙන්නේ අර ඇත්ත, ඇත්තට ම තියෙන ඇත්ත තියෙන තැන, යථාර්ථය, තියෙන තැනට තමයි මේ බොරුව පතිත කරන්නේ. දැන් පතිත කළාට පස්සේ ඇත්ත පෙනෙන්නේ නැතුව බොරුව ම පෙනෙන බවට පත්වෙනවා. බොරුවක් ම ජීවිතය බවට පත්වෙනවා. බොරුව තුළ ම ජීවත්වෙන මට්ටමකට පත්වෙනවා.

දැන් මෙන්න මෙහෙම වුණහම ඇහැට පෙනුන දේ මොකක් ද කියලා එහි යථාර්ථය පෙනෙන්නේ නැහැ. ඒ යථාර්ථය පෙනෙන්නේ නැතිවෙන කොට ප්‍රපංච ටිකක්, මනඃකල්පිතයක්, එහෙම නැතිනම් ප්‍රපංචයක් හිතින් හදුගන්නවා. එහෙම නැතිනම් පැනැවීමක් හදුගන්නවා. **ප්‍රඥප්ති කියලා අපි මතක් කරන්නේ. මෙන්න මේ පනවාගත්ත දේ ඇත්ත හැටියට සලකනවා.** ඒක පනවාගැනීමක් කියලාවත් තේරෙන්නේ නැති බවට පත්වෙනවා. එහෙම නම් පනවාගත්ත දේ හැබෑවට ම පවතින ඇත්ත උඩින් පතිතකළහම හැමදම අපට ඇත්ත වැහිලා, පනවාගත්ත ප්‍රඥප්තිය, එහෙම නැතිනම් ප්‍රපංචයක් ම යි අපට අද ඇත්ත වෙලා තියෙන්නේ.

මෙන්න මේ මට්ටමට පත්වෙලා, ඒ ප්‍රපංච අරමුණු කරගෙන, එහෙම නැතිනම් ඒ පැනැවීම් අරමුණු කරගෙන තව දුරටත් හිතනවා ද, කල්පනා කරනවා ද, අන්න අවිද්‍යා මූලිකව හිතන, කල්පනාකරන බවක් තියෙනවා. අවිද්‍යාව මූලික කරගෙන හිතන කල්පනා කරනවා නම් ඒ ප්‍රපංච අරමුණු කරගෙන හිතන තාක්, ඒ සියල්ල ම මනෝ කම් වශයෙන් පැවැතෙනවා. එසේ සකස් කර ගත්ත ප්‍රපංච, එහෙම නැතිනම් පැනැවීම් මුල් කරගෙන යම් කෙනෙක් කතා කරනවා නම්, ඒ කතා කරන වචනයක් වචනයක් ගානේ ඒක යහපත් පැත්තට වෙන්න පුළුවන්, අයහපත් පැත්තට වෙන්න පුළුවන්, චේතනාව අනුව කුසල කම් හෝ අකුසල කම් වෙනවා. ඒක වචී කම් බවට පත්වෙනවා.

යම් කෙනෙක් ඒ ප්‍රපංච අරමුණු කරගෙන, ප්‍රපංච අරභයා යම් ක්‍රියාත්මක වීමක් ක්‍රියා කරවනවා නම්, කයින් යම් ක්‍රියාවක් කරනවා නම්, ඒ සියලුම ක්‍රියාවන් චේතනාව අනුව කුසල කම් හෝ අකුසල කම් වෙනවා.

දැන් බලන්න, කායකම්ම-වචීකම්ම-මනෝකම්ම කියන මේ කම් තුන ම සිද්ධ කරන්න පුළුවන්කම ලැබුනේ ඇහැට පෙනුනු රූපයක් අරමුණු කරගෙන කනට ඇහුනු ශබ්දයක් අරමුණු කරගෙන, නහයට-දිවට-ශරීරයට දැනුන අරමුණක් අරමුණු කරගෙන, එහෙම නැතිනම් හිතේ හිතේ සිතුනු සිතිවිල්ලක්, සිදුවීමක්, ප්‍රපංචයක් අරමුණු කරගෙන යි.

මෙන්න මේ කාරණා ටිකෙන් අපට පැහැදිළි වෙනවා, පවතින ඇත්ත දකලා, ඒ ඇත්ත අවබෝධ කරගත්තොත්, එතැන රැවැටෙන්නේ නැහැ. ඇත්ත ඇතිහැටියට ම දක්කහම යථාර්ථය තුළ රැවැටිල්ලක් යටපත් වෙන්නේ නැහැ, යථාර්ථය දකින නිසා. යථාර්ථය තුළ රැවැටෙන්නේ නැති පුද්ගලයා හදගෙන රැවැටෙන්න හේතුවක් නැහැ. හදගත්ත දේට රැවැටෙන්න හේතුවක් නැහැ. මොකද, ඇත්ත ම දකින නිසාඑතැන රැවැටෙන දෙයක්හදගන්නේ නැහැ.

හඳගත්ත දේට රැවැටෙන්නේ නැති නම් මේ හඳගත්තු දෙයයි හැබෑවට ම පවතින ඇත්ත යි කියන මේ දෙක එකට පතිත කරවලා, එකට ගැටගහන්න දෙයක් නැහැ. පතිත කරන්න දෙයක් නැහැ. ඇත්ත ම දකිනවා. ඇත්ත ම දකිනවා නම් ඒ කෙනා, ඒ ඇත්ත ම දැකලා හිතනවා නම් කල්පනා කරනවා නම් අවිද්‍යාව මූලිකව හිතන, කල්පනා කරන දෙයක් බවට පත්වෙන්නේ නැහැ. ඒක විද්‍යාව මූලිකවෙච්ච හිතන කල්පනා කරන දෙයක් බවට ම යි පත්වෙන්නේ.

ඇත්ත ම දැකලා, ඒ ඇත්ත ම කතා කරනවා නම්, ඒ ඇත්ත ම කතා කරන කෙනා වචී කර්මයන් කරන්න යන්නේ නැහැ. මොකද, ඒ කෙනා අවිද්‍යා මූලිකව නෙවෙයි, විද්‍යා මූලිකව ම යි යමක් කතා කරනවා නම් කතා කරන්නේ.

යම් කෙනෙක් ඇත්ත ම දැකලා, ඒ ඇත්ත ම දැකලා, ඒ ඇත්ත ම තුළ ඉඳගෙන යම් කටයුත්තක් කරනවා නම්, යම් ක්‍රියාවක් කරනවා නම්, ඒ කෙනා කායකර්ම කරන්නෙක් ගණයට යන්නේ නැහැ. එතැන දී අවිද්‍යා මූලිකව නෙවෙයි, විද්‍යාවෙන් ම යි. ඒ කියන්නේ යථාර්ථය ම දැකලා, විද්‍යාව ඇතුව ම යි කරන කියන දේවල් කරන්නේ කියන්නේ. හිතන්නේ. කල්පනා කරන්නේ. යමක් හිතනවා නම්, කල්පනා කරනවා නම්, කියනවා නම්, කරනවා නම්, ඒ සෑම කාරණාවක් තුළ ම විද්‍යාව මිශ්‍ර වෙලා තියෙනවා.

එතැන දී විද්‍යාව කියලා සඳහන් කළේ, මෙන්න මේ <u>සම්මා දිට්ඨිය</u> මුල්කරගත්ත කාරණාවක්. ඒ නිසා යි අපට නිරෝධ ප්‍රතිපදාව, කර්ම නිරෝධය කරන ප්‍රතිපදාව හැටියට මේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය පෙන්නලා මේ ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය තුළ සම්මා දිට්ඨි මූලික කරගත්ත සම්මා සංකප්පයක් තියෙන්නේ. යම් සංකල්පනාවක් යම් කල්පනා කිරීමක් තියෙනවා නම් ඒ සියලුම කල්පනා කිරීම් ටික අවිද්‍යාවෙන් යුක්ත වූ කල්පනාවක් නොවන නිසා ම යි ඒ සම්මා දිට්ඨි මුල්කරගත්ත සම්මා සංකප්ප කියලා දේශනා කළේ. අවිද්‍යාවෙන් වෙන්වෙච්ච, අවිද්‍යාවෙන් දුරුවෙච්ච සංකල්පනාවක්

ඇතිකරගන්න නම් සම්මා දිට්ඨිය මූලික කරගත්ත සංකල්පනාවක් ම වෙන්න ඕන.

නිවැරැදිව හිතන කෙනෙක් බවට පත්වෙන්නේ,ප්‍රඥාවෙන් දකින කෙනෙක් බවට පත්වෙන්නේ. ප්‍රඥාවෙන් හිතන කෙනෙක් බවට පත්වෙන්නේඑතකොට යි. එහෙම ප්‍රඥාව මූලික කරගත්ත, ප්‍රඥාවෙන් යුක්තවෙච්ච කෙනෙක් තමයි, යම් වාචාවක්, යම් කතාවක් කරනවා නම්, ඒක සම්මා වාචාවක් බවට ම පත්වෙන්නේ. ඒ සම්මා වාචාව තුළින් කුසලය හෝ අකුසලය හෝ වශයෙන් යම් මට්ටමක කර්මයක් වෙලා නැවත සසර උපදින්න හේතුවෙනවා නම් මෙන්න මේ කර්ම නිරෝධය කරන්න පුළුවන්කම තමයි සම්මාවාචාව තුළින් පැහැදිළි කරගෙන තියෙන්නේ.

ඊළඟට <u>සම්මා කම්මන්ත</u>. යම් ක්‍රියාවක් කරනවා නම්, කයින් යම් ක්‍රියාවක් කරනවා නම් ඒ කරන සියලුම ක්‍රියාවන් සම්මා දිට්ඨි මූලික කරගත්ත ක්‍රියාවක් ම යි. සම්මා දිට්ඨියෙන් ම යුක්ත වූ ක්‍රියාවලියක් ම යි. ඒ නිසා අවිද්‍යාවෙන් තොරව, යහපත් වූ නිවැරැදිව දකින ක්‍රියාවලියකින් ම යි ඒ කෙනා ක්‍රියාත්මක වෙන්නේ.

ඊළඟට <u>සම්මා ආජීවය</u>. මුලු ජීවිත පැවැත්ම ම ආජීවය ම පිරිසිදු යි. සම්මාදිට්ඨිය මුල්කරගත්ත විදියට ම යි ඒ කෙනාගේ දිවි පැවැත්ම හුරු පුරුදු වෙන්නේ. ඒ විදියට යි හුරු කරන්නේ. ඒ අනුව කටයුතු කිරීමෙන් ම තමයි ඒ කෙනා මාර්ගීය වඩන්නේ.

ඊළඟට මේ කෙනාට තිබෙනවා <u>සම්මා සතිය</u>.මේ හිතන කල්පනා කරන බව තවදුරටත් පිරිසිදු කරන්න සම්මාදිට්ඨිය මුල්කරගෙන ඒ අනුව වැයම් කරමින් සිහියෙන් යුක්තව හොඳට සිත එකඟ කරගන්නවා මේ කියන යථාර්ථය දකින්න. සම්මාදිට්ඨිය කියන්නේ මෙන්න මේ ධර්මතා ටික පිරෙන්න පිරෙන්න තමයි සම්මා දිට්ඨිය

පිරෙන්නේ. සම්මා දිට්ඨිය පූරණය කරන්නා වූ ප්‍රතිපදාවක් තමයි මේ මාඟී සත්‍යය හැටියට අපට පෙන්නලා තියෙන්නේ.

මාඟී සත්‍යය වඩන කෙනෙකුට පිරිලා තියෙන්නේ සම්මා දිට්ඨිය යි. සම්මා දිට්ඨිය මුල්කරගෙන මාඟී සත්‍යය පෙන්නනවා. ඒ පෙන්නන මාඟී සත්‍යය අනුගමනය කිරීමෙන් සම්මා දිට්ඨිය ම පිරෙනවා. ඒක අපි පැහැදිළි කරගත්තොත්: බුදුරජාණන් වහන්සේ දේශනා කළ දර්ශනය තමයි අපි අහලා දැනගන්නේ. ඒ අහලා දැනගන්න දර්ශනය තමයි මෙතැන දී අපට පෙන්නුවොත්, වෙන් කරනවා කොටස් වශයෙන්. දැනට තියෙන විපාක ටික මොනවාද කියලා පැරණි කර්ම කියන ධර්මතාවයෙන් විස්තර කරන්නේ වර්තමානයේ පවතින විපාක සිත යි. වර්තමානයේ පවතින විපාක සිතෙන් අලුත් කර්ම ටික සිද්ධකරන්නේ කොහොම ද කියන එක පෙන්නනවා කායකර්ම-වචීකර්ම-මනෝකර්ම කියන මේ කර්මයන්වලට යන්නේ මේ වර්තමානයේ පවතින විපාක ටිකට කෙලෙස් ටික යෙදිලා, නව කර්ම කරන ගණයට යනවා. අලුතෙන් කර්ම රැස් කරන්නේ. පුද්ගලභාවය හදාගෙන අලුත් කර්මයන් රැස්කරනවා.

එහෙම නම් මේ අලුත් කර්මයන් රැස්කරන මට්ටමෙන් මිදෙන්නේ කොහොම ද? කර්මයන්ගේ නිරෝධය කරන්නේ කොහොම ද කියලා පෙන්නනවා: කායකර්ම-වචීකර්ම-මනෝකර්මයන්ගේ යම් නිරෝධයක් විමුක්තිය ස්පර්ශ කරනවා නම්, ඒ කියන්නේ නිවන ස්පර්ශ කරන විමුක්තිය, නිදහස් වීම, විමෝක්ෂය, එහෙම නැතිනම් නිවන ස්පර්ශ කරන විදියට යම් නිරෝධයක් තියෙනවා නම්, යම් මිදීමක් තියෙනවා නම්, අන්න ඒක තමයි මේකේ නිරෝධය කියලා පෙන්නනවා.

එතැන දී නිරෝධය හැටියට අපට ගන්න තියෙන්නේ මෙන්න මේ අලුත් කර්මයන් සිද්ධවුනේ කොහොම ද, විපාක ටිකට කෙලෙස් ටික යෙදිලා, අලුත් කර්මයන් සකස්කරගත්තා නම්, විපාක ටිකට කෙලෙස් ටික යෙදෙන බවින් නිදහස් කරන්න පුළුවන් නම්, අලුත්

කර්මයන් සකස්වෙන්නේ නැහැ. එහෙම නම් කෙලෙස් නිරෝධයක් කෙරුවොත් විපාකවලට යෙදෙන කෙලෙස් ටික ඉවරකරන්න පුළුවන් නම් නැවත නව කර්ම සිද්ධවෙන්නේ නැහැ. අලුත් කර්මයන් සිද්ධවෙන්නේ නැති තැනට පත්කරන්න නම් මොකක් ද කරන්නට ඕනේ, ඒ සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපදාව අනුගමනය කරන්න ඕනේ කියලා ආර්‍ය අෂ්ඨාඞ්ගික මාර්ගය කියන මේ ප්‍රතිපදාව දේශනා කරනවා.

මෙන්න මේ චතුරාර්‍ය සත්‍යය ගැබ්වෙච්ච දහම් අර්ථය දේශනා කිරීමෙන් අපට දර්ශනය දේශනා කළා වෙනවා. දර්ශනය පැහැදිළි කරගත්තහම ප්‍රතිපදාවත් ඒ දර්ශනය තුළ ම, මාර්ග සත්‍යය තුළ පෙන්නනවා. මාර්ග සත්‍යය තුළ ප්‍රතිපදාව පැහැදිළි කිරීමෙන් අපි ඒ ප්‍රතිපදාව අනුගමනය කළහම, අපට ඒ ප්‍රතිපදාවෙන් ඒ පෙන්නාපු දර්ශනය ක්ෂාත් ක්ෂාත් වෙනවා. ඒ දර්ශනය ක්ෂාත් ක්ෂාත් වුණහම අපි ඒ දර්ශනය තුළ ජීවිතය එහෙම නැතිනම් ඒ දර්ශනය තුළින් කටයුතු කරන පුද්ගලයෙක් බවට පත්වෙනවා.

ඉතින් බුදුරජාණන් වහන්සේ මේ සැකෙවින් කළ දේශනාව අපි දීඝීව තව දුරටත් පැහැදිළි කර ගත්තොත් එක එක කාරණයක් කාරණයක් ගානේ මේක විස්තර කරගන්නට තියෙනවා. නමුත් කාල වේලාවේ හැටියට පැහැදිළි කරගත්තොත් පෙන්නන්න තියෙන්නේ මෙතැන පැහැදිළිව ම විපාක ස්කන්ධ ටිකට, එහෙම නැතිනම් කර්ම විපාකයන් ටිකට වර්තමාන කෙලෙස් යෙදුණහම ඊට අනුරූපව තමයි වර්තමානය තුළ නව කර්මයන් රැස්වෙන්නේ. විපාක ස්කන්ධ ටිකේ ඇත්ත දැක්කොත් වර්තමානයේ කෙලෙස් ටික දුරුකළොත්, විපාක ස්කන්ධ ටිකට කෙලෙස් ටික නො යෙදුණොත් වර්තමානයේ නැවත අලුතෙන් කර්ම රැස්කරනවා කියන සිද්ධියකට යන්න හේතුවෙන්නේ නැහැ.

වර්තමානයේ කර්ම රැස්වුණේ නැතිනම් අනාගතයේ විපාක ලැබෙන්නේ නැහැ. වර්තමානයේ විපාක ටිකට කෙලෙස් ටික නැතිවුණහම වර්තමානය තුළ දුක ද දුරුවෙනවා, පුද්ගලභාවයෙන්

හදුගෙන වර්තමානයේ විඳින සියලුම දුක් විපාක ටික දුරු කරන්න පුළුවන්කම ලැබෙනවා. ඒ විතරක් නෙවෙයි, වර්තමානයේ විපාක ස්කන්ධ ටිකට එහෙම නැතිනම් මේ විපාක ටිකට කම් විපාකයන් කෙරෙහි වර්තමාන කෙලෙස් ටික නො යෙදුණොත් ප්‍රත්‍ය ටික නො යෙදුණොත්, වර්තමාන දුක නැතිවෙනවා විතරක් නෙවෙයි අනාගතයේ විපාක ලබන්න පුළුවන්කම ලැබෙන කම් රැස්කරන එකෙනුත් වැළැකෙනවා.

ඒ නිසා මෙයින් කෘත්‍ය දෙකක් සිද්ධවෙනවා. වර්තමානයේ දුක නැතිවෙනවා විතරක් නෙවෙයි, මතු අනාගතයට විපාක ලැබෙන්නට තියෙන හේතුවත් නැතිවෙනවා. ඒ නිසා කෙලෙස් දුරුකිරීමේ වර්තමාන විපාක ස්කන්ධ ටිකට හිත තියලා එහෙම නැතිනම් නුවණින් වර්තමානයේ විපාක ස්කන්ධ දැකලා විපාක ස්කන්ධ පිරිසිඳ දැකීම තුළින් ම මේ කෙලෙස් ටික දුරුකරලා නිවන ක්ෂාත් ක්ෂාත් කරගන්න පුළුවන්කම ලැබෙනවා.

එතැන දී වර්තමාන විපාක ටික දකින්න නම් හොඳ පැහැදිළි සමාධියක් තියෙන්න ඕන. හොඳ පැහැදිළි සමාධියකට යි වර්තමාන විපාක ස්කන්ධ ටික දකින්න පුළුවන්කම තියෙන්නේ. ඒ නිසා නීවරණයන් දුරුකරළා, සමාධිය වඩමින් මේ වර්තමාන විපාක ස්කන්ධ ටික දකින්න උත්සාහවත් වෙන්න ඕන. විපාක ස්කන්ධ පෙන්න පෙන්නා, කේලේසයට විපාක ස්කන්ධවල පතිතවෙන්න තියෙන ඉඩ අහුරලා, කෙලෙස් ටික දුරුකරළා, විපාක ස්කන්ධවල ඇත්ත ඇතිහැටියට ම පෙන්නලා දෙන්නයි අපට ප්‍රතිපදාවෙන් මග පෙන්නලා තියෙන්නේ.

ඒ නිසා අද දේශනාව ඒ විපාක ස්කන්ධයන්ගේ ඇත්ත දැකලා, කෙලෙස් ටික දුරුකරලා, උතුම් වූ චතුරාර්‍ය සත්‍ය ධර්මය අවබෝධ කරගන්නට පුළුවන්කම ලැබෙන දවසක් බවට අද දවස පත්කරගන්නට හැකියාව ලැබේවා කියලා කාටත් ආශීර්වාද කරනවා. තෙරුවන් සරණ යි.

2020.04.13

බක් පෝය දවල් වරුවේ දේශනය.

පූජ්‍ය මාන්කඩවල සමාහිත ස්වාමීන් වහන්සේ.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

ධර්මශ්‍රවනාභිලාශී සැදැහැති වාසනාවන්ත පින්වතුනි. අද බක් පුර පසළොස්වක් පෝය දවස යි. තථාගත අමාමෑණි ලොවුතුරු බුදුපියාණන් වහන්සේගේ දෙවැනි ලංකාගමනය සිද්ධවුන, අතිශයින් වැදගත් පෝය දවසක්. චූලෝදර-මහෝදර නා රජවරුන් දමනය කරලා මේ පුණ්‍යභූමිය සුපරිශුද්ධ පුණ්‍යභූමියක් බවට දෙවැනි වතාවටත් පාරිශුද්ධත්වයෙන් අභිෂේක කළේ ලොවුතුරු බුදුපියාණන් වහන්සේ අද වාගේ පොහොය දවසක යි. ඒ නිසා වර්තමානයේ මුලු ලෝකය ම මහත් වූ ව්‍යසනයකට ගොදුරුවෙලා ඉන්න මේ මොහොතේ අපි හැමෝ ම ගෙවල්වල හිරකාරයන් බවට පත්වෙලා, ගෙවල් දොරවල්වලින් එළියට බැහැගන්න බැරිව ඉන්නකොට ත් අපි උත්සාහවත් වෙන්නේ,*නත්ථි මෙ සරණං අඤ්ඤං බුද්ධො මෙ සරණං වරං* - බුදුරජාණන් වහන්සේගේ බණ පදයකින් හැර අපට වෙන පිහිටක් පිළිසරණක් ඇත්තේ නැහැ. ඒ නිසා සැදැහැති උපාසක උපාසිකාවන් මේ තුණුරුවන් ම මම-මගේ. ඒ නිසා තුණුරුවන් ම ඇසුරු කරගෙන අපි ජීවත්වෙන්න ඕනේ.

එතැනින් පිටස්තර පිහිටක් අපට ඇත්තේ නැහැ කියලා නුවණැති සත්පුරුෂයින් සිරගෙයක හිටියත්, එදා බිම්බිසාර මහ රජ තුමා සිරගෙයක හිටියත්, සිරගෙයි ඉඳලාත් තුනුරුවන් වෙනුවෙන් ම යි

තමන්ගේ ජීවිතය කැප කළේ. සඬමීය වෙනුවෙන් තමන්ගේ ජීවිතය කැප කරලා හිටියේ. ඒක නිසා අපි හැම දෙනා ම අපට තියෙන එක ම පිහිට බුදුරජාණන් වහන්සේ ත්, ධර්මරත්නය ත්, මහාසඞ්ඝරත්නයත්. ඒ බව හොඳට නුවණින් තේරුම් අරගෙන උත්සාහවත් වෙන්න ඕනේ තව දුරටත් දහම කරා ම යොමුවෙන්න.

ඒ නිසා ලෝකය මෙච්චර දවසක් බටහිර ජාතිකයන් උත්සාහවත් වුනේ බාහිර භෞතිකව ජරා-මරණ-ශෝක-පරිදේව-දුක්ඛ-දෝමනස්සයන්-රෝග-ව්‍යාධීන් ඉක්මවන්න යි. නමුත් කොච්චර උත්සාහවත් වුණත්, වර්තමානයේ අද දවස තුළ අපට ප්‍රත්‍යක්ෂ වෙලා තියෙනවා කොච්චර උත්සාහවත් වුණත් බාහිර භෞතික ඒ කිසි ම දෙයක් ඉක්මවන්න බැහැ කියලා නැවත නැවත ත් පුන පුනා ඒ කාරණාව ම ඔප්පු කරළා තියෙනවා.

ජරා-මරණ-ශෝක-පරිදේව-දුක්ඛ-දෝමනස්සයන්ඉක්මවන්න
පුළුවන් ආකාරය ලොවුතුරු බුදු පියාණන් වහන්සේ නිවැරැදිව පෙන්නලා තියෙනවා. ඒ නිසා අද දවසේත් අපි උත්සාහවත් වෙමු. බුදු පියාණන් වහන්සේගේ මුල් ම කාලයේ පන්සල්වලට, විහාරස්ථානවලට, අරණ්‍යවලට ගියේ නැහැ සිල් සමාදන් වෙන්නට. ඒ නිසා ඒ හැම දෙනා ම තම තමන්ගේ ගෙවල් දොරවල්වල යි සිල් සමාදන් වුනේ. **ඒ නිසා අද දවසෙ ත් ඒ බුදු පියාණන් වහන්සේගේ මුල් ම යුගය කියලා හිතලා අපි අපේ ගෙදර දොර ඉඳගෙන ම තමන්ගේ ජීවිතය ධම්මානුධම්ම ප්‍රතිපදාවෙන් දියුණුකරගන්න අපි උත්සාහවත් වෙමු.**

අද දවසේ අපේ ස්වාමීන් වහන්සේ, සමාහිත හාමුදුරුවෝ බණ ටිකක් කතා කරන්න, කියලා දෙන්න කියලා ආරාධනා කළා. ඒ නිසා නැවත නැවතත් මම දේශනා කරපු පුංචි ම දහම් පදයක් අද දවසේ අලුතෙන් එකතුවුන කට්ටියටත් එක්ක පැහැදිළි කරළා දෙන්න උත්සාහවත් වෙන්නම්. මොකද, බුදුරජාණන් වහන්සේ ම

දේශනා කරනවා *පරෙසං බො පනානන්ද ධම්ම දෙසනා නො සුබරං ආනන්ද*- මේ පරහට දහම් දේශනා කරනවා කියන එක පහසු නොවේ. එහෙම ලෙහෙසි පහසු කාරණාවක් නො වේ කියලා. ගස් නැති රටේ තුත්තිරි ගහත් ගස් වාගේ. අපටත් සිද්ධවෙලා තියෙනවා මේ වර්තමානයේ මහා ලොකු ධර්මධර දේශකයන් වහන්සේලා හැටියට ධම් දේශනා කරන්න. නමුත් දහම් ටිකෙන් ටික තේරෙන කොට, තේරෙන කොට තමයි, ධම් දේශනා මොන තරම් දුශ්කර ද කියලා තේරෙන්නේ.

ඒ නිසා අද දවසේ මම පුංචි ම පුංචි මාතෘකාවක් ගන්නම්, වෙනදත් මම මේක දේශනා කරළා තියෙනවා *කථ මෙ එකො ධම්මො බහුකාරො* කියලා කියන්නේ මේ ලෝකයාට බොහෝ උපකාර පිණිස පවතින ධම්තාවය මොකක් ද?*අප්පමාදෙව කුසලෙසු ධම්මෙසු* - කුසල ධම්යන්ගේ අප්‍රමාදී ස්වභාවය යි කියන එක. නමුත් මම දේශනා කරන්න යන්නේ *එක නාම කිං* -[2] එකයි කියලා කියන්නේ මොකක් ද?*සබ්බෙ සත්තා ආහරට්ඨිතිකා* - සියලුම සත්ත්වයින් ආහාරයෙන් යැපෙනවා කියන කාරණාව යි.

සබ්බෙ සත්තා ආහරට්ඨිතිකා - සියලුම සත්ත්වයින් ආහාරයෙන් යැපෙනවා කියන කාරණාව හරහා අද දවසේ ත් අපි නැවත වතාවක් ආහාර පරියාය ටිකක් පැහැදිළි කරගන්න උත්සාහවත් වෙමු. මෙතැන *සබ්බෙ සත්තා ආහරට්ඨිතිකා* - කියලා කියන තැන, සියලු සත්ත්වයින් ම ආහාරයෙන් යැපෙනවා කියන කාරණාවෙ දී. මේක දේශනා කරන්න බුදු පියාණන් වහන්සේ හේතු පාදක කරගත්තේ, අහලා ඇති, පුංචි සෝපාක හාමුදුරුවනු යි. සෝපාක හාමුදුරුවෝ හත් අවුරුද්දෙන් ම පැවිදි භාවයට පත්වෙලා, මහා ව්‍යසනයකට පත්වෙලා, තමන්ගේ සුළුපියා තමන් සොහොනේ බැඳලා දලා ඉන්න වෙලාවේ, බුදු පියාණන් වහන්සේගේ බුද්ධානුභාව බලයෙන්, පශ්චිමභවික සත්ත්වයෙක් නිසා, තමන්ගේ පුණ්‍ය තේජසින් ඒ මළමිණිය ලිහාගෙන ඇවිල්ලා, අමු

[2]3-සාමණෙර පඤ්හො, පිරුවාණා පොත් වහන්සේ

සොහොනේ ඉඳලා බුදුරජාණන් වහන්සේ ගාවට ඇවිල්ලා පැවිදිභාවය ලබලා, උතුම් වූ අරිහත් භාවයට පත්වෙලා, බුදු පියාණන් වහන්සේ උපසම්පදා කරන්න ප්‍රශ්න දහයක් ඇහුවා:

පින්වතුනි, බොහොම විශාරදව තුන් ලෝකයක් දිනාපු ලොවුතුරු බුදු පියාණන් වහන්සේ ඉදිරියේ සිංහ පෝතකයෙක් හරියට උත්තර දෙනවා වගේ නිවැරැදිව එකින් එක, එකින් එක අහපු ඒ සියලුම ප්‍රශ්න තියුණු කඩුවකින් නෙළුම් දඬු කපලා දානවා වාගේ බුදු පියාණන් වහන්සේගේ ඒ හැම ප්‍රශ්නයකට ම නිවැරැදිව උත්තර දුන්නා.

ඒකේ පළමුවෙනි ප්‍රශ්නය තමයි *එක නාම කිං* - එකයි කියලා කියන්නේ කුමක් ද කියන කාරණාව. ඉතින් මම ඒක ගත්තේ, මම දැක්කා මෙතැන තියෙනවා ආහාරය කියන එක සම්බන්ධයෙන්, මේ කබලිංකාර ආහාරය සම්බන්ධයෙන් ප්‍රශ්නයකුත් අහලා තිබ්බා. මං හිතන්නේ අපේ කස්සප හාමුදුරුවෝ ඒකට උත්තර දීලා තිබ්බා. ඒක නිසා ඒක තව දුරටත් පැහැදිලි කරලා දෙන්න උවමනායි කියලා මට හිතුණා.

** මේ ආහාරය කියන කාරණාව මුල් කාරණාව කරගෙන ආහාරය කියලා කියන්නේ මොකක් ද?
** අපි මේ ආහාරය ඉගෙනගන්නේ,අවබෝධ කරගන්න උත්සාහවත් වෙන්නේ ඇයි?
** එහෙම ඒ දැණුමෙන් සිද්ධවෙන්නේකුමක් ද?
** ඒ දැණුම හරහා දුරුවෙන අපේ කෙලෙස්මොනවා ද?
** ඒ කෙලෙස් දුරුවෙන්නේ කොහොම ද?
කියන කාරණා ටික අපි හරියට මේ පරියාය හරහා දැණගන්න උත්සාහවත් වෙන්න ඕන.

ආහාර කියලා කියන්නේමොකක් ද?*ආහරතී ති ඛො භික්ඛවෙ ආහාරො* - ඵලයක් ගෙන එන නිසා ආහාරය කියලා හඳුන්වනවා. එතකොට ඵලයකට හේතුවෙන ධර්මතා ආහාර හැටියට

හඳුන්වනවා. මේ තුළින් හේතු ඵල දහම ම තමයි විද්‍යමාන වෙන්නේ. තව විදියකින් කිව්වොත්, පටිච්චසමුප්පාද ධර්මතාවය ම යි ආහාර චක්‍රය කියලා අපට හඳුන්වන්න පුළුවන්. ඉතින් මෙතැන දී මේ ආහාර පරියායෙන් කෙලෙස් දුරුකරගත්ත අතීත උත්තමයෝ, උත්තමාවියෝ ඉන්නවා. පුංචි හත් හැවිරිදි සෝපාක හාමුදුරුවෝ ත්, ඒ වාගේ ම භද්‍රා කුණ්ඩලකේශී, අහලා ඇති. නැවතත් මතක් කරන්නේ; සැරියුත් හාමුදුරුවොත් එක්ක වාදයට ඇවිල්ලා දඹ අත්ත සැරියුත් හාමුදුරුවෝ එදා පුංචි ළමයින්ට කියලා ගලවලා වීසි කරපු අවස්ථාවේ, සැරියුත් හාමුදුරුවොත් එක්ක වාදයට ඇවිල්ලා සාරිපුත්ත මහ රහතන් වහන්සේ ඒ ප්‍රශ්න දහක් නිරාකරණය කළායින් පස්සේ අහපු එක ම ප්‍රශ්නයට නිරුත්තර වුණා භද්‍රා කුණ්ඩලකේශී.

ඉතින් ඒ උත්තමාවිය එදා සැරියුත් හාමුදුරුවන්ගේ ඒ ප්‍රශ්නයට නිරුත්තර වුණේ,*එක නාම කිං* - එකයි කියලා කියන්නේ කුමක් ද කියන කාරණාව දන්නේ නැතුව යි.*සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා* - සියලු ම සත්ත්වයින් ආහාරයෙන් යැපෙන්නේ කියන කාරණාව දන්නේ නැතුව යි. ඊ ගාවට පණ්ඩිත සාමණේරයෝ සැරියුත් හාමුදුරුවෝත් එක්ක පිටිපස්සෙන් ගමන් කරළා, සැරියුත් හාමුදුරුවන්ගෙන් ප්‍රශ්න අහලා, තමන්ගේ සිත දමණය කරගන්න ඕනයි කියලා, පැවිදි වුණේ ඒ සඳහා යි කියලා, හිතලා, පිණ්ඩපාතයත් එපා කියලා, හත් හැවිරිදි පුංචි සාමණේරයෝ ආපසු තමන්ගේ කුටියට ඇවිල්ලා, පාත්‍රය පැත්තකින් තියලා, හිතෙන් ටිකක් නීවරණ ධර්මයන් දුරුකරගෙන සමථ භාවනාවෙන් සිත වඩලා, බුදු පියාණන් වහන්සේ ත්, සාරිපුත්‍ර මහරහතන් වහන්සේ ත් අතර ඇතිවුණ ආහාර පරියාය මේ ධර්ම දේශනාවට සවන් දීලා, එදා බුදු පියාණන් වහන්සේගේ උපකාරයෙනු ත්, සැරියුත් හාමුදුරුවන්ගේ උපකාරයෙනු ත්, සූයඃ දිව්‍ය රාජයාගේ උපකාරයෙනු ත්, ඒ වාගේ ම ශක්‍ර දේවේන්ද්‍රයාගේ උපකාරයෙනුත්, මේ විදියට මේ ශාසනයේ බලගතු ම බුදු පියාණන් වහන්සේගේ ඉඳලා සැරියුත් මහරහතන් වහන්සේගෙත් උපකාර ලබාගෙන දෙව්

බුදුන්ගෙන් පවා වඳනාමාන ලබමින් උතුම් වූ අරිහත්භාවයට පත්වුනේ මේ ආහාර පරියාය හරහා යි.

> **ඒ නිසා ආහාර පරියාය කියලා කියන්නේ වෙන මොකුත් නෙවෙයි, තවත් විදියකින් ගත්තොත් පටිච්චසමුප්පාද ධර්මතාවය ම යි.**

සංයුත්ත නිකායේ, නිදාන සංයුත්තයේ ම තියෙනවා, නිදාන වග්ගයේ ම අභිසමය වග්ගයේ **ආහාර සූත්‍රය**,[3] **මොලිය ඵග්ගුණ සූත්‍රය** [4] ආදී සූත්‍රවල දී මේ ආහාර පරියාය මනාකොට පටිච්චසමුප්පාදය හැටියට ම දේශනා කරළා තියෙනවා. ඒ නිසා බලමු අපි මේ ආහාරය කියන කාරණාව හරහා අපේ ජීවිතවලට ටිකෙන් ටික බුදු පියාණන් වහන්සේගේ දර්ශනය එකතු කරගෙන ඒ දර්ශනය ඇතුළත් වෙනවා ත් එක්ක ම, කෙලෙස් ටික ටික දුරු කරගෙන ආශ්‍රවක්ෂය කරපු වැඩ පිළිවෙලකට ගමන් කරන්න අවශ්‍යවෙන විදියට මේ දහම් පරියාය කොහොම ද අපේ ජීවිතවලට ඒකරාශි කරගන්නේ කියලා.

ඒ නිසා මම මුලිනුත් සඳහන් කළා *ආහරථී නි බො භික්ඛවෙ ආහාරො* - ඵලයක් ගෙන එන නිසා ආහාරය කියලා හඳුන්වනවා. ඵලයකට හේතුවන ධර්මතාවය ආහාර හැටියට හඳුන්වන කොට මේ ලෝකයේ හේතු-ඵල දහම අනුව තීරණය වෙන, සත්ත්ව-පුද්ගල ස්වභාවයෙන් ප්‍රධාන වශයෙන්, ප්‍රධාන කොටස් තුනකට බෙදෙනවා: කාමභූමිය, රූපභූමිය, අරූපභූමිය. මේ තුන් භූමිය ම අහේතුකව අප්‍රත්‍යකව ඉපදුන ධර්මතාවයක් නෙවෙයි. ඒ කියන්නේ ඉබේ හටගත්ත ධර්මතාවයක් නෙවෙයි. ප්‍රත්‍යයෙන් ඉපදුන ධර්මතා, ප්‍රත්‍යයෙන් හටගත්ත ධර්මතා, සංඛත ධර්මතා යි. ඒ හැම දෙයක් ම හඳුන්වන්න පුළුවන්, ආහාරය නිසා පවතිනවා, ආහාරය නිරුද්ධ වෙන කොට නිරුද්ධ වෙනවා කියලා.

---

[3] බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය (2) 20වැනි පිටුව.
[4] බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය (2) 22වැනි පිටුව.

ඒ නිසා ආහාර වර්ග ගත්තොත් ප්‍රධාන වශයෙන් හතරක් තියෙනවා. මොනවා ද ඒ?**කබලිංකාර ආහාරය, ඵස්ස ආහාරය, මනෝ සංචේතනා ආහාරය, විඤ්ඤාණ ආහාරය.** එතකොට අපි තේරුම් ගන්න ඕනේ, මෙතැන පුංචි කාරණාවක් තියෙනවා ***සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා*** - සියලුම සත්ත්වයින් ආහාරයෙන් පවතින්නේ. ***චත්තාරෝ මෙ භික්ඛවෙ ආහාරා*** - ආහාර වර්ග හතරක් තියෙනවා කියලා බුදු පියාණන් වහන්සේ දේශනා කළාට, මෙතැන කිසි ම වෙලාවක දේශනා කරලා නැහැ සියලුම සත්ත්වයින් සතර ආහාරයෙන් ම ජීවත්වෙනවා කියලා. ***සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා*** - ඒක එක න්‍යායක්. එක මාතෘකාවක්. ඊට පස්සේ ***චත්තාරෝ මෙ භික්ඛවෙ ආහාරා*** - ආහාර වර්ග හතරක් තියෙනවා කියලා පෙන්නලා තියෙනවා.

එතකොට මේක තේරුම් ගන්න කොට අපි නුවණින් තේරුම්ගන්න ඕනේ මේක අර්ථ දක්වන්නේ කොහොමද කියලා. නැතිනම් සමහර වෙලාවට, බොහෝ වෙලාවට මේ කාරණා ටික පටලවාගන්න ආකාරයක් තමයි අපි දැකලා තියෙන්නේ.

ඒ නිසා උදාහරණයක් ගත්තොත්, අපි හම්බකරන ධනය කොටස් හතරකට බෙදාගෙන පරිභෝග කරන්න කියලා බුදු පියාණන් වහන්සේ මනා කොට සංවිධානය වුණ, අරපිරුම් ඇති, අරපිරිමැස්මෙන් යුක්ත, යම් කිසි කෙනෙක්ගේ ජීවිතය හදාගන්නා ආකාරය පෙන්නලා තියෙනවා:

එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය - ද්වීහි කම්මං පයොජයෙ
චතුත්‍ථඤ්ච නිදාපෙය්‍ය - ආපදාසු භවිස්සති

කියලා -

එතකොට මේකෙන් කිසි ම වෙලාවක කියලා නැහැ, මේක නැවත නැවතත් ඔය පින්වතුන් හිතලා බලන්න. **(මේ කොටස මගේ අදහසක්.)** තමන් හරිහම්බ කරන ධනය හතර කොටසකට බෙදාගන්න කියලා කියන තැන සමව කොටස් හතරකට

බෙදාගන්න කියලා නැහැ. තමන් හරිහම්බ කරන ධනය කොටස් හතරකට බෙදාගන්න කියලා තියෙනවා මිසක් ඒක සමව බෙදාගන්න කියලා කිසි ම තැනක කියලා නැහැ.

1. *එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය.* එක කොටසක් වැඩිපුර වෙන්න පුළුවන්. ඒ කොටස වෙනම ම ඉතා ම කලමණාකාරිත්වයෙන් යුක්තව මනා කොට එක කොටසක් වෙන් කරළා තියාගන්නවා තමන්ගේ පරිභෝගය පිණිස.
2. *ද්වීහි කම්මං පයොජයෙ* - ඒ කියන්නේ කොටස් දෙකක් තමන්ගේ ඒ කර්මාන්තය දියුණු කරගැනීම සඳහා කුමණ හෝ ආකාරයෙන්. කොටස් දෙකක්, සියල්ලම භුක්ති විඳලා අයින් කරන්නේ නැතුව, කොටස් දෙකක් වෙන් කරනවා තමන්ගේ ඒ ලැබෙන වැටුප, තියෙන ධනය අනුව තමන්ට පුළුවන් ප්‍රමාණය හොඳට කලමණාකරණය කරලා කොටස් දෙකක් වෙන් කරනවා තමන්ගේ කර්මාන්තය වෙනුවෙන්.
3. *චතුන්නංච නිදහෙය්‍ය ආපදසු භවිස්සති* තව සුළු මුදලක් වෙන්න පුළුවන්, කුමන ආකාරයෙන් හරි කොටසක් තැන්පත් කරගන්නවා තමන්ගේ අනාගත ශුභසිද්ධිය වෙනුවෙන්. ඒක ධනය තැන්පත් කරගන්නවා.

මම ඒ කාරණාව කිව්වේ අපට ගාථාවක වුණත්, පරිච්ඡේදයක වුණත්, දහම් පරිච්ඡේදයක වුණත් ඒ අර්ථය පෙන්නන කොට ඒ අර්ථය දුටු පමණින් ම ගන්න බැහැ. එතකොට ඒක අපි හොඳට නුවණින් විමසලා තේරුම් ගන්න ඕන.

දැන් අපි තව විදියකට ගත්තොත් අපට **චතුකබන්ධකයේ** පෙන්නලා තියෙනවා මකුළු දැල් කඩන කොට කුටියක වුනත්, ඉහළ සිට පහළට කඩන්න කියලා. ඉතින් අපි දුටු පමණින් ම තීන්ත ගානවා වාගේ ඉහළ ඉඳලා පල්ලෙහාට මෙහේම කඩනවා. ඇයි? ඒ සතාට බේරිලා යන්න කියලා. නමුත් ප්‍රාථමික සත්ත්වයෙක් වුණ ඒ සතාට තේරෙන්නේ නැහැ, දැන් මේ පැත්තේ කඩලා තියෙන්නේ. උඩහ පැත්තට යන්න ඕන කියලා ඌට

තේරෙන්නේ නැහැ. නමුත් ඒක පෙළ දහමේ ලියලා තියෙන විදිය නිවැරැදි යි. ඉහළ සිට පල්ලෙහාට කඩන්න ඕනේ. අපට ඉස්සෙල්ලා ම කැණි මඬල යි කඩන්න ඕනේ. ඊට පස්සේ ඊට ටිකක් පහළින් කඩනවා. ඊට පස්සේ අපේ ඉහළ බිත්ති මට්ටම කඩලා මෙහෙම ක්‍රම ක්‍රමයෙන් ක්‍රම ක්‍රමයෙන් පහළට එන්නේ.

ඒ විදියට තමයි නිවැරැදිව ඒකේ අර්ථ ගත යුත්තේ. ඉතින් ඒකෙත් සඳහන් වෙන්නේ ඉහළ සිට පහළට කඩන්න කියලා යි.

අන්න ඒ විදියට මේ ධම්ම කොට්ඨාශයන්ගේ අර්ථ ගන්නකොට කෙන කෙනාගේ පරිකල්පණ ශක්තිය අනුව, කෙන කෙනාට හිතන්න පුළුවන් පරාසය අනුව,'මේ විදියටත් හරි නේ, මේ විදියටත් හරි නේ' කියලා ගන්නවා. නමුත් මේක හොඳට නුවණින් තේරුම්ගන්න ඕන යුගයක්. තේරුම්ගන්න ඕන කාලයක්.

- සූත්‍රයට, විනයට, අභිධම්මයට ගලපලා. සූත්‍රයට කිව්වහම සූත්‍ර පිටකයට නෙවෙයි. චතුරාර්‍ය සද්ධම්මයට යි.
- විනයට කිව්හම විනය පිටකයට, එහෙම නැතිනම් ප්‍රාතිමොක්ෂයට නෙවෙයි. ඒ නිසා රාග විනය, ද්වේශ විනය, මෝහ විනය දුරුවෙන විදියට යි.
- ඊගාවට අභිධම්මයට කියලා ගත්තහම අභිධම් පිටකයට එහෙම නැතිනම් අභිධම් ප්‍රදීපිකාව ආදී මේ අභිධම්මයට නෙවෙයි. ඒ පටිච්චසමුප්පාද ධම්මතාවයට යි.

සතර පද ගාථාවක් වුණත් නිවැරැදිව අපට පුළුවන් සූත්‍රයට-විනයට-අභිධම්මයට බහාලන්න.

ඒ නිසා මම මේ ටික කිව්වේ මේ ආහාර කියන පරියාය සමහර කෙනෙක් හරියට තේරුම්ගන්නේ නැහැ. ඒ නිසා ***සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා*** - ඒක එක ආකාරයක්. සියළුම සත්ත්වයින් ආහාරයෙන් යැපෙනවා. ඒකේ කිසි ම කාරණාවක් නැහැ. ඊට පස්සේ ***චත්තාරෝ මෙ භික්ඛවෙ ආහාරා*** - ආහාර වර්ග හතරක්

තියෙනවා කියලා නැවත වතාවක් පැහැදිළි කරනවා. ඒකෙන් කියන්නේ නැහැ සියලුම සත්ත්වයින් සතර ආහාරයෙන් යැපෙනවා කියලා.

ඉතින් ඒ නිසා මේක පටලවා ගන්නේ නැතුව අපි තේරුම්ගන්න උත්සාහවත් වෙන්න ඕනේ.

ඊගාවට, මේ ආහාරය ඇයි අපි බලන්නේ? බලන කොට කුමක් ද සිද්ධ වෙන්නේ? පින්වතුනි, මේ ආහාරය හොඳට පර්‍යේෂණයට භාජනය කරන කොට, නුවණින් යුක්තව බලන කොට මෙච්චර කාලයක් අපේ සිතේ යම් දුක ඇතිකරන හේතු මූලයක්. ඔන්න ආත්ම දෘෂ්ඨිය යම් ධර්මතාවයක් අරභයා ගොනුවෙලා තිබුණා නම් ඒ ආත්ම දෘෂ්ඨිය ටිකෙන් ටික, ටිකෙන් ටික දුරුවෙලා ගිහින් ඒ ආත්ම දෘෂ්ඨිය හරහා උපදින්න, පවතින්න පුළුවන් තණ්හාව එහෙම නැතිනම් සමුදය සත්‍යය ටිකෙන් ටික ටිකෙන් ටික දුරුවෙලා යනවා. එහෙම දුරුවෙලා ගිහින් යථා ස්වභාවය දකිනවාත් එක්කම කෙලෙස් ටිකත් දුරුවෙලා ගිහින් ටිකෙන් ටික, ටිකෙන් ටික මග වැඩිලා නිරෝධය ක්ෂාත් ක්ෂාත් වෙනවා. ඒ නිසා මේ ආහාර පරියාය හරහා අපේ ජීවිතයේ කෙලෙස් දුරුකරගන්න තවත් එක පැතිකඩකින් ලොවුතුරු බුදු පියාණන් වහන්සේ ධර්ම දේශනා කරපු ආකාරය යි විද්‍යමාන වෙන්නේ.

එතකොට පින්වතුනි, මොකක් ද මේ ආහාර හතර? මම කෙටියෙන්, හැමෝම දැන් මේ පරියාය දන්නවා. මේක නැවත නැවතත් අහලා තියෙනවා. නමුත් සද්ධර්මය නැවත නැවතත් අහන කොට ඒක කවදාවත් වැඩිවෙන්නේ නැහැ. නො ඇසූ දේවල් අහගන්න පුළුවන්. *අස්සුතං සුනාති. සුතං පරියොදෙති.* ඒ කියන්නේ අහන ලද ධර්මය නැවත නැවත පිරිසිදු කරගන්න පුළුවන්. තමන්ගේ හිතේ තියෙන සැක සංකා දුරුවෙනවා. තමන්ගේ සම්මා දිට්ඨිය පිරිසිදුභාවයට පත්වෙනවා. සිතේ

පවිත්‍රභාවය ඇතිවෙනවා. මෙන්න මේ කාරණා ධර්මශ්‍රවණය තුළින් සිද්ධවෙනවා.

කෙලෙස් ලෝකයේ අපට අවුරුදු සිය ගණනක් පුරාවට තියෙන පැරැණි දේවල් අහන්න බලන්න පුළුවන්. නමුත් එක වතාවක් අහපු ධර්මය තුන් හතර වතාවක් අහපු ධර්මය අපට අහන්න බැහැ. 'ඕක අපි කලිනුත් ඇහුවා නේ' කියලා.

නමුත් පින්වතුනි නැවත නැවතත් එදා තමන් අවබෝධ කරගත්ත ධර්මය සාරිපුත්ත මහරහතන් වහන්සේ ත්, ඒ වාගේ ම මොග්ගල්ලාන මහ රහතන් වහන්සේලා ත් නැවත නැවත සාකච්ඡා කළා, සම්මර්ශණය කළා. ඒ තුළින් මහා පුදුමාකාර සතුටක් ජීවිතයට උපදින්නේ. ඒ නිසා අපි උත්සාහවත් වෙමු නැවත නැවතත් මේ දහම් පද ශ්‍රවණය කරගන්න, සාකච්ඡාවට බඳුන් කරගන්න.

මොනවා ද මේ සතර ආහාර කියලා කියන්නේ? කබලිංකාර ආහාරය, ඵස්ස ආහාරය, මනෝ සංචේතනා ආහාරය, විඤ්ඤාණ ආහාරය යි.

මොකක් ද මේ කබලිංකාර ආහාරය කියලා කියන්නේ? ***ඔජට්ඨමකං රූප කලාපං ආහාරනී ති ආහාරෝ*** : ඕජාව අටවෙනි කොට ඇති රූප කලාප උපදවලා දෙන නිසා ඒක හඳුන්වනවා කබලිංකාර ආහාරය හැටියට. එතකොට මේ කබලිංකාර ආහාරය කියන එක ඔය පින්වතුන් ත්‍රිපිටක සොයාගෙන සංයුත්ත නිකායේ තියෙනවා නිදන වග්ගයේ **ආහාර සූත්‍රය**[5],**මොලිය ඵග්ගුණ සූත්‍රය**[6], අරගෙන පෙරළලා බලන්න. මේ ආහාරය කියන එකඒකේ තියෙනවා.

එතකොට පින්වතුනි, මේ කබලිංකාර ආහාර කියන කොට කබලිංකාර ආහාරය කියලා කියන්නේ කැබැලි කොට අපි ගන්නා

[5]බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය (2) 20වැනි පිටුව.
[6]බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය (2) 22වැනි පිටුව.

ආහාරවලට අපි හඳුන්වනවා කබලිංකාර ආහාරය යි කියලා. එතකොට බත්-පාන්-කවුපි-මුංඇට වශයෙන් මේ ගන්නා ආහාරය තමයි මේ කබලිංකාර ආහාර ගනයට අයිති වෙන්නේ. නමුත් මතක තියාගන්න මෙතැන *ඔලාරිකං වා සුඛුමං වා* කියලා ඉවරවෙලා, ඕලාරික වූ ත්, සුඛුම වූ ත් කියලා මේ කබලිංකාර ආහාරය පෙන්නනවා මේ කාම භූමියේ ඉන්නා සියළුම සත්ත්වයෝ දුගතිය ත්, මේ මනුෂ්‍ය ලෝකය වන සුගතිය ත්, ඒ වාගේ ම දිව්‍ය ලෝකවල මේ සියලුම සත්ත්වයෝ කබලිංකාර ආහාරයෙන් තමයි යැපෙන්නේ. එතකොට අපේ ජීවිතයට අප කබලිංකාර ආහාරය එහෙම නැතිනම් ඕජාව අටවෙනි කොට ඇති ඉතා ම සූක්ෂම වූ මේ රූප කලාප ගන්නේ බත්-පාන්-කවුපි-මුංඇටවලිනු යි. එතකොට අපට ප්‍රකට වෙන්නේ, ප්‍රකටවන ධර්මතාවයෙන් හැඳින්වූවාට අපට පෙනෙන, ඇහෙන, දැනෙන මට්ටමේ තියෙන ඒ ආහාර වර්ගවලින් අපි මේක හැඳින්වූවාට ඒකෙන් අපි හොඳට නුවණින් තේරුම්ගන්න ඕන මේ කාරණාව හරහා කබලිංකාර ආහාරය දකින්න මාධ්‍යයක් හැටියට මේක පෙන්නුවාට, කබලිංකාර ආහාරය කියලා කියන්නේ ඉතා ම සියුම් දෙයක්. ඒක නුවණින් අවබෝධ කරගන්න ඕන ධර්මතාවයක්. බත්-පාන්-කවුපි-මුංඇට කියලා කියන්නේඒක පෙන්වන මාධ්‍යය යි.

අපි බොහෝ දෙනෙක් හිතාගෙන ඉන්නවා කබලිංකාර ආහාරය කියලා කියන්නේ මේ බත්-පාන්-කවුපි-මුංඇට කියලා. ඔවු. නමුත් අපි තේරුම් අරගන්න ඕන, ඒ හරහා යි අපට මේ ක්ෂුද්‍රාශ්ඨක බවට පත්වෙලා තියෙන ඕජාව අටවෙනි කොට ඇති, ඕජාව අටවෙනි කොට කියලා කියන්නේ පඨවි-ආපෝ-තේජෝ-වායෝ-වණ්ණ-ගන්ධ-රස-ඕජා. ඕජාව තමයි කෙළවරේ ම තියෙන්නේ. මෙන්න මේ ඕජාව අටවෙනි කොට ඇති මේ සියලුම සතරමහාධාතුවත්, ඒ නිසා උපන් වණ්ණ-ගන්ධ-රස කියන මේ ධර්මතා, ඒ සූක්ෂ්ම ධර්මතා අපට ලැබෙන්නේ මෙන්න මේ බත්-පාන්-කවුපි-මුංඇට හරහා යි.

එතකොට අපට යම් ධර්මතාවයක් අපේ පේන මට්ටමට පැහැදිළි කරන්න නම්, අපි දන්න කියන පරාසයකින් ඒක හඳුන්වන්න ඕන. නො දන්න පරාසයක ඉඳලා අපට ඒක තේරෙන්නේ නැහැ. ඒ නිසා, "අන්න හඳ" කියලා ඇඟිල්ල දික්කරලා පෙන්නන කොට ඇඟිල්ල දිහා බලන්නේ නැතුව හඳ දිහා බලන්න උත්සාහවත් වෙන්න ඕනේ. ඇඟිල්ල උපකාර කරගෙන යි හඳ පෙන්නන්නේ. ඒ වාගේ බත්-පාන්-කවුපි-මුංඇට පෙන්නාගෙන බත්-පාන්-කවුපි-මුංඇට හරහා අපි උත්සාහවත් වෙනවා මේ කබලිංකාර ආහාරය පැහැදිළි කරන්න. එතකොට ඒකෙන් අපි නුවණින් යුක්තව තේරුම්ගන්න ඕන මේ කබලිංකාර ආහාරය කියලා කියන්නේ මොකක් ද කියන කාරණාව.

කබලිංකාර ආහාරය හඳුන්වනවා පුත්‍ර මාංශ සංඥාවෙන්: ආදරණීය අම්මා තාත්තා දෙන්නෙක් තමන්ගේ එක ම දරුවාත් එක්ක නිරුදක කාන්තාරයක ගමන් කරන කොට තමන්ගේ මග වියදම් නැතිවෙනවා. ඒ මග වියදම් නැතිවෙන කොට, ජීවිතය ගැටගහගන්න කිසි ම දෙයක් නැතිවෙන කොට - අහලා ඇති මේ කතාව - තමන්ගේ එක ම දරුවා ආහාරයට අරගෙන, ඒ දෙන්නා මේ ජලය නැති, නිරුදක මහා කාන්තාරයෙන් එතෙර වෙනවා. හැබැයි දරුවා ආහාරයට ගන්නේ කිසි ම ප්‍රිය භාවයකින් නෙවෙයි. ඒ නිසා නොයෙකුත් ආකාරයෙන් පිළිකුල් වූ, දුක් සහිත වූ, කටුක වූ මේ ආහාරය ගන්නේ කාන්තාරය ඉක්මවීම සඳහා පමණක යි.

ඒ වාගේ ම යි අපි මේ ආහාරය ගන්න කොට ආහාරය කෙරේ රස තෘෂ්ණාව නැතුව, තමන්ගේ ක්‍රීඩා පිණිස නෙවෙයි, තමන්ගේ මණ්ඩනය පිණිස නෙවෙයි, තමන්ගේ සැරසීම පිණිස නෙවෙයි. ඒ නිසා මේ ආහාරය විශේෂයෙන් මේ යෝගාවචරයෝ, එහෙම නැතිනම් මේ මාර්ගය වඩන්න උත්සාහවත් වෙන, කෙලෙස් දුරුකරන්න උත්සාහවත් වෙන, මේ ඇත්තෝ මේ ආහාරය

පරිභෝග කරන්න ඕනේ සසර කතරෙන් එතෙරවීම සඳහා ම යි කියන මේ අදහසින් යුක්තව ආහාරය පරිභෝග කරන්න ඕනේ.

පින්වතුනි, මේ පුත්‍ර මාංශ සංඥුවෙන්, ළදරු මසක් නිසා ම තමන්ට පිළිකුල්. මිණී මසක් නිසා ම තමන්ට පිළිකුල්. ඒ වාගේ ම තමන්ගේ ම දරුවා නිසා ම පිළිකුල්. ඒ වාගේ ම දුරු මිරිස් තුනපහ නැති නිසා ම, උයලා නැති නිසා ම, පිසගත්තේ නැති නිසා ම, මේ ආහාරය තමන්ට කටුක යි. කෙසේ නමුත් මේ ආහාරය ගන්නේ එච්චර අප්‍රසන්න වුණත්, එච්චර දුකසේ වුණත්, කරන්න දෙයක් නැතිකම නිසා මේ සසර ඉක්මවීම සඳහා යි. ඒ නිසා සසර පරතෙරක් දකින්න උත්සාහවත් වෙන ඇත්තන් හොඳට නුවණින්, ප්‍රත්‍යවෙක්ෂාවෙන් යුක්ත ව ආහාර පරිභෝග කරන්න.

භාගිනෙය්‍ය සංසරක්ඛිත පොඩි හාමුදුරුවෝ එදා දවසක් ගුරු හාමුදුරුවන් ගාවට ඇවිල්ලා උදේ හීල වළඳනවා, බොහෝම අපහසුවෙන්. ඒ වාගේ ම වික්ෂිප්ත සිතෙන් යුක්තව. නිවිලා තියෙන මේ ආහාරය වළඳන කොට, ලොකු හාමුදුරුවෝ, ගුරු හාමුදුරුවෝ කතා කරළා කියනවා, 'පොඩි නම, තමන්ගේ කට පිච්චෙයි' කියලා. පුංචි හාමුදුරුවෝ මොහොතක් නිහඬව කල්පනා කරළා බලනවා, 'මොකක් ද මේ ලොකු හාමුදුරුවෝ කිව්වේ?' ලොකු හාමුදුරුවෝ හොඳට ම දන්නවා ආහාරය නිමිලා තියෙන්නේ කියලා. මේ දැනය නිමිලා තියෙන්නේ. හීල් වෙච්චි එකක් කියලා දන්නවා. නමුත් ඇයි කට පිච්චෙයි කියලා කියන්නේ?

නුවණ තිබුණා ඒකාන්තයෙන්, මීට මොහොතකට පෙර ඉඳලා මේ ආහාර ටික ගන්න කොට කිසි ම වෙලාවක සිහියෙන් නෙවෙයි, ප්‍රත්‍යවෙක්ෂා කරළා නෙවෙයි, නුවණින් නෙවෙයි මේ ආහාරය පරිභෝග කරන්න, වළඳන්න පටන් ගත්තේ. ගුරු හාමුදුරුවෝ ඒක දැක්කා. ඒක නිසා මේ ආහාර ටික හොඳ සිහියෙන් යුක්තව

පරිභෝග කරන්න ඕන කියලා, එතැන ඉඳලා නැවත සිහිය උපදවාගෙන ඒ ආසනයේ ම ඉඳලා කෙලෙස් දුරුකරගත්ත බව අපේ බණ පොතේ සඳහන් වෙනවා.

පින්වතුනි, ඒ නිසා අපට විශාල වශයෙන් ධර්මය අවශ්‍ය වෙන්නේ නැහැ. අහලා තියෙන ධර්මය නැවත නැවතත් සම්මර්ශණය කර ගත්තොත්, ජීවිතයට එකතුකර ගත්තොත් කෙලෙස් දුරුකරගන්නඅපට පුළුවන්.

එතකොට මේ කබලිංකාර ආහාරය කියන කාරණාව මම ටිකක් වැඩිපුර පැහැදිළි කරන්නම්. මෙකෙන් සිද්ධවෙන්නේ කුමක් ද? ***චත්තාරෝ මේ භික්ඛවෙ ආහාරා භූතානංවා සත්තානං ඨිතියා සම්භවෙසීනංවා අනුග්ගහාය*** - සත්ත්වයන්ගේ උපැත්මට ත්, ඒ වාගේ ම උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසත්, ඒ කියන්නේ, ඉපදුන යම් සත්ත්වයෙක් ඉන්නවා නම් එයාගේ පැවැත්ම පිණිසත්, උපදින්නා වූ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසත්, මේ ආහාරය, කබලිංකාර ආහාරය එක්ක මේ සතර ආහාරය ම උපකාරක ධර්මතාවයක් බව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එතකොට මම උත්සාහවත් වෙන්නේ මේ මොහොතේ පුංචි කාරණා දෙකක් පැහැදිළිකරලා දෙන්න යි. මෙතැන මේක කෙටියෙන් හඳුන්වනවා **ජනක ප්‍රත්‍යය** සහ **උපස්ථම්භක ප්‍රත්‍යය** කියලා. ඒ කියන්නේ උපදින්න ත්, පවතින්න ත්. ආහාරයෙන් සිද්ධවෙන්නේ සත්ත්වයන්ගේ ඉපැත්ම පිණිසත්, ඉපදීම ත්. ඒ වාගේ ම යම් සත්ත්වයෙක් ඉපදුනායින් පස්සේ පවතින්න ත් මේ සතර ආහාරය උපකාර වෙනවා, අවශ්‍ය වෙනවා. ජනක ප්‍රත්‍යය සහ උපස්ථම්භක ප්‍රත්‍යය. එතකොට අපි මේක අපට හඳුන්වන්න පුළුවන්, ඔවු,සත්ත්වයෙක් උපදිනවා කියලා කියන්නේ අපට ගන්න පුළුවන් මවු කුසටත්. මවු කුසත් ඉපදීම යි. අපට ගන්න පුළුවන්. එතකොට ඒ ඉපදිච්ච පුද්ගලයා, සත්ත්වයා ජීවිතාන්තය දක්වා ම, මැරෙණ මොහොත දක්වා ම, ජීවත් වෙනවා නම් අවුරුදු හැට

හැත්තෑවක්, අසූවක්, සීයක්, අපට මේ කාලයත් හඳුන්වන්නපුළුවන්ඒ උපන්නසත්ත්වයාගේපැවැත්මපිණිසත්කියලා.

ඒ වාගේ ම අපි මේක තව ටිකක් සියුම්ව ගවේශණය කරපුවහම ඒ සත්ත්ව-පුද්ගල ශාස්වත දෘෂ්ටිය ඉක්මවලා එකෂණිකව මේ ධර්මතාවය ක්‍රියාත්මක වෙන ආකාරය ජනක ප්‍රත්‍යය සහ උපස්ථම්භක ප්‍රත්‍යය, මේ පඤ්චඋපාදානස්කන්ධය තුළ මේ ආහාරයේ ක්‍රියාකාරිත්වය අපට දැකගන්න පුළුවන්. කොහොම ද, ජනක ප්‍රත්‍යය කියලා කියන්නේ අපට සත්ත්ව-පුද්ගල ස්වභාවය උපදින්නත්, මුල් වෙන්නේ මේ කබලිංකාර ආහාරයත් එක්ක මේ සතර ආහාරය ම යි. කබලිංකාර ආහාරය විශේෂයෙන් ම කාම ලෝකයේ ඒ වාගේ ම **ඵස්සාහාරය, මනෝසඤ්චේතනා ආහාරය, විඤ්ඤාණාහාරය,** මේ තුන් ආහාරය ම රූප ලෝකයේ ත්, අරූප ලෝකයේ ත් ඉපදීමට ත්, පැවැත්මට ත්, මේ ආහාර වර්ග ක්‍රියාත්මක වන ආකාරය අපට තේරුම්ගන්න පුළුවන් වෙන්න ඕනේ.

මෙතැන දී මම පැහැදිළි කරළා දෙන්න උත්සාහවත් වෙන්නේ ජනක ප්‍රත්‍යයෙන්, ඒ කියන්නේ අපට ඉස්සෙල්ලා ම මේ සත්ත්ව-පුද්ගලභාවය උපදින්න, - ජනක කියලා කියන්නේ ඉපදීම යි. අපි විදුලි ජනක යන්ත්‍රය කියලා කියන්නේ. ඒ කියන්නේ විදුලිය උපදවලා දෙන යන්ත්‍රය.යමක ඉපැද්දීමට අපි ජනක කියලා කියනවා. - එතකොට මේ ජනක ප්‍රත්‍යය කියලා කියන්නේ ඉපදීම පිණිස ත් සත්ත්වයන්ගේ උත්පත්තිය පිණිස ත් මේ සතර ආහාරය ම තමයි ක්‍රියාත්මක වෙලා තියෙන්නේ. එතකොට උත්පත්තිය පිණිස මේ සතර ආහාරය ක්‍රියාත්මක වෙලා තියෙන්නේ කොහොම ද කියන කාරණාව අපි ටිකක් බලමු.

ඵස්සාහාරය, මනෝසඤ්චේතනාහාරය, විඤ්ඤාණාහාරය කියන මේ ආහාර තුන අපි අහලා තියෙනවා.

ඵස්සාහාරය කියන්නේ හරියට උදාහරණය හැටියට ගත්තොත් හම ගහපු එළදෙණක් හැටියට, ඒ වාගේ ම ගිනි අඟුරු වලක් හැටියට,

දවස පුරා ම ගුටිකන හොරෙක් හැටියට, මේ තුන් ආහාරය දකින්න කියලා කියන තැනක, ඒ විස්තර ටිකත් කරන්නේ නැතුව මම මේ කෙටියෙන් ජනක ප්‍රත්‍යය සහ උපස්ථම්භක ප්‍රත්‍යය කියන කාරණා දෙක මම පැහැදිළි කරන්නම්.

අපට මේ ජනක ප්‍රත්‍යයෙන්, එහෙම නැතිනම් සත්ත්ව-පුද්ගලභාවය උපදින්න, පඤ්චඋපාදානස්කන්ධය උපදින්න ත්, ඉපදුණු පඤ්චඋපාදානස්කන්ධය පවතින්න ත්, කොහොම ද මේ ආහාරය හේතු පාදක වුණේ කියලා.

අපි දන්නවා පුරාණ කර්මය නිසා, පුරාණ කර්මය කියලා ගත්තහම අපි ඒ අතීත අවිද්‍යා-සංඛාර ධර්මතා නිසා අපි කර්ම රැස්කරගන්නවා. ඒ කර්ම පුණ්‍යාභිසංඛාර වෙන්න පුළුවන්, අපුණ්‍යාභිසංඛාර වෙන්න පුළුවන්, ආනෙඤ්ජාභිසංඛාර වෙන්න පුළුවන්. කෙසේ නමුත් ඒ කර්මය තුළ විශේෂයෙන් හිතේ කබලිංකාර ආහාරය පිළිබඳව කාම තණ්හාව තියෙනවා. එහෙම නැතිනම් රූපාවචර, අරූපාවචර ඒ තණ්හාවේ අඩු මට්ටම් අනුව අපට ඒ ධර්මතාවයන් කෙරෙහි කැමැත්තක්-ආශාවක්-ඡන්දයක් තියනවා.

ඒ සිත තුළ, ඒ කර්ම සිත තුළ ඒ තම තමන්ගේ අවිද්‍යාවේ අඩුවැඩිකම්වලට තණ්හාවේ අඩුවැඩිකම් මත අපට තණ්හාවේ අඩුවැඩිබවක් තියෙනවා. එතකොට ඒ අවිද්‍යා-සංඛාර ධර්මතා නිසා, කර්මය නිසා මොකද වෙන්නේ? අපට එකපාරට ම විශේෂයෙන් මේ කාමභූමියේ නම්, මට මනෝමයෙන් ම යමක් උපදවාගන්න බැහැ. ඒ නිසා මට සිද්ධවෙනවා තමන්ගේ සිතේ තියෙන ඒ කර්මය නමැති ධර්මතාවය මුල් කාරණාව කරගෙන ආයතන හදාගෙන ඒ ආයතන හරහා සතරමහාධාතුව උදව් කරගෙන උපකාර කරගෙන රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, පොට්ඨබ්බ තණ්හා, භුක්ති විඳින්න.

එතකොට මේ අවිද්‍යා-සංඛාර ධර්මතා දෙක නිසා අපි ආයතන හදාගත්තහම මේ ආයතනවලට, ආධ්‍යාත්මික ආයතනවලට, බාහිර ආයතන ගැටෙනවා. ගැටුනායින් පස්සේ, ඇහැ-රූප දෙක ගැටුනායින් පස්සේ අපට විපාක ධර්මතාවයක් උපදිනවා. අපි අහලා තියෙනවා, අපි දැකලා තියෙනවා පොත්වලත්, මේ විපාක, විඤ්ඤාණ-නාමරූප-සළායතන-ඵස්ස-වේදනා කියලා විපාක ධර්මතාවයක් තියෙනවා. අපි උඩ ටික ගත්තොත් කර්ම. මේ ටික ගත්තොත් විපාක ධර්මතාවය යි.

කිසි වෙලාවක, මේ විපාක ධර්මතාවය තුළ කෙලෙස් ඇත්තේ නැහැ. ඒ වාගේ ම යි ඒ තුළ කිසි ම වෙලාවක යමක් අහන්න-දකින්න-දැනෙන්න-දැනගන්න පුළුවන් මට්ටම් ඇත්තේ ත් නැහැ. මෙතෙන්ට සත්ත්වයෙක්-පුද්ගලයෙක් ආවාත් නෙවෙයි. කිසිම වෙලාවක එතැන සත්ත්ව-පුද්ගලභාවයක් විද්‍යමාන වෙන්නෙත් නැහැ. ඒක විපාක ධර්මතාවයක් විතර ම යි. හැබැයි අපට මේ විපාක ධර්මතාවය අහේතුකව අප්‍රත්‍යකව ඉපදෙන දෙයක් නෙවෙයි. අතීත අවිද්‍යා-සංඛාර, ධර්මතා නිසා තමයි අපට විපාක ධර්මතාවය ඉපදුනේ.

එතකොට එතැනින් අපට හොඳට පෙන්නනවා අටුවාවේ එහෙම පෙන්නනවා, මේ විඤ්ඤාණයාගේ පැමිණීම කොහොම ද සිද්ධවුණේ කියලා ඉවරවෙලා,*විඤ්ඤාණස්ස පච්චයාභාර අසංඛන්නි පටිසන්ධිපාතුභාවට්ඨෝ ගම්භීරෝ* : එතකොට මේ විඤ්ඤාණයාගේ හටගැනීම තුළ, පෙර ජීවිතයේ ඉඳලා ආපු, එහෙම නැතිනම් ඊට මොහොතකට කලින් ඉඳලා ආපු කිසිම සත්ත්වයෙක්-පුද්ගලයෙක් මෙතැන විද්‍යමාන වෙන්නේ නැහැ. *විඤ්ඤාණස්ස පච්චයාභාර* සත්ත්ව-පුද්ගලභාවයෙන් ශූන්‍ය යි. *අච්චයාභාර* කිසිදු ව්‍යාපාරයක් මෙතැන්ට, එතැනින් මෙතැන්ට ආපු ව්‍යාපාරයකුත් නැහැ. *අසංඛන්නි* -සංක්‍රාන්තියකුත් නො වෙයි. නමුත් *පටිසන්ධිපාතුභාවට්ඨෝ ගම්භීරෝ* ප්‍රතිසන්ධියකුත් සිද්ධවෙලා තියෙනවා.

මේක බොහොම ගම්භීර යි. මෙතැන්ට ආපු සත්ත්ව-පුද්ගල ස්වභාවයක් නැහැ. හුදු මනසක්, හුදු ධර්මතාවයක්, පිරිසිදු ධර්මතාවයක් මෙතැන තියෙන්නේ. අපට ඒක වර්තමාන, අපි කියමු, විපාක මට්ටම් ගත්තහම ඇහැට නම් රූපයක් විද්‍යමාන, ඇහැ වැයවෙලා රූපයක් ඉපදෙන අවස්ථාව, කන වැයවෙලා ශබ්දයක් උපදින අවස්ථාව. නාසය වැයවෙලා ගන්ධයක් ඉපදිලා තියෙන අවස්ථාව. කිසි ම දෙයක් අපි මේ වෙනකොට දන්නේ නැහැ. නමුත් අපි මෙතැනට ඇවිල්ලා තියෙන්නේ රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, මේ ලෝකයේ භුක්ති විඳින තණ්හාවෙන්.

ඒ නිසා මේ ධර්මතාවය ඉපදුනායින් පස්සේ, විපාක ධර්මතාවය ඉපදුනායින් පස්සේ, ඊට පස්සේ නැවත වතාවක් තණ්හා-උපාදාන-භව, කෙලෙස් කියන ගතිය තමන්ගේ සිත පැත්තේ උපදින්න පටන්ගන්නවා. කෙලේසය,තණ්හා-උපාදාන-භව කියන මෙන්න මේ කාරණාව උපදින්නේ,කිසි ම වෙලාවක බාහිර, භෞතිකව නෙවෙයි, තමන්ගේ ආධ්‍යාත්මික මනස පැත්තේ යි. එතකොට ටිකෙන් ටික, ටිකෙන් ටික සිත පැත්තේ උපදින කෙලේසය. අපි මේ කෙලේසය ඇතිකරගත්තේ යම් ධර්මතාවයකට ද, ඒ විපාක වූ ධර්මතාවයට ම, විපාක වූ ධර්මතාවය මුල්කරගෙන කෙලේසය ඉපදුනා. ඉපදුන කෙලේසය නැවත වතාවක් ඒ විපාක ධර්මතාවයට ම නැඹුරුවෙලා, ඒ මත ම පතිතවෙළා, ඒ මත ම වැඩෙනවා, වර්ධනයවෙන්න පටන්ගන්නවා.

එතකොට කම්-විපාක-කෙලෙස්. එතැන දී අපට මේ ධර්මතාවය, එහෙම නැතිනම් මේ පඤ්චඋපාදානස්කන්ධ ලෝකය වර්තමානය තුළ උපදවාගන්න ත් -හොඳට තේරුම්ගන්න මෙතැන- මේ කබලිංකාර ආහාරය ඇතුලු මේ තුන් ආහාරය වැය වෙලා තමයි අපට මේ වර්තමාන මොහොතේ පඤ්චඋපාදානස්කන්ධ ලෝකය ඉපදිලා තියෙන්නේ. ජනක ප්‍රත්‍යය. ඉපදීම පිණිසත්, ඉපදීම කියලා ගත්තහම මවුකුසේ පහලවීම ම ගන්න එපා. එතැනත් සිද්ධවුණේ

මේ කාරණාවම යි. එතකොට අපට වර්තමානයේ රූපයක් පෙනෙනවා කියන අවස්ථාවේ, මට බාහිරෙන් රූපයක් පෙනෙනවා කියන කොට, ඒ රූපය පෙනෙන්න ත්, මට ඇහැ ත් රූපය ත් දෙක ගැටෙන්න ඕන. එතකොට ඔන්න කබලිංකාර ආහාරය මුල් කාරණාව වෙලා ඵස්ස ආහාර, මනෝසංචේතා ආහාර, විඤ්ඤාණ ආහාර කියන මේ තුන් ආහාරය ම ක්‍රියාත්මක වෙලා, සතර ආහාරයත් එක්ක එකට කැටිවෙලා, පිඩුවෙලා තමයි මට දැන් මේ යමක් පෙනෙනවා කියන මට්ටම ඉපදිලා තියෙන්නේ.

ඒ නිසා ඒක උපදවලා දෙන්නත් ආහාරය ක්‍රියාත්මක වෙලා තියෙනවා ජනක ප්‍රත්‍යයෙන්. ඊට පස්සේ ඒ උපදවාගත්ත, ඒ කියන්නේ පඨිඝ සම්ඵස්සය සහ අධිවචන සම්ඵස්සය. පඨිඝ සම්ඵස්සය උපදවාගන්නත් අපට හැම වෙලේ ම ආධ්‍යාත්මික බාහිර, ආධ්‍යාත්මික-බාහිර කියලා දැන් බෙදුවාට මේ එක ම ධර්මතාවයක්. කෙලේසයකින් තමයි හැම වෙලාවේ ම ආධ්‍යාත්මික-බාහිර කියලා බෙදන්නේ. එතෙකුදු වුවත් මේ මට්ටමේ දී අපට කතා කරන්න ආධ්‍යාත්මික-බාහිර තියෙනවා. මොකද, අපේ මට්ටම, සංයෝජන මට්ටම මේ මට්ටමේ තියෙන්නේ. ඒ නිසා මේ මට්ටමේ දී අපට ආධ්‍යාත්මික බාහිර කියලා කතා කරන්න පුළුවන් මට්ටමක් තියෙනවා.

එතකොට මේ මට්ටමේ දී අපට මේ වක්බු විඤ්ඤාණ විපාක අවස්ථාවල දී කබලිංකාර ආහාරය, විශේෂයෙන් ම මම මේ කතා කරන්නේ කාම ලෝකයේ අපි ඉන්නා තැන යි. කබලිංකාර ආහාරය ත් එක්ක සතර ආහාරය ම ක්‍රියාත්මක වෙලා ඔන්න අපට යමක් උපදවලා තියෙනවා. ඒ උපදවාපු ධර්මතාවය නැවත නැවත ත් ඇසුරුකරන්න නම්, නැවත නැවත ත් ඒ කෙරෙහි තණ්හාවෙන් පඤ්චඋපාදානස්කන්ධයක් උපදවාගෙන, ඒක නැවත නැවත ත් ඇසුරු කරන්න ආයෙත් මේ සතර ආහාරයෙන් ම යි අපි ක්‍රියාත්මක කරන්නේ. නමුත් එතැන දී අපි සතර ආහාරය ක්‍රියාත්මක වෙනවා කියලා ආහාරය හැටියට දකින්නේ නැහැ. අපි

දකින්නේ අවිද්‍යාවෙන්, සංඛාරය පැත්තෙන්, අපි දකින්නේ තණ්හාව සුවිශේෂී කෘත්‍යයක්, උපාදානය සුවිශේෂී කෘත්‍යයක්, සිද්ධකරළා තියෙනවා. කුමක් ද? ඉෂ්ඨ-කාන්ත-ප්‍රිය-මනාප රූප ලෝකයන්, ශබ්ද ලෝකයන්, ගන්ධ ලෝකයන්, රස ලෝකයන් නොයෙකුත් විදියට වෙවණී වූ, විචිත්‍ර වූ, ප්‍රණීත වූ, එහෙම නැතිනම් කටුක වූ, අප්‍රසන්න වූ, දැන් අපට හැසිරෙන්න පුළුවන්, කුසල් අකුසල් කරන්න පුළුවන්, ලෝකයක් උපදවලා තියෙනවා. එතකොට ජනක ප්‍රත්‍යයෙන් මේ ආහාරය ම ක්‍රියාත්මක වෙලා, උපස්ථම්භක ප්‍රත්‍යයෙන් ඒක නැවත නැවතත් පවතින්න නම් මම උපදවාගත්ත, උදාහරණයක් හැටියට ගත්තොත් "අම්මා" කියන මේ ධර්මතාවය, මේ නිමිත්ත, නැවත නැවතත් මට පවත්වන්න මේ සතර ආහාරය ම යි අවශ්‍ය වෙන්නේ. බාහිරෙන් එහෙම සතරමහාධාතුව අවකාශය තුළ එක ආකාරයක ගොනුවෙලා තිබ්බහම, "ආ, මේ අම්මා ඉන්නවානේ" කියලා ඒ ඇති බවින් මට බාහිර අම්මා කෙනෙක් ඇසුරු කරන්න පුළුවන්. ඒ වාගේ ම සතර ආහාරය එහෙම නැතිනම් බාහිර සතරමහාධාතුව නැතිවෙන කොට නැතිබවිනුත්, "මගේ අම්මා මැරුණා නේ" කියලා නැතිබවිනුත් අත්ථි ප්‍රත්‍යය හා නත්ථි ප්‍රත්‍යය ඇතිබවිනුත්, නැතිබවිනුත් මට මේ පඤ්චුපාදානස්කන්ධ ලෝකය උපදවාගන්න පුළුවන් වෙන්නේ මේ සතර ආහාරය නිසා යි.

ඒ නිසා මම මෙතැන මෙයින් පැහැදිළි කරන්නේ වර්තමානයක මේ ආහාරය ක්‍රියාත්මක වෙන හැටි දකින්න. මේක අපි සන්තති ලෝකයකට ඉපදුන තැන ඉඳලා මැරෙණ තැන දක්වා දිවෙන මේ රූපයකට, එහෙම නැතිනම් වේදනාවකට, සංඥාව, සංඛාරයකට, විඤ්ඤාණයකට කියන්නේ නැතුව,වර්තමානයක පඤ්චුපාදානස්කන්ධ ලෝකයක් උපදවන්නේ කොහෙම ද කියලා නුවණින් හොඳට දැනගන්න.

නැවත ත් මම මතක් කරන්නේ අපට මේ පඤ්චුපාදානස්කන්ධය උපදවාගන්නත්, ඒ වාගේ ම උපදවාගත්ත ඒ පඤ්චුපාදානස්කන්ධ

ලෝකය නැවත නැවතත් කයින්-වචනයෙන්-මනසින් කායකම්-වචීකම්-මනෝකම් හැටියට භුක්ති විඳින්නත්, නැවත නැවත ත් මේ ලෝකය බාහිරෙන් උපදවා ගන්නත්,ක්‍රියාත්මක වෙලා තියෙන්නේ සතර ආහාරය ම යි.

යම් කිසි කෙනෙක් මේ කබලිංකාර ආහාරය මනාකොට නුවණින් යුක්තව සම්මශ්‍රණය කරළා බලනවා නම්, සතරසතිපට්ඨානය තුළ, කායානුපස්සනාව හැටියට පෙන්නන්නේඒකයි.තව විදියකින් ගත්තොත් රූප උපාදනස්කන්ධය පිරිසිඳ දකින එකයි.

එතකොට මේ කබලිංකාර ආහාරය පිරිසිඳ දකින කොට යම් ආත්ම දෘෂ්ඨියක් රූපය අරභයා බැසගෙන තියෙනවා නම්, ටිකෙන් ටික, ටිකෙන් ටික ඒ ආත්ම දෘෂ්ඨිය රූපයෙන් නො දන්නාකම නිසා අපේ හිතේ ඇතිවුණ, මට ඔසවලා තියෙන නිමිත්තක් මේ. රූපයේ යථා ස්වභාවය මෙන්න මේක යි කියලා රූපය පිරිසිඳ දකින්න දකින්න කුමක් ද සිද්ධවෙන්නේ? රූපය අරභයා අපේ තියෙන ආත්ම දෘෂ්ඨිය දුරුවෙලා යනවා. එතකොට කබලිංකාර ආහාරය පිරිසිඳ දකින කොට ඒත් එක්ක රූපය පිරිසිඳ දකිනවා.ඵස්සආහාර, මනෝසංචේනාආහාර, විඤ්ඤාණආහාරපිරිසිඳදකිනකොටඒත්එක්කනාමයපිරිසිඳදකිනවා.

අපි මේ සතර ආහාරය ඇයි බලන්නේ? අපේ ආත්ම දෘෂ්ඨිය දුරුකරගන්න යි. අපේ ආත්ම දෘෂ්ඨිය බැහැගෙන තියෙන්නේ වෙන කිසි ම තැනක නෙවෙයි. කාය-වේදනා-චිත්ත-ධම්ම කියන සිව් තැන යි. (ඒ නිසා, අපේ ස්වාමීන් වහන්සේත් අහගෙන ඉන්න නිසා මේවා මම හිතන්නේ ඊළඟ දේශනාවේ දී මේවා තව දුරටත් පැහැදිළි කරළා දෙයි. ප්‍රශ්නයක් හරි ගැටලුවක් හරි තියෙනවා නම්. සමහර නො කියවෙච්චි තැන්, සාධාරන නො වුණු තැන්, ඒවා පැහැදිළි කරලා දේවි.)

මේ කාය-වේදනා-චිත්ත-ධම්ම කියන තැන් හතර ආත්ම දෘෂ්ඨියට බැහැගන්නේ, කායානුපස්සනා-වේදනානුපස්සනා-

චිත්තානුපස්සනා-ධම්මානුපස්සනා කියන මේ සිවු පොලේ තියෙන ආත්ම දෘෂ්ඨිය දුරුවෙන විදියට යි, අපි මේ ආහාර පරියාය සම්මශණය කරන්න ඕනේ. එහෙම ආහාරය මනා කොට පිරිසිඳ දැක්කොත් අපේ සත්ත්ව-පුද්ගලභාවය පවතින්න රැඳෙන්න තැනක් ඇත්තේ නැහැ. ඒ නිසා සතර සතිපට්ඨානය තුළ විශේෂයෙන් අපේ සංයෝජනය, අපේ බැඳීම තියෙන්නේ රූපය අරභයා යි. ඒ නිසා අපි රූපය පිළිබඳව හොඳට සම්මර්ශණය කරලා බලන කොට *යථා ඨිතං යථා පණිහිතං ධාතුයෝ පච්චවෙක්ඛති.* යම් සේ පවතීද, යම් සේ පිහිටා පවතී ද ඇත්ත ඇති හැටියෙන් දකින කොට මෙච්චර කාලයක් සත්ත්වයෙක්-පුද්ගලයෙක්-ආත්මයක් කියලා,*ඉති අජ්ඣත්තංවා බහිද්ධාවා* ආධ්‍යාත්මික වේවා, බාහිර වේවා. සත්ත්ව-පුද්ගලයා අනුව රූපයේ යථා ස්වභාවය හොඳට සම්මර්ශණය කරන්න.මම මෙතැන සඳහන් කරන්නේ කබලිංකාර ආහාරය සම්බන්ධව යි.ඒ නිසා හැම දෙනා ම තමන්ගේ කෙලේසය පවතින්නේ, සංයෝජනය පවතින්නේ ඉස්සරහට එන කොට මේ සත්ත්වයෙක් පුද්ගලයෙක් කියලා ම නම්, මේ මම කියලා නම්, ඒ නිසා අපිට අපේ සංයෝජනය තියෙන තැන තමයි රූපය අරභයා.

- ඒ නිසා රූපය හොඳට පිරිසිඳ දකින කොට කබලිංකාර ආහාරයේ විශාරදභාවයට පත්වෙනවා. කබලිංකාර ආහාරය පිරිසිඳ දකිනවා.
- කබලිංකාර ආහාරය පිරිසිඳ දකින කොට රූපය අරභයා තිබුණු ඡන්දරාගය දුරුවෙලා යනවා.
- හරියට කබලිංකාර ආහාරය පිරිසිඳ දැක්කොත් අපට පුළුවන් හැකියාව ලැබෙනවා අනාගාමී වෙන්න ම.

ඒ නිසා මේ ආහාර පරියාය නැවත නැවතත් තමන්ගේ ජීවිතය පැත්තට එකතු කරගෙන, අපට යමක් පෙනෙනවා-ඇහෙනවා-දැනෙනවා-දැනගන්නවා කියන මේ කාරණාව හරහා ක්‍රියාත්මක වෙන්නේ, සතර ආහාරය යම් කිසි කෙනෙක් ආහාරය හරියට

දන්නවා නම්,සම්මාදිට්ඨි සූත්‍රයේ [7] පෙන්නනවා. *ආහාරඤ්ච පජානාති. ආහාර සමුදයඤ්ච පජානාති. ආහාර නිරොධඤ්ච පජානාති.* මේ විදියට යම්කිසි කෙනෙක්,*යථෝ ඛෝ අරියසාවකෝ ආහාරඤ්ච පජානාති. ආහාර සමුදයඤ්ච පජානාති. ආහාර නිරොධඤ්ච පජානාති. ආහාර නිරොධගාමිණී පටිපදඤ්ච පජානාති. එත්තාවතා පි ඛෝ අරියසාවකෝ සම්මා දිට්ඨි හොති. උජුගතාපි දිට්ඨි ධම්මෙ අවෙච්ඡප්පසාදෙන සමන්නාගතෝ ආගතෝ ව ඉමං සද්ධම්මං* කියලා ඉවරවෙලා, හරියට සතර ආහාරය දන්නවා නම් ඔහු මේ ශාසනයට පැමිණිච්ච සම්මාදිට්ඨියෙන් යුක්ත පුද්ගලයෙක් බවට පරිවර්තනය වෙනවා කියලා සැරියුත් මහරහතන් වහන්සේ බුදු පියාණන් වහන්සේගේ න්‍යාය, බුදු පියාණන් වහන්සේගේ බුද්ධ වචනය ඉක්මවන්නේ නැතුව සම්මා දිට්ඨිය ලොකෝත්තර මාර්ගීය ආහාර පරියාය හරහා පැහැදිළි කරලා තියෙනවා.

ඒ නිසා මේ පුංචි කෙටි දේශනාව තමන්ගේ දහම් මාර්ගය දියුණු කරගැනීම සඳහා හේතු උපනිශ්‍රය වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

තෙරුවන් සරණ යි.

[7] බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - මජ්ඣිම නිකාය (1) 110වැනි පිටුව.

2020.04.13

බක් පෝය සවස් වරුවේ දේශනය.

පූජ්‍ය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

හොඳයි එහෙනම් දහම් කරුණු ටිකක් කතා කරමු. හැම දෙනා ම ඉතාමත් ම ඕනෑකමින් හිත එහාට මෙහාට යන්නට නො දී, නොයෙක් අරමුණු සිහිකරන්නේ නැතුව, මේ කරුණු කාරණා ටික තේරුම් ගන්න හොඳ උත්සාහයෙන් ධම් ශ්‍රවණය කරන්නට කියලා හැම දෙනාට ම මුලින් ම මතක් කරනවා.

විශේෂයෙන් අපි පොඩ්ඩක් කතා කළොත් අපේ සමාහිත ස්වාමීන් වහන්සේගේ දේශනාවේ දී සමාහිත ස්වාමීන් වහන්සේ සතර ආහාරය ගැන මතක් කළා. ඒ වාගේ ම සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ උදේ වරුවේ දී නව-පුරාණ කම්යන් ගැන පැහැදිළි කිරීමක් කළා.

එතකොට මේ දේශනාවන් දිහා නුවණින් බැලුවහම ඇත්තට ම මට ඔය මතක් වුන දෙයක් තමයි, අපට තීක්ෂණව සිතීමේ හැකියාව නැතිකම. නැතිනම් මේ හැම පරියායකින් ම

(පරියායකින් කියන්නේ ක්‍රමයකින්) හැම ක්‍රමයකින් ම, හැම දේශනාවක් තුළ ම අපට ලබාදෙන්නේ එක ම එක පණිවිඩය යි. **ඒ තමයි පෙර කර්මයට හටගත්ත විපාක ස්කන්ධ ටිකේ ඇති යථාභූත ස්වභාවය.** (යථාභූත කියන්නේ යම් සේ වේ ද, යම් සේ පවතීද කියලා) ඒ විපාක ස්කන්ධ ටික කියන කොට මේ ඔක්කෝම හිතේ එහෙම නෙවෙයි. මේ අපේ කට්ටිය ඔක්කෝම. සතරමහාධාතු ගත්තත් ඒක හිතේ තියෙන දෙයක් කියලා කට්ටිය සිහිකරන්නේ. සතරමහාධාතු කියන සංඥාව අපට සිහිකරන්න පුළුවන්. නමුත් බාහිර තියෙන ධාතුවක් අරභයා යි අපට සිහිකරන්න පුලුළුවන්කම තියෙන්නේ. එහෙම ධර්මතාවයක් නො තිබේ නම් සිතට ද සිහිකිරීමේ හැකියාවක් ලැබෙන්නේ නැහැ.

එතකොට මේ විපාක ස්කන්ධ ටිකේ තියෙන අනිත්‍ය වූ, දුක් වූ, අනාත්ම වූ, තව පැත්තකින් ගත්තොත් ඒ හැම දේශනාවක් තුළින් ම පෙන්නන්නේ, මතක්කරන්නේසත්ත්ව-පුද්ගල-ආත්මභාවයෙන් සුඤ්ඤත ලක්ෂණය පැහැදිළි කරන්න යි.

අපි ගත්තොත් අපේ සමාහිත ස්වාමීන් වහන්සේගේ දේශනාව දිහා, අපේ සමාහිත ස්වාමීන් වහන්සේ මතක් කළා ආහාර පරියායේ දී,***චත්තාරෝ මෙ භික්ඛවෙආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය*** කියලා. උපන් සත්ත්වයන්ගේ හටගැනීම පිණිස, සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස, සත්ත්වයන්ට අනුග්‍රහ පිණිස පවතින ආහාර වර්ග හතරක් කියලා, කබලිංකාර ආහාරය, ස්පර්ශ ආහාරය, මනෝසංචේතනා ආහාරය, විඤ්ඤාණ ආහාරය කියලා ඒ සතර ආහාරය ගැන කතා කළහම ඒ ආහාරය කියන්නේ හේතු අර්ථයෙන්, ප්‍රත්‍ය අර්ථයෙන්, පටිච්ච අර්ථයෙන්. තව යම් හේතු අර්ථයෙන්. කුමකට ද? හේතු සමුප්පන්න ධර්මයක්. ප්‍රත්‍ය අර්ථයෙන්. ප්‍රත්‍ය සමුප්පන්න ධර්මය, පටිච්ච අර්ථයෙන්. පටිච්චසමුප්පන්න ධර්මයක්. හේතු, හේතු සමුප්පන්න, ප්‍රත්‍ය, ප්‍රත්‍ය

සමුප්පන්න, පටිච්ච, පටිච්චසමුප්පන්න. හේතු නිසා, ප්‍රත්‍ය නිසා කියන අදහසකින්.

එයින් උපදින ධර්මයන්ට මුල්වන අර්ථයෙන් තමයි, හේතු අර්ථයෙන් තමයි ආහාරය ගැන කතා කළේ. එතෙන් දී සමාහිත ස්වාමීන් වහන්සේ මුලින් කාරණාවක් මතක් කළා, සතර ආහාරය කියන කොට එක පරියායකින් කියලා දකින්න කියලා. මොකද අපි ***සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා*** කියලා කියන කොට, සමාහිත ස්වාමීන් වහන්සේ මතක් කළේ ***සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා*** කියලා යි. සියලු සත්ත්වයෝ ආහාරයෙන් යැපෙනවා. මෙතෙන් දී පින්වතුන්ට මම ඒ කාරණාව කියන්නම් දේශනාව තුළ දී.

ලෝකයේ තියනවා පරියාය සහ නිශ්පරියාය කියලා දෙකක්. නිශ්පරියාය කියලා කිව්වහම සියල්ල ම එකට ඇතුළත්වෙනවා. අපි කියමු ***සබ්බ*** යන අර්ථය තියෙන සියලු කියන අර්ථයට තමයි නිශ්පරියාය කියන්නේ. පරියායක් නෙවෙයි. ඔක්කෝම. ***සබ්බෙ සත්තා මරිස්සන්ති*** - "සියලු සත්ත්වයෝ මැරෙන්නාහ" කියපුවහම ඒකෙ ආයෙ ක්‍රමයක් නැහැ.

පරියාය කිව්වොත් - "මනුෂ්‍යයෝ" මැරෙයි කිව්වහම පරියායක්. මනුෂ්‍යයින් ගැන විතරයි මේකේ තියෙන්නේ. එතකොට "දෙවියෝ මැරෙයි" කිව්වහම දැන් දෙවියන් ගැන විතර යි. පරියායක්. "බ්‍රහ්මයින් මැරෙයි" කිව්වහම පරියායක්. "සතර අපායේ සත්ත්වයින් මැරෙයි" කිව්වහම පරියායක්. ඔහොම එකින් එක කියන්නේ නැතුව ***සබ්බෙ සත්තා මරිස්සන්ති*** - "සියලු සත්ත්වයෝ මැරෙයි" කිව්වහම නිශ්පරියායක්. එතකොට දෙවියන් ගැන, බ්‍රහ්මයින් ගැන, මනුෂ්‍යයින් ගැන, නිරි සත්ත්වයින් ගැන වෙන වෙනම කියන්න ඕනේ නැහැ.

ඒ වාගේ ***සබ්බෙ සත්තා ආහරට්ඨිතිකා*** කිව්වහම සියලු සත්ත්වයෝ ආහාරයෙන් යැපෙත් කියන තැන දී නිශ්පරියායක්. ***චත්තාරෝ මෙ භික්ඛවෙ ආහාරා*** කියපුවහම,පරියායක්. "මහණෙනි, මේ ආහාර වර්ග හතරක් තියෙනවා. උපන් සත්ත්වයාගේ පැවැත්ම පිණිස ත් උත්පත්තියක් ලද සත්ත්වයාගේ අනුග්‍රහ පිණිස ත්" කියලා කියන කොට දැන් ඒ ආහාර වර්ගයෙන් උපදින පවතින සත්ත්වයින් ගැන යි පෙන්නන්නේ.

මොකද, මම එහෙම කතා කළේ, කෙනෙකුට ප්‍රශ්නයක් තියෙන්න පුළුවන්: දැන් අසඤ්ඤ තලයේ ඉන්න සත්ත්වයෙක් ගත්තොත්. අසඤ්ඤ තලයේ සත්ත්වයින්ට කබලිංකාර ආහාරය නැහැ. අසඤ්ඤ නිසා, සඤ්ඤ නැති නිසා ස්පර්ශාහාරයත් නැහැ. මනෝසඤ්චේතනා ආහාරයත් නැහැ. විඤ්ඤාණ ආහාරයත් නැහැ. එතකොට එතැන **අසඤ්ඤ සත්ත්වයින් කියනවා "අනාහාරික" යි කියලා.** මේ සතර ආහාරයෙන් එකකටවත් අයිති නැහැ. එතකොට සතර ආහාරයෙන් එකකටවත් අයිති නැතිවුණහම, සියලු සත්ත්වයින් ආහාරයෙන් යැපෙයි කිව්වහම මෙතැන ගැටීමක් ඇතිවෙනවා. තව චුට්ටක් හිතන්න.

නමුත් එතැන දී ගැටීමක් ඇතිකරගන්න එපා. ප්‍රශ්නයක් ඇතිකරගන්න එපා. ***සබ්බෙ සත්තා ආහරට්ඨිතිකා*** කිව්වහම සියලු සත්ත්වයෝ ආහාරයෙන් යැපෙයි කියන එක නිශ්පරියාය යි. අසඤ්ඤ සත්ත්වයිනුත් අයිතියි එතකොට. ***චත්තාරෝ මෙ භික්ඛවෙ ආහාරා*** කියන කොට සතර ආහාරයක් කියලා කියනකොට ඒක පරියායෙන් ඒ සතර ආහාර කියන තැනට විතර යි අසඤ්ඤ සත්ත්වයින් අයින් කරන්නේ. එතකොට සියලු සත්ත්වයින් ආහාරයෙන් යැපෙනවා කියන කොට සත්ත්වයින්ගේ යැපීමට හේතුවක් තියෙනවා. ප්‍රත්‍යයක් ඇතිවෙනවා.

එතකොට අසඤ්ඤ සත්ත්වයින්ට කර්මය ආහාර යි. අසඤ්ඤ සත්ත්වයන්ට තියෙන ආහාරය තමයි කර්ම ආහාරය. එතකොට කර්මය නමැති ආහාරයෙන් ආහාර වෙන කොට සියලු සත්ත්වයින් ආහාරයෙන් යැපෙනවා කියන කාරණාව අයිති යි.

ඒ එක යි සීල-සමාධි-ප්‍රඥා කියන එතැන් දී ***සබ්බෙ සත්තා ආහරට්ඨිතිකා*** කියන්නේ නිශ්පරියායෙන් ගෙනාපු එකෙනුයි. මොක ද පරියායකින් තමයි ***චත්තාරෝ මෙ භික්ඛවෙ ආහාරා*** මහණෙනි, මේ ආහාර වර්ගීකරණය කරළා, කොටස් කරළා, නැතිනම් ආහාර වර්ග හතරක් ගැන කියනවා. පරියායක්. ක්‍රමයක්. ඒ ක්‍රමයට විතරයි අසඤ්ඤ සත්ත්වයින් අයිති නැත්තේ.

මේ ආහාරය කියන එක පෙර අවිද්‍යා-කර්මයට හටගත්තු විපාක ස්කන්ධ ටික තියෙන තැනට තව එක නමක්. ආහාර චක්‍රයක් කියන තැන ස්වාමීන් වහන්සේ ඒක බොහෝම ලස්සනට පැහැදිළි කළා බොහෝම නිවැරැදිව. ආහාර ප්‍රත්‍යයෙන් හටගත්ත ධර්ම, ආහාර නැතිවෙන කොට නැතිවෙනවා කියන එක,ඒ සතරාහාරයේ ස්වභාවය යි. හේතු නිසා හටගත්ත දේ හේතු නැතිවෙන කොට නැතිවෙනවා කියන ධර්මතාවය යි.

උදේ අපේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේගේ දේශනා පරියායේ දී, නව-පුරාණ කර්ම ප්‍රබේධයේ දී, "මහණෙනි, නුඹලාට පුරාණ කර්ම දේශනා කරමි" කියන තැනක දී "ඇස පුරාණ කර්මයක්. චේතනාවෙන් පිළියෙළ වෙන වේදනාවට වස්තුවක් කොට දරන්නේ" කියලා උන්වහන්සේ මතක් කරපු තැන,මේ පෙර අවිද්‍යා-කර්මයට හටගත්ත විපාක ටිකට තමයි ඒ සතර ආහාරය කියලා පෙන්නුවේ, සතර ආහාරය කියන සමාහිත ස්වාමීන් වහන්සේ සවස මතක් කරපු ටික ම යි, පුරාණ කර්ම ප්‍රත්‍යයෙන්

හටගත්ත විපාක ටිකක් පුරාණ කම් ප්‍රත්‍යයෙන් "මහණෙනි, නුඹට පුරාණ කම් දේශනා කරන්නේ" කියලා කියනවා.

ඔන්න ඔය පුරාණ කම්යෙන් හටගත්ත හිතේ ඇත්ත නොදන්නාකම නිසා යි වර්තමානයේ දී ඇතිකරගන්න තණ්හා උපාදාන කියන කෙලෙස් ටික හරහා ඔය විපාක ස්කන්ධ ටිකට කෙලෙස් වශයෙන් ම බැහැගෙන ආත්මභාවය අපි හදාගෙන තියෙන්නේ. ඔය ආයතන හය ම ඇති පුද්ගලයෙක් නිම්ණයවෙලා තියෙන්නේ ඔය ආයතන ටික විපාක ස්කන්ධ ටික ඇතුළට බැහැගත්තු නිසා කෙලෙස් උපදිනවා.

එතකොට මෙතැන දී හැම වෙලාවේ ම මේ දේශනාවන් තුළින් උගන්නන්නේ එක දෙය යි. මොකක් ද? පුරාණ කම්යට හටගත්ත විපාක ස්කන්ධ ටික යි. නැත්නම් පුරාණ කම්යට හටගත්ත ධාතු ටික යි. එහෙම නැතිනම් සතර ආහාරයක් තියෙන තැනක පවතින ස්කන්ධ ටික යි.

මේවා කෙනා කෙනා ගේ සිත ඇතුළේ තියෙන මනෝමය සිද්ධාන්ත නෙවෙයි. බාහිර ඝනවූ, තියුණු වූ කබලිංකාර ආහාරය නිසා ඕජාව අටවෙනි කොට ඇති රූප කලාප අරගෙන එනවා. ඒ ඕදාරික ආහාරයෙන් තමයි ඕජා සාරය ඇතිකරගන්නේ. ඒ ඕජා සාරය කියලා කියන කොට අපට ඔය ඇහැටවත් පෙනෙන්නේ නැති සියුම් වාෂ්ප ස්වභාවය වාගේ ස්වභාවයක්. එබඳු වූ ස්වභාවයකින් තමයි මේ ඇහැ-කන-දිව-නාසය-ශරීරය කියන ආයතන ටික, මේ හැම රූප කලාපයක් ම හැදෙන්නේ.

- එතකොට යම් කෙනෙකුට කබලිංකාර ආහාරය බත්-පාන්-කවුපි-මුංඇට හැටියට රලුවට දැක්කාට, ඒ ටික ම තමයි සියුම් ආකාරයට පරිවර්තනය වෙලා, පෙරිලා මේ ඇහැ-

කන-දිව-නාසය-ශරීරය කියන මට්ටමට ඇතිවෙලා තියෙන්නේ.

- කෙනෙකුට ඇහැ මම, ඇහැ මගේ, ඇහැ මගේ ආත්මය කියලා ඡන්දරාගය තිබුණා නම්, ඒ කබලිංකාර ආහාරයට යි තණ්හාව කියන්නේ.
- කබලිංකාර ආහාරයට යම්කිසි කෙනෙකුට තණ්හාව තියෙනවා කියලා කියන්නේ කබලිංකාර ආහාරය හැදූ රූපයට යි තණ්හාව තියෙන්නේ.
- කබලිංකාර ආහාරය පිරිසිඳ දැක්කොත් මේ කාම භූමියට නැවත එන්නේ නැහැ කියලා කියන්නේ එයා "මේ කබලිංකාර ආහාරයෙන් හැදුණු මේ ඇහැ-කන-දිව-නාසය-ශරීරය මම කියල, මගේ කියලා, මගේ ආත්මය යි කියලා තණ්හා-මාන වශයෙන් දකින්නේ නෑ" කියනවා.

එතකොට එබඳු වූ ආහාර ප්‍රත්‍යයෙන් හැදුණු රූපය, බත්-පාන්-කවුපි-මුංඇට වාගේ දේවල් දිහා බලන්න. අපි ආහාර තණ්හාව කියලා කියන කොට අපි එතෙන්ට නෙවෙයි තණ්හාව කියන්නේ. ඒ කන-බොන ආහාරය සත්ත්වයෙක්-පුද්ගලයෙක් නෙවෙයි. එබඳු කන-බොන ආහාර පාන අපි ගත්තහම, ඒවා තවත් සියුම් කැබැලිවලට කඩන්න තමයි මේ දත් ටික තියෙන්නේ. ඒවා හොඳට හපන්න, නැතිනම් ඒ ආහාරය මොලොක් කරලා දෙන්න තමයි මේ කේඨ ග්‍රන්ථී නැතිනම් කෙළ තියෙන්නේ.

උදාහරණයක් හැටියට ගන්නඃ දැන් ඔය වලස්සුන්ගේ කටේ එහෙම තියෙන කෙල, ඔය සතෙක්ගේ ඇට කුරක ගෑවිච්චි ගමන්, ඇට කුර මඤ්ඤෙක්කා අලයක් වගේ මොළොක් වෙනවා. දැන් ඔය ඇත්තන් දැකලා ඇති පිඹුරෙක් වාගේ සතෙක් ගිලින්න හදලා බේරිච්චි අය බලන්න. පිඹුරෙක්ගේ මුලු ඇගේ ම තියෙන කෙල, ඒ ගොල්ලන් අර අල්ලගත්ත ගොදුරු කෙළ ගෑවෙච්චි ඒකෙන් තමයි ගිලින්න පහසුකරලා දෙන්නේ.

ඒ වාගේ හොඳට ආහාරය මෘදු කරළා, මොළොක් කරළා හපන්න පුළුවන්බවට පත්කරළා දෙන්නේ මේ කේඨ ග්‍රන්ථී යි. ඊට පස්සේ එහෙම හොඳට හපලා ආමාශයට ගියාට පස්සේ හරියට අර සිමෙන්ති අනන කොන්ක්‍රීට් අනන මැෂින් තියෙන්නේ, එහෙම ගල්-වැලි-සිමෙන්ති දැම්මහම අරක ස්විච් එක දැම්මහම කැරකෙනවා වාගේ මේ ආමාශයට වැටුණු ආහාර ටික, ආමාශය ඇතුළේ තියෙනවා කොට්ඨාශ වාතය කියලා කියන්නේ ඒ වාතයට. ඒකෙන් හැම වෙලාවේ ම පෙරළනවා. පෙරළලා, පෙරළලා, පෙරළලා ඕජාවක් බවට හදනවා, දියරයක්. එතකොට මේ රොඩු ඕජාවක්. හරියට මේ නිකම් කැඳ හැලියක් වාගේ.

ඊට පස්සේ මේ ආහාර ඕජාව පුරුෂයන්ට දෙතිස් රියන්, රියන් තිස් දෙකකුත්, ස්ත්‍රීන්ට රියන් විසි අටක් දිග බඩවැලක් තියෙනවා. මේ බඩවැල දිගේ ම ඕජා සාරය යන එක තමයි කරන්නේ. හොඳට මතක තබාගන්න, හොඳට රත්වෙච්චි බටයක් දිගේ අපි වතුර ටිකක් යැවුවොත්, බලන්න කෙළවරට යන කොට අර වතුර ටිකට මොකක් වෙයි ද කියලා. අර ඌෂ්ණයට වාෂ්ප වෙනවා. ඒ වාගේ මේ බඩවැලේ ඇතුළේ වටේට කමීජ තේජෝ ධාතුව රත්වෙලා තියෙනවා. මේකේ අර ආහාර ඕජාව බඩවැල දිගේ ම යන කොට ඒ ඌෂ්ණයට මේකේ සියුම් ඒ ජල ස්වභාවය ඔක්කෝම උරා ගන්නවා. සියුම් සියුම්, සියුම් සියුම් ඔය අතුනු බහන් කියලා අපි කියන්නේ, කුඩා බඩවැල් කියන්නේ. ඒ වාගේ ඒ ඔක්කෝම ආහාර ටික උරාගෙන රොඩු ටික විතරක් කෙළවරට යනවා. ඒකට තමයි අපි අශුචි කියලා කියන්නේ.

අන්න ඒ උරාගන්න, අර නලය ඇතුළෙන් යන වතුර ටික වාෂ්ප වෙනවා වාගේ, ආහාර ඕජාව, එතකොට කබලිංකාර ආහාරය ආමාශයට ගියහම ඕජාවක්. ඒ ඕජාව බඩවැල දිගේ ම යන කොට තමයි ඒ ඕජා සාරය වාෂ්ප වෙන්නේ. වාෂ්ප වෙලා අන්න ඒ ටිකෙන් තමයි ඒ හැදෙන, ඒකට කියනවා ආයුෂ කියලා. ඒ ආයුෂ

මුල්කරගෙන තමයි මේ ශරීරයේ පැවැත්ම වෙන්නේ. ඒකයි දැන් ආහාර-පාන හරියට හපලා කන්න බැරිවෙන කොට ආයුෂ පිරිහෙනවා කියලා කියන්නේ. ආයුෂ අඩුවෙනවා. හොඳට ආහාර-පාන හපන්නේ නැතිවුණහම දැන් අපි කියනවා, හැපෙන්නේ නැහැ. හපන්නේ නැතිවෙන්න වෙන්න ආයුෂ පිරිහෙනවා. එතකොට මේ කයේ ආයුෂ හැදෙන්නේ එහෙම යි.

එතකොට අන්න ඒ සියුම් කබලිංකාර ආහාරය කියන කොට අන්න ඒ විදියට ඒ ඕජාව හරියට ශීතකරණයක තියෙන චක්‍රය බලන්න: විටෙක වතුර වෙනවා. වතුර ආපහු අයිස් වෙනවා. අයිස් ආපහු දියරයක් වෙනවා. ඒ චක්‍රය වගේ ම මේකෙදි ත් කෙස්-ලොම් රලු ආහාර ටික දියරයක් වෙනවා. දියරය ආපසු ඝණ බවට පත්වෙනවා. මේ සම්-මස්-නහර-ඇට-ඇටමිදුලු හැටියට මේ විදියට තියෙන්නේ හරියට වතුර ටිකක් සීතල වැඩි වුණහම, උනුසුම අයින් වුණහම කැට ගැහිලා වගේ දැන් මේ ආහාරය තමයි අපට මස්-හම්-ලේ-නහර කියලා කියන්නේ. ඒකයි, විඤ්ඤාණය හදිස්සියේ නිරුද්ධ වුණොත් සම්පූර්ණ ම මේක ආපහු දියවෙනවා. අර අයිස් කුට්ටියඑළියෙන් අරගෙන තිබ්බොත් ආපසු දියවෙන්නේ. ඒ වාගේ. එතකොට කබලිංකාර ආහාරය කියන කොට මේ තමන්ව ම දකින්න. මේ රූපය ම දකින්න.

එතකොට ඒ වගේ සතර ආහාරය කියන කොට එබඳු වූ රූපය නිසා උපදින, පවතින චිත්ත චෛතසික එබඳු ම අනාත්ම යි. එතකොට මෙන්න මේ විපාක ස්කන්ධ ටික තියෙන අවස්ථාව, නැතිනම් සතර ආහාරය තියෙන තැන, දකින්න චක්ඛු සම්ඵස්සය. චක්ඛු සම්ඵස්සය කියන කොට ඔබට ඇහැත්, රූපයත්, චක්ඛු විඤ්ඤාණයත්, ඒ තුන්දෙනාගේ එකතුව චක්ඛු සම්ඵස්සය. චක්ඛු සම්ඵස්සය එන කොට වේදණා, සංඥා, චේතනා. ඒ කියන්නේ රූපයක් විඳිනවා, හඳුනනවා, හිතනවා කියන ධර්මතා යි. ඇසට රූපයත්, කනට ශබ්දයත්, නාසයට ගන්ධයත්, රසත්, කාය ස්පර්ශයත්,

එබඳු ධර්මතා සිහිකරන්න පුළුවන්කමත් කියන මෙන්න මේ ධර්මතා ටිකේ ම තියෙන්නේ විපාක-නාමරූප දෙක නැතිනම් සතර ආහාරය පුරාණ කර්මයට හටගත්ත ස්කන්ධ ටික යන ගණයට යනවා.

ඔන්න ඔය ටිකේ ස්වභාවය තමයි හැම වෙලාවේ ම සත්ත්ව-පුද්ගල-ආත්මභාවයෙන් තොර සුඤ්ඤත ධර්මතාවයක්. හොඳට මතකතබාගන්න, දැන් මේවා හිතේ හිතේ තියෙන දේවල් නෙවෙයි. ඔක්කෝම හිතේ නෙවෙයි. මෙතැන හිත කියන ධර්මතාවය ත් ඒ ස්කන්ධ ටික හා සම්බන්ධ යි.

ඇහැත් රූපයත් දෙක නිසා ම චක්ඛු විඤ්ඤාණය ඉපදිලා, ඇහැත් රූපයත් දෙක තියෙනකම්ම පවතිනවා. ඒ චිත්ත චෛතසික ටිකත් රූපය අනුව ම ගිහිල්ලා තියෙන්නේ. එතකොට මෙතැන තියෙන්නේ මේ විපාක ස්කන්ධ ටිකේ තියෙන, තව පැත්තකින්, ඔබ අතීතයේ වේවා, දැන් වේවා, අනාගතයේ වේවා, ඇහෙන් යම් රූපයක් බලයි නම්, ඒ රූපය පෙනෙන ඇහැ ත්, ඇහැට පෙනෙන රූප ත්, ඒ දෙන්නා නිසා පෙනීම සඳහා උදව්වුන චිත්ත-චෛතසික ටික ත්, හැම වේලාවේ ම සතර ආහාරයක් කියන විපාක වූ ධර්මතාවයක්. ඒ ටික හැම වෙලාවේ ම අනිත්‍ය යි. ඒ ටිකේ තමයි තණ්හා-මාන වශයෙන් බැඳුණොත් දුක ගෙනැත් දෙන්නේ. ඒ ටිකේ ධර්මතාවය තමයි අනාත්ම කියන සිද්ධාන්තය තියෙන්නේ.

ඔන්න ඔය පෙනෙනවා කියන සිද්ධිය අරභයා, පෙනෙනවා කියන සිද්ධාන්තය අරභයා අපේ මනස තුළ ඇතිකරගන්න ප්‍රපංචයක්, නැතිනම් ප්‍රමාද කරන ධර්මයක් තමයි, නිත්‍ය යි-සැප යි-ආත්ම යි කියලා හිතෙන ගතිය. ඒක විපාක ස්කන්ධ ටික නිසා උපදින හිත, විපාක යි යන ගණයට ගෙනෙන්නේ. ඒ විපාක ස්කන්ධ ටික හටගෙන නිරුද්ධ වෙනවාත් එක්ක ම ඒ ටික පුද්ගලයෙක්,

කෙනෙක් කියන ආකාරයට සිතීම් වශයෙන් සිත තුළ අවදිවෙන, සිත තුළ උපදින මනෝ විඤ්ඤාණ මට්ටමට යි හැම වෙලාවෙම මේ නිත්‍ය යි-සැප යි-ආත්ම යි කියන කෙලෙස් ටික තියෙන්නේ.

ඔන්න දැන් අපට දෙපැත්තක් තියෙ යි. අපි කියමු, ඔබ දැන් සිහිකරගන්න තමන්ගේ ඥතියෙක් ව. තමන්ගේ දරුවෙක්ව සිහිකරගන්නවා අපි. ඔන්න දැන් අපට හොඳට සිහිකරගන්න පුළුවන් කෙනෙක්. මේ සිහිකරගන්නවා කියන තැනට අපට තියෙන්නේ ප්‍රපංච සංඥාවක්. ආත්ම සංඥාවක්. ආත්ම නිමිත්තක්.

<u>හැබැයි ඇහැ නොා තිබුණා නම්, ඇහැට රූපයක් නොා පැමිණුනා නම්, ඊට අනුරූප වූ විඤ්ඤාණය පිහිටලා රූප සංඥාවක් පහළ නොා වුණා නම් මේ ආත්ම සංඥාව හදාගන්න අපට පුළුවන්කමක් නැහැ.</u>

ඉස්සෙල්ලා ම ඇහැ අපිට රූපයක් දෙනවා. ඒ පෙනෙන තැනක තිබුණු රූපය, ඇහැත් රූපයත් දෙක, පඨවි-ආපෝ-තේජෝ-වායෝ කියන මහාභූත ටික නිසා ම හටගත්ත, කබලිංකාර ආහාරයෙන් හැදෙන රූප හැදෙන මට්ටමේ මහාභූත ටික ඇසුරුකරගෙන තිබුණු වණ්ණ සටහන් මාත්‍රයක්, රූපයක් තමයි ඇස් ඉදිරිපිටට ආවේ.

ඒ රූපය දිහා, ඊට නැඹුරුවෙලා අපි, යම් ආකාරයකට හිතුවොත් දෙවනුවට ***නාමරූප පච්චයා විඤ්ඤාණං*** කියන්නේ අර ඇහැට පෙනුනු රූපයත්, රූපය අරහයා හිතපු දේත් දෙක එකට එකතු කරළා යි මනෝමයෙන් දැනගන්නේ.

උදාහරණයක් හැටියට කියමු. ඔන්න දැන් අපිට ඇහැට රූපයක් පෙනුනා. පෙනෙන රූපයට, "අනේ මේ මගේ එක ම දරුපැටියා නේ" කියලා හිතුවා කියන්නකෝ. දැන් පෙනෙන රූපය දිහා බලාගෙන "මගේ එක ම දරු පැටියා නේ" කියන ටික හිතුවේ. දැන්

එතැන රූප හදන්න බැහැ. රූපයක් පෙනුනා. පෙනෙන රූපයට මෙහෙම හිතුවහම පෙනෙන රූපය ත්, අපි අර හිතපු ටික ත්, දෙක එකට කරලා, විඤ්ඤාණය මායාවක් කියන්නේ, අර දැකපු රූ සටහන සිහිකරගත හැකි යි. මනෝ විඤ්ඤාණයට හැකියාවක් තියෙනවා, "මගේ දරු පැටියා නේ" කියලා සිහිකරගන්න පුළුවන්.

දැන් මේ සිහිකරගන්නවා කියන කොට ***නාමරූප පච්චයා විඤ්ඤාණං.*** එතැන දී ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණ, චක්ඛු සම්ඵස්සය නැතිනම් මේ වේදනාව කියන නාම ධර්ම කියන ඔක්කෝම ටික වැයවෙලා -හොඳට ගන්න- ඒ ඔක්කෝම ටික යෙදිලා වැයවෙලා අපට හම්බවුණේ ඇහැට පෙනෙන රූපය විතර යි. ඔන්න රූපය. ඔතැන තියෙනවා කබලිංකාර ආහාරයේ, ස්පර්ශ ආහාරය. ඊට පස්සේ, "අනේ මගේ දරුවා නේ" කියලා හිතන කොට ම, ඒ කියන්නේ මනෝසඤ්චේතනා ආහාර යි. අන්න අර පෙනුනු රූපයත්, "මගේ දරුවා නේ" කියලා හිතාපු හිතත්, ඕකට කියනවා නාම රූප කියලා. "මගේ දරුවා නේ" කියලා හිතාපු හිත තමයි මෙතැන නාම වෙන්නේ. ඔය නාමයේ රූපය ත් මේ නාමය ත් මේ නාම-රූප දෙක නිසා ඔය පින්වතුන් ගාව දැනගැනීමක් ඇතිවෙනවා, "මේ රූපය මගේ දරුවා" කියලා. දැන් ***විඤ්ඤාණ පච්චයා නාමරූපං*** - හිතට නාමධර්ම සිහිකරන්න වුණොත්, හිත සිහි කළොත්, හිත සිහිකරන්නේ කෙලින් ම, "මගේ දරුවා නේ" කියලා විඤ්ඤාණයේ අත්දැකීම ම යි. අර දකින රූ සටහණ ම යි. "මගේ දරුවා නේ" වෙච්චි එක යි. ඔතෙන්ට එන කොට ම සම්පූර්ණවම ගැටගැහිලා ම යි තියෙන්නේ. ඔය ඇත්තන්ට හදන්න බැහැ. අපි මේ ලෝකය කියන්නේ කෙලින් ම දරුවා ම වෙලා.

එතැන තව ටිකක් ගැඹුරට ගියොත්, ඔය ඇත්තන්ට එහෙම ප්‍රඥා විමුක්ති ඕනෙත් නැහැ. ඇහැට පෙනෙන රූපය අරභයා කිසි ම ප්‍රඥප්තියක් නැතුව, නිකම් ඒකට සතුටුවෙන අදහසින් හිත නමන්න. ඒක කැමැත්ත කියන කමකින් හිත නැමුවොත්, දැන් ඒ

කැමැත්ත තමයි දැන්නේ.අර රූපය යි, ඒ කැමැත්ත ගතිය යි, දෙක එකට එකතු කරලා මනෝ විඤ්ඤාණයෙන් කැමැති රූපය කියලා සිහිකරගන්න පුළුවන්. දැන් තිරිසන්ගත සත්තුන්ට දරුවා කියලා, දරුවා කියන්නේ රොශාන්, නැතිනම් ඒ තාත්තා කියලා ප්‍රඥප්ති නැහැ නේ. නමුත් පෙනෙන ඇහෙන දෙයට තණ්හාව නැහැ නේ.

එහෙම නැතිනම් ඇස් ඉදිරිපිටට රූපයක් එනවා. ඔය පින්වතුන්ට දැන් මෙතැන දී, මේ පරියායේ දී මම රූපය කියලා කියන තැනට ඔය ඇත්තන්ට විපාක, නාමරූප දෙක ම තියෙනවා. නමුත් කාම භූමියේ දී නාමධර්ම වැයවෙලා අපට රූපය විතර යි ප්‍රකට. තේරුණා ද? මේ අපට ඇහැට රූපයක් පෙනෙනවා කියන තැනක ඇහැත් රූපයත් දෙක රූපය යි. ඒ දෙදෙනා නිසා හටගත්තු චක්ඛු විඤ්ඤාණයට කියනවා නාම චක්ඛු සම්ඵස්සය. ස්පර්ශය නිසා වේදනා-සංඥා-චේතනා පහළවෙනවා කියලා අපට යමක් පෙනෙන තැනක විපාක-නාමරූප දෙකක් ම තියෙනවා. තිබුණාට නාමධර්ම අපි දන්නේ නැහැ. මේ වේදනාව, මේ සංඥාව, මේ චේතනාව, මේ විඤ්ඤාණය, ඕවා ගැන කතා මොකුත් අපි දන්නේ නැහැ. ඔය නාමධර්ම ටික යෙදිලා, වැයවෙලා, අපට රූපයක් පෙන්නන කෘත්‍යය තමයි මේකෙදී කරන්නේ.

ඒ හින්දා රූපය අනාත්ම වුණොත්, රූපයේ ඇත්ත දැක්කොත් නාමධර්ම ටිකේත් ඇත්ත මේ මොහොතේ දකිනවා. රූපයේ රැවැටුණොත් නාමධර්ම ටිකේත් රැවැටෙනවා. ඒ හින්දා මේ වෙලාවේ දී අමුතුවෙන් නාමධර්ම ටික ලෙහාගන්න අමාරුයි. උත්සාහවත් වෙන්න ඕනේ නැහැ. අපට තියෙන්නේ නාමධර්ම යෙදිලා, වැයවෙලා පෙනුනු රූපයේ ඇත්ත දකී ද, නො දකී ද කියන ප්‍රශ්නය විතර යි.

දැන් ඔන්න ඒ නාමධර්ම ටික -මම හිතන්නේ තේරෙනවා ඇති හැමෝට ම- ඔබේ ඇස් ඉදිරිපිටට එන්නේ, අපි කියමු රූපවාහිනිය

දිහා බලන්නකෝ. අපට තේරෙන විදියකට ගත්තොත් අපට හොඳට ම තේරෙනවා නේ, ඒකේ කෙනෙක්, පුද්ගලයෙක් නෑ කියලා. ඇහැත්-රූපයත්, ඒ දෙන්නා තියෙන තැනට චිත්ත-චෛතසික ටිකත් යෙදුනහම, ඒ නාමධර්ම ටික යෙදිලා, වැයවෙලා රූපයක් පෙනෙයි. ඔය රූපය පෙනෙන කොට, ඔය රූපයට "කෙනෙක්" කියලා අපි හිතනවා. හිතනවා නෙවෙයි, මේ මොහොතේ දී අපට හිතෙනවා. එච්චරට ස්වයංක්‍රීය වෙලා. එච්චරට ආශ්‍රව බලවත්. "කෙනෙක්" කියලා හිතෙනවා.

ඊට පස්සේ පෙනෙන දේ යි, පෙනෙන දේට අප ම කෙනෙක් කියලා හිතපු දේ යි කියන දෙක ම එකතු වෙලා මේ පෙනෙන රූපය කෙනෙක් කියලා දැනගන්නවා. තාම කර්ම සකස්වෙලා නැහැ. තාම ගොඩයන්න පුළුවන්.

ඒක මෙහෙම යි වෙන්නේ: කර්ම සකස් වෙනවා ද නැද්ද කියන එක තියෙන්නේ අවිද්‍යා ප්‍රත්‍යය වීම හා නො වීම මතයි. දැන් දැනගන්නවා කියන කොට විඤ්ඤාණ ආහාරය යි. ඔබට මේ සතර ආහාරය ම ඔන නම් නිරුද්ධකරන්නත් පුළුවන්. සතර ආහාරය ම ප්‍රත්‍ය කරගෙන නැවත විපාක-නාමරූප දෙක හදාගන්නත් පුළුවන්. ඒක අපි බලමු.

යම් වෙලාවක රූපවාහිනියේ තියෙන රූපය කියන්නේ වර්ණ සටහණක්, සත්ත්ව-පුද්ගල නො වන අනාත්ම රූප සටහණක් නේ ද. ඒ අරභයා කෙනෙක්-පුද්ගලයෙක් කියන හැඟීම -මේ රූපත් අපි හිත පැත්තෙන් දැම්මේ නැහැ. හොඳට මතක තියාගන්න.- පෙනෙන රූපයක කෙනෙක්-පුද්ගලයෙක් කියන හැඟීම විතර යි අපේ හිත පැත්තෙන් අපි තබන්නේ. තැබුවහම මනෝ විඤ්ඤාණයෙන් අත්දැකීම, පෙනුනු රූපය "කෙනෙක්" කියන මේ හිතේ තියෙන ගතිය යි, පෙනෙන එක යි දෙක ම එකට ඔසොවලා ගත්ත හැකි යි. අත් දැකීම් දෙක ම එකට -දැනට

මනෝමයෙන් සිහිකරන කොට. විඤ්ඤාණයෙන් දැනගත්ත දේ සිහිකරන කොට දැනගත්තේ කොහොම ද,*නාමරූප පච්චයා විඤ්ඤාණං.* ඒ නාමරූප දෙක නිසා දැනගත්තා මේ "කෙනක්" කියලා. දැනගන්නවා කියන එක හැමදා ම මායාවක් කියලා කියන්නේ බොරුවක්. තාම කමී සකස් වුණේ නෑ කියන්නේ අවිද්‍යාව ප්‍රත්‍ය වුණොත්, මේ පෙනෙන වණී සටහණට හිත පැත්තෙන් "කෙනක්" කියන එක හිතලා ඒ පෙනෙන රූපය යි, හිතපු එක යි දෙක ම එකතුවෙලා නෙවෙයි ද මේ දැනගැනීම ඇතිවුණේ කියලා මේ රූපය, මේ නාමය, මේ නාමරූප දෙක නිසා නෙවෙයි ද දැනගත්තේ කියන එක දැක්කේ නැතිනම්, අන්න අවිද්‍යා ප්‍රත්‍යයෙන් මේ හිතපු එක ම ඔබට කමී වෙනවා. මේ විඤ්ඤාණය ම ඔබට කමී විඤ්ඤාණය වෙනවා.

ඔක ම කමීක්ෂය වෙනවා ඔබට ඒ විඤ්ඤාණය නො පිහිටනවා *නාමරූප නිරොධො විඤ්ඤාණං නිරොධා* කියලා කියන්නේ ඔබට මේ ඇස් ඉදිරිපිටට ආපු වණී සටහණ චිත්‍ර මාත්‍රයක්, රූපවාහිනියේ තිබුණු. ඒකට "කෙනෙක්" කියලා හිතින් හිතුවහම අපේ හිතේ ඉබේ ම මේ "කෙනෙක්" කියන හැඟීම ඇතිවුණහම, නැතිනම් පෙනෙන දේට නිසා උපාදනය ඇතිවුණහම ඒ රූපය යි, ඒ රූපයට "කෙනක්" කියලා හිතාපු හිතේ තියෙන මේ ගතිය යි දෙක ම එකතු කරළා නේ ද මේ රූපය "කෙනක්" කියලා දැනගැනීම ඇතිවුනේ කියලා ඔබ දැක්කොත්,කිසිවිටෙක බාහිර වණී සටහණ "කෙනක්" කියලා ඔබට විඤ්ඤාණය පිහිටන්නේ නැහැ. මොකද, ඔබ ඇත්ත දැක්කොත්,"රූපවාහිනියේ තියෙන රූපය වණී සටහණක්. ඒක මහාභූත ටික බදගෙණ යි තියෙන්නේ. මහාභූත ටික කියන්නේ, පඨවි-ආපෝ-තේජෝ-වායෝ කියන වණී සටහණ බදගෙන යි තියෙන්නේ. ඒ රූපය ත්, ඒකට 'කෙනෙක්' කියලා තමන් හිතාපු ටික ත්, මේ දෙක ම එකතුකරළා නේ ද මේ දැනගත්තේ" කියලා දැක්කොත්, දැක්ක පමණකින් ම ඔබට ඇත්ත වෙයි. එතකොට මේ විඤ්ඤාණය නාමරූප දෙකට බැසගන්නවා.

ඒ කියන්නේ රූපය 'කෙනෙක්' කියලා රූපයට ඇඟිල්ල දික්කරන්න බැහැ මේ සත්ත්වයා කියන විස්තරය ඒකේ නැහැ. නාමික කෙනෙක් කියලා මේ විඤ්ඤාණයට බැසගන්න පුළුවන්කමක් නැහැ "කෙනා" කියන හැඟීමට මේ රූපය නැහැ.

රූපය තියන තැන "කෙනා" කියන හැඟීම, පුද්ගලයා කියන, සත්ත්වයා කියන හැඟීම නැහැ. සත්ත්වයා කියන හැඟීම තියෙන තැන මේ රූපය නැහැ. ඒ හින්ද මේ දෙක ම එකට එකතු වෙලා දැනගත්තා කියන එක දැකපු ගමන් ම *අවිජ්ජා නිරොධො සංඛාර නිරොධා, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධා* කියලා කම් විඤ්ඤාණය පිහිටන්නේ නෑ. ඒ කියන්නේ නාමරූප දෙකේ පිහිටනු ලබනවා.

එතකොට අද යම් තාක් ඔබට බාහිර මේ සත්ත්වයින්, පුද්ගලයින්, නෑදෑයින් ඉන්නේ කොහොම ද? අපි උදාහරණයක් හැටියට මෙහෙම ගනිමු. අපෙ 'අම්මා' ගනිමුකෝ: ඔන්න දැන් ඒ රූපය ඇස් ඉදිරිපිටට ආවහම, ඒ රූපයට, රූපය දිහා බලාගෙන දැන් පෙනෙනවා. පෙනෙන තැනක නාමධර්ම ටික වැයවෙලා මට රූපය පෙනෙනවා. මේ 'මගේ අම්මා' නේ කියලා හිතනවා. හිතුවහම ඒ රූපයත්, මේ නාමයත් කියන දෙකේ ම අත්දැකීම් එකට එකතු කරළා මේ හැඩය 'අම්මා' නේ කියලා මට දැනගන්න පුළුවන්.

යම් වෙලාවක දී මේ රූපයට 'මගේ අම්මා' කියලා හිතපු නිසා මේ දැනගත්තා නේ ද කියන එක දන්නේ නැතුවම අහනවා අර රූපය 'අම්මා' ම යි කියන තැනකින් තමයි විඤ්ඤාණය පිහිටන්නෙ. ඔන්න දැන් මට කම් සකස්වෙලා භවය හැදිලා.

යම් වෙලාවක මගේ ඤන දර්ශනය තිබුණොත්, අර පෙනෙන රූපය අරහයා මම "අම්මා" කියලා දැනගත්තා නේ ද, මම "අම්මා" කියලා හිතුවා. ඒ පෙනෙන දේ යි, මේ හිතපු දේ යි දෙක ම

එකතුවෙලා නේ ද මේ "අම්මා", මේ රූ සටහණ, "අම්මා" කියන එක හැදිලා තියෙන්නේ. අම්මා නෑ නෙවෙයි. අම්මා ඉන්නවාත් නෙවෙයි. "අම්මා" කියන එක හැදුනේ කොහොම ද කියන එක බලන්න. අපි ඔක්කෝටම අම්මලා ඉන්නවා නේ. මෙච්චර අම්මා, අම්මා, අම්මා, අම්මා කියලා කතාකරද්දී "අම්මා" කියලා කෙනෙක් නෑ කියලා කිව්වොත් වැරැදි යි.

එතකොට "අම්මා" කියලා කෙනෙක් නෑ කියලා කිව්වොත් මම ලෝකය, ලෝකය කියලා එකක් නැහැ. කම්මස්සකතා සම්මාදිට්ඨිය කියලා එකක් නෑ කියලා ඒ පැත්ත ප්‍රතික්ෂෙප කළා වෙනවා. "අම්මා" ම යි කියලා, රූපය අම්මා ම යි කියලා පිළිගත්තොත්, මම බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරමාර්ථ ශාසනය, පරමාර්ථ දේශනය, නැත්නම් ලෝක නිරෝධය පිළිගන්නේ නැහැ. ලෝකෝත්තර සම්මා දිට්ඨිය පිළිගන්නේ නැහැ වෙනවා. අම්මා ඉන්නවා කිව්වොත් ලෝකෝත්තර සම්මාදිට්ඨිය අතහැරියා වෙනවා. අම්මා නෑ කිව්වොත් කම්මස්සකතා සම්මාදිට්ඨිය අතහැරියා වෙනවා. ඒ නිසා අම්මා ඉන්නවා කියන්නෙත් නෑ, අම්මා නෑ කියන්නෙත් නෑ. අම්මා ***ඉමස්මිං සති ඉදං හොති*** - මෙය ඇති කල්හි මෙය වේ. ***ඉමස්මිං අසති ඉදං න හොති*** - මෙය නැති කල්හි මෙය නො වේ. "අම්මා" වෙන්නේ කොහොම ද, "අම්මා" නො වෙන්නේ කොහොම ද කියලා දන්නවා.

ඒ කියන්නේ පුරාණ කර්මයට විපාක හැටියට රූප පෙනෙන්න ඇහැකු ත්, ඇහැට පෙනෙන රූප හම්බවෙන ධාතුවකුත් හම්බවෙලා තියෙනවා. පඨවි-ආපෝ-තේජෝ-වායෝ කියන සතරමහාධාතුව මත වණ්ණ සටහණක් හැම වේලේ ම පෙනෙන්න පුළුවන් වටපිටාවකුත් හම්බවෙලා තියෙනවා.

ඔන්න රූපයක් හම්බවුණහම ඔය රූපයට රූපයේ ඇත්ත නො දන්නාකම හේතුවෙනවා "අම්මා" කියලා හිතන්න. ඊට පස්සේ

"අම්මා" කියලා රූපයට හිතපු එක, මේ රූපයට "අම්මා" කියලා මම යි හිතුවේ කියපු එක නිසා දැනගත්තහම, රූපයට "අම්මා" කියලා අපි ම හිතපු ඒක නෝ දන්නාකම හේතුවෙනවා විඤ්ඤාණය පිහිටනවා.

ඒ කියන්නේ කබලිංකාර ආහාරය ස්පර්ශ ආහාරයේ ඇත්ත නෝ දන්නාකම හේතුවෙනවා, මනෝසංචේතනා ආහාරයට. මනෝසංචේතනා ආහාරයේ ඇත්ත නෝ දන්නාකම හේතුවෙනවා විඤ්ඤාණ ආහාරයට කියලා ආහාරය අතරත් අවිද්‍යාව ප්‍රත්‍ය වෙනවා.

දැන් අපි මේ රූපය අම්මා වුනේ කොහොම ද කියලා දන්නවා. ඇස් ඉදිරිපිටට රූපය ආවා. මේ මගේ අම්මා නේ කියලා හිතුවා. පෙනෙන රූපය යි, හිතපු එක යි දෙක ම එකතුකරළා මේ අම්මා නේ කියලා දැනගැනීමක් ආවා.

දැන් මේ දැනගැනීම ඇතිවුනේ මෙහෙම යි කියලා සමස්තයක්, එකින් එක අතරමග නවත්වන්න බැරි නම්, අඩුම ගානේ අවිද්‍යාව නිසා කර්මය ඇතිවෙන කොට කර්ම විඤ්ඤාණය ඇතිවුණේ කොහොම ද කියලා දන්නාකම ම කර්මක්ෂය කරගන්න හේතුවෙනවා. ඒක යි පටිච්චසමුප්පාදයේ ඕනෑම තැනකින් ඒක ලිහාගන්න පුළුවන් වෙන්නේ. ඊට පස්සේ නාමරූප කියන, ඒ කියන්නේ කෙනෙක්ව සිහිකරන කොට ඒක ඇතිවුනේ කොහොම ද කියන එක ලිහාගත්තොත්, ලිහාගන්න පුළුවන්.

එතකොට මේ එළියේ තියෙන රූපය "අම්මා". ඒක පුද්ගලයෙක්, කෙනෙක් කියන එක ඇතිවුණේ ඔහොම යි කියලා මම දන්නවා නම් ඒ රූපයට "අම්මා" කියලා හිතනවා. හිතුවහම අම්මා කියලා දැනගන්නවා. මේ අම්මා කියලා දැනගැනිල්ල ඇතිවුණේ බාහිර සතරමහාධාතු රූපයත්, ඒකට "අම්මා" කියලා හිතපුකමත් කියන

මේ කාරණා දෙක ම නිසා යි කියලා දැනගත්තොත්, දැනගත්ත ගමන් ම බාහිර රූපයටවත්, රූපය අරභයා හිතපු නාමධර්ම ටිකටවත් අම්මා කියලා දෘෂ්ඨි වශයෙන් දැකගන්න තැනක් හම්බවෙන්නේ නැහැ යථාර්ථවත්.

ඒකයි අවිද්‍යාව තිබුණොත් විඤ්ඤාණය පිහිටනවා. ඒ "අම්මා" කියලා කියනවා. ඒ අවිද්‍යාව නැතිවුණොත් නැතිවෙනවා.

එතකොට ඔන්න දැන් මට අම්මා කෙනෙක් ඉන්නවා. ඒ අම්මා හදාගත්ත හැටි මම කිව්වා. කොහොම ද? ඇස් ඉදිරිපිටට රූපයක් ආවා. මට රූපය පෙනුනා. මොකද, පුරාණ කර්මයෙන් විපාක හැටියට ඇහැ හම්බවෙලා තිබුණා. ඇහැ උපන්න නිසා රූපයත් පෙනෙනවා. පෙනෙන රූපයට ඉස්සරහින්ම හිටපු කෙනා, මේ "අම්මා" කියලා හිතුවා. කවුරු හිටියත් ඒ කාලයට "අම්මා" කියලා හිතනවා ඉතින් ඒ මට්ටමට. අපි දන්නේ නැහැ, කිරි පෙව්වා ද,වේදනාව ඇතිවෙයි කියලා පහු කාලයේ, සත්පුරුෂකමක්, සත්පුරුෂයෙක් ඇත්තට ම නුවණින් හිතලා ඒක ගන්න එක.

ඒක කම්මස්සකතා සම්මාදිට්ඨිය යි. නමුත් යථාර්ථය ඇත්තට ම අපි දන්නේ නෑ.

එතකොට "අම්මා" කියලා හිතුවා. හිතුවහම ඒ රූපය යි මේ හිත කියන එක යි, දෙක නිසා ඔන්න මට අම්මා හැදුණා. හරි. ඔය දැන් මම "අම්මා" කියන රූපය යි.

අපි කියමු කසුන් මහත්තයා හිටියා. ඔබ තුමාගේ ඇස් ඉදිරිපිටටත්, ඔබ තුමාටත් පෙර අවිද්‍යා කර්මයට රූප පෙනෙන විදියේ ඇහැක් හැදුණා. ඇහැ හැදුණු නිසා ම බාහිර මහාභූත ටිකක් එකතුකරගෙන තියන වර්ණ සටහණක් පෙනෙයි. පෙනෙන කොට ඒ පෙනෙන ටිකට ඔබ තුමා "මේ අහවල් ස්වාමීන්

වහන්සේගේ අම්මා” නේ කියලා හිතයි. ඒ පෙනෙන රූපයත්, “මේ අහවල් ස්වාමීන් වහන්සේගේ අම්මා නේ”කියන නාමධර්මී ටිකත්, දෙක එකට එකතු කරළා දැනගන්නවා මේ අහවල් ස්වාමීන් වහන්සේගේ අම්මා. දැන් මට කෙලින් ම “අම්මා”. ඔබ තුමාට එන කොට “අහවල් ස්වාමීන් වහන්සේගේ අම්මා”.

ඊට පස්සේ මට ආච්චිකෙනෙක් හිටියා නම් එයාටත් මේ රූප තියෙනවා. ඇස් ඉදිරිපිටට මේ රූප එන කොට මේ මගේ දුව කියලා එයා හිතන කොට, ඒ රූපය යි, මගේ දුව කියපු එක යි දෙක එකතු කරළා, එතැනින් දැගන්නවා මේ මගේ දුව කියලා.

තාත්තා හිටියා. තාත්තා. ඒ රූපය පෙනෙන කොට ඒ රූපය තියෙයි. මේ මගේ බිරින්දෑ නේ කියලා හිතයි. ඒ පෙනෙන එක යි, ඒ හිතපු එකයි නිසා ඒකෙන් දැනගන්නවා මේ මගේ බිරින්දෑ නේ කියලා. පුංචි කෙනෙත් හිටියොත් ඒ පෙනෙන රූපය යි මේ මගේ අක්කා කියලා හිතනවා. තමන් හිතපු ටික යි දැනගන්නේ.

දැන් බලන්න හොඳට එක්කෙනෙකුට බිරින්දෑ වෙලා, එක්කෙනෙකුට දුව වෙලා, එක්කෙනෙකුට අක්කා වෙලා, එක්කෙනෙකුට අම්මා වෙලා, එක්කෙනෙකුට අහවල් ස්වාමීන් වහන්සේගේ අම්මා වෙලා.

එක ම රූපය කෙනා කෙනාට, බලන්න ඇස් ඉදිරිපිටට හම්බවෙන රූප ටිකේ ඒකත්වයක් තියෙනවා. ඔක්කෝම හිතේ නෙවෙයි. හැබැයි ඒ රූප අරහයා අපි කෙනා කෙනා හසුරවාපු මානසික මට්ටම් වෙනස්. ඒ ඒ වෙනස් වෙනස් හසුරවාපු මානසික මට්ටම මත යි දැනගැනීම. ලෝකය කියලා කියන්නේ අවිද්‍යාවඇතුළේ මේ රූපය අම්මා කියන දැනගැනීම ඇතිවුනේ මෙහෙම යි නේ ද කියලා මම දන්නේ නැති හින්දා හිතේ තියෙන ගති ටිකත් අර දැනගැනිල්ලත් දැනගත්ත අත්දැකීම, අර “අම්මා” කියලා

දැනගත්තකම එහෙම ම *ඔක්කන්ති නාමරූපං* කියන්නේ දැනගත්තේ මේ රූපය යි කියලා කෙලින් ම දැනගත්තේ මෙන්න මෙයාව යි කියලා බාහිර රූපයට ම "අම්මා" කියලා දැනගැනීම ත්, දැනගත්තකම ත් බාහිර රූපයට ම දමලා රූපය තුළින් මම අම්මා කෙනෙකු ජීවත්කරගන්නවා.

කසුන් පුතා කියන තැනත්, ඔතැනත් අවිද්‍යාව නිසා යි. පෙනෙන රූපයට හාමුදුරුවන්ගේ අම්මා කියලා හිතලා මෙහෙම නේ ද දැනගත්තේ කියන එක දන්නේ නැති නිසා, හාමුදුරුවන්ගේ අම්මා කියන දැනගැනීම බාහිරයට ම අයිති සිද්ධියක්. දැන් ඔය සිද්ධාන්තය ම, මම ම මයි. හැබැයි බාහිරයට අයිති එකක් ය කියන හැඟීමක් එනවා අනුශය වෙනවා එහෙම කියලා ඔබගේ මනෝමයෙන් ඇතිකරගත්ත විඤ්ඤාණය බාහිරයට අයිති නැහැ. නමුත් මේ *විඤ්ඤාණ පච්චයා නාමරූපං* කියන්නේ මේ සිතෙන් අර නාමරූප ටිකට බැසගන්නවා. එතකොට ඒ කියන්නේ බාහිරයෙන් හම්බවෙනවා.

ඊට පස්සේ මේ රූපයට "දුව" යි කියලා හිතුවහම එතැනත් අවිද්‍යා නමැති කෝෂය ඇතුළේ තියෙන්නේ. එයාටත් මේ දුව කියලා දැනගැනිල්ලඇතිවුනේමෙහෙමයිකියලාදන්නේ නැතිවුණහමබාහිර ලෝකය. මේ රූපයට "අක්කා නේ" කියලා හිතුවහම අක්කේ කියලා හිතුව දැනගැනිල්ල ඇතිවුනේ මෙහෙම නේ ද කියලා දන්නේ නැතිවුණහම බාහිර.

දැන් ලෝකය හැදිලා. මට මගේ අම්මාව බාහිරෙන් සිහිකරන්න පුළුවන් වෙන කොට ම ඔබට ස්වාමීන් වහන්සේගේ අම්මාත් බාහිරෙන් සිහිකරන්න පුළුවන්. ආච්චිට දුවව සිහිකරන්න පුළුවන්. නංගිට අක්කාව සිහිකරන්න පුළුවන්.

දැන් අපි ඔක්කෝම බාහිර කර්මයටහටගත්තතවනාමරූප දෙකක් තියෙන තැනක සිහිකරන කොට ඒ නාමරූප දෙක විපරිණාම වෙන කොට, වෙනස් වෙන කොට - නාමරූප දෙක කිව්වාට අපට තියෙන්නේ රූපය විතර යි. අපට රූපය නියෝජනය වෙලා අප තුළ කෙලේසයක් හදාගත්තාට, එතැන රූපය පැවැත්මටඋපකාරවෙනසිද්ධාන්තයක්තියනවා.ඒකවෙන ගානේ අප හදාගත්ත ලෝකයෙන් අපට පෙනෙන්නේ අහවලාට මෙහෙම වුණා මෙහම වුණා කියලා යි.

ඉතින් එතැන දී මට ඔය ඇත්තන්ට පෙන්නන්න තියෙන දේ තමයි අද දවසේ දී සවිඤ්ඤාණක, අවිඤ්ඤාණක, ඒ කියන්නේ විඤ්ඤාණය සහිත වූ හා විඤ්ඤාණය රහිත, නැති ඒවා. යම්තාක් දෙයක් ගැන ඔබට දැනුමක් ඇතිවෙලා තියේ නම්, ඒ දැනුම ඔන්න ඔය වාගෙයි. හැබැයි කරුණක් මතක තබා ගන්නට ඕනේ. මම මේ මතක් කළා වගේ හැම තැනක දී ම ප්‍රඥප්ති මාත්‍රයක් ම, අම්මා-නංගී-අයියා කියලා ප්‍රඥප්ති මාත්‍රයක් ම ඕන නැහැ. ***අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති.***

එහි බැසගෙන සිටියාට, අපි කියමු ඇහැට රූපයක් පෙනෙනවා. පෙනෙන රූපයට හොඳට නැඹුරුවෙලා බලනවා කියන්නකො. දැන් මේ රූපයට නැඹුරුවෙලා බලනකම ම තමයි මේ වෙලාවේ දි ඔබගේ හිතේ තියෙන නාමධර්මය. අර රූපය යි ඒකට නැඹුරුවෙච්චකමයි කියන මේ දෙක හින්දා මේ අරමුණ බලපු සිද්ධිය එවාගේතැනකින්ඔබටපෙනෙනවා.එතකොට ඔබට තේරෙන්නේ මොකක් ද? බලපු සිද්ධිය ඒ වාගෙයි. දැන් ඔබ හිතේ තියෙන නාමධර්ම ටික හොඳට කරකවලා, යොමුකරළා රූපයට හරවනවා නේ. එතකොට දැන් ඒ රූපය දිහා බලන්න හදපු ගතිය තමයි අර මම අම්මා කියලා කිව්වා වගේ රූපය දිහා බලන්න හදපුකම තමයි මෙතැන දී මනසෙන් ඒක බලන්න හදපු ගතිය යි,

පෙනෙන දෙකයි එකට එකතු කරලා ගත්තහම බලන රූපය බාහිරේ වාගේ ඔබටතේරෙයි.

ඒ වාගේ ඉතා ම සියුම් තැනකට යනකම් යනවා මේක. එතකොට රූපයක් පෙනෙනවා. පෙනෙන දේට තමන්ගේ මනස තුළ අකැමැත්තක් ඇතිවෙනවා. පෙනෙන රූපය යි, මනසේ අකැමැත්ත යි දෙක එකතු කරළා තමන්ව අකැමැති රූපයක් හැටියට මනෝවිඤ්ඤාණයෙන් නිදහස් වෙනවා.

ඔන්න ඔය විදියට යි අපේ ලෝකය හැදුණේ. ඒ කියන්නේ අවිද්‍යාව හේතු වුනා සංඛාරයට, මනෝ සඤ්චේතනා ආහාරයට කියලා කියන්නේ, පෙනෙනවා කියන අවස්ථාව ස්පර්ශ ආහාර, කබලිංකාර ආහාර, ඵස්ස ආහාර කියන දෙක දකින්න රූප පෙනෙනවා කියන අවස්ථාවට. ඒකට පුද්ගලයෙක් හැටියට, කෙනෙක් හැටියට හිතනවා. නැතිනම් කැමැත්තෙන් හිත නැඹුරු කරත්, අකැමැත්තෙන් හිත නැඹුරු කරත්, කැමැත්තක් අකැමැත්තක් නැහැ. ඒ පෙනෙන දේ බලන්න හිත නැඹුරු කරනවා. මේ ද සංඛාර මේ මට්ටම මනෝසඤ්චේතනා ආහාරය හැටියට ගන්නවා. ඒ යම් යම් ආකාරයකට ද, සංඛාරය චිත්ත සම්පයුක්ත යි කියන කොටසක් අපි ධර්මයේ කියන්නේ.

මේ හිතනකම, මේ සංඛාරය, හැම වෙලාවේ ම කෙනෙක් කියලා හිතනකම, කැමැත්තක් ඇතිකරගන්නාකම, අකැමැත්තක් ඇතිකරගන්නාකම, කෙනෙක්-කැමැත්තක්-අකැමැත්ත ඕවා මොකුත් නැහැ. නමුත් බලන්න උත්සාහවත් වෙනවා. දැන් මේ වෙලාවේ චේතනාව බලන්න උත්සාහවත් වෙනවා කියනවා. බලන්න උත්සාහවත් වෙනවා කියන ගතිය අර පෙනෙන සිද්ධිය නෙවෙයි. පෙනෙන සිද්ධිය බලන්න උත්සාහවත් වෙනවා කියන කොට දැන් මම අම්මා කියලා හිතන්න උත්සාහවත්වීමයි, මේ බලන්න උත්සාහවත්වීමයි දෙක එකක්. එච්චර සසංඛාර යි, එච්චර

ගැඹුරු යි ඒ බලන්න උත්සාහවත් වෙනවා කියන කම. ගත්තහම මේ ටික මනෝසඤ්චේතනා ආහාර යි.

ඒ නිසා කෙනෙක් කියලා නම් හිතුවේ, ඒ රූපය කෙනෙක් කියලා දැනගන්න. ඒ රූපයට කැමැත්ත නම් හිතුවේ ඒ රූපය හොඳ දෙයක් කියලා හිතාගන්න. අකැමැත්තකින් නම් හිතුවේ පෙනෙන රූපය අකැමැත්තකින් නම් හිතුවේ රූපයට හොඳ නැති දෙයක් කියලා දකින්නේ. නරක දෙයක් හැටියට සලකන්න. ඔය ඇත්තන්ට අසභ්‍ය රූප පෙනෙන්නේ, සභ්‍ය රූප පෙනෙන්නේ, අසභ්‍ය වචන ඇහෙන්නේ, සභ්‍ය වචන ඇහෙන්නේ එහෙම යි දැනගන්න. හොඳ අය, නරක අය ඔය ඇත්තන්ට හම්බවෙලා තියෙන්නේ, නිර්මාණය වෙලා තියෙන්නේ ඔහොම යි.

කිසිම වෙලාවක පඨවි-ආපෝ-තේජෝ-වායෝ කියන මහාභූත ටිකේවත්, වණ්ණ සටහනේවත්, හොඳ සහ නරක කියලා බෙදන්න පුළුවන්කමක් නැහැ. කුසල හා අකුසල කියලා බෙදන්න පුළුවන්කමක් නැහැ. යථාර්ථය ගත්තහම හොඳ සහ නරක කියන දෙකෙන් ම අතහැරිලා තියෙන්නේ. එතකොට හොඳ දෙයක් කියලා ඒ රූපය දැනගන්නවා. නරක දෙයක් කියලා දැනගන්නවා. එහෙම නැතිනම් බලන්න හදපුකම එකතුකරළා පෙනුන දේ පෙනෙන දේ කියලා දන්නවා. එතකොට පෙනෙන රූපය යි, පෙනෙන දේ බලන්න හදපුකම යි දෙක එකට එකතුකෙරුවහම තමන් බලපු දේ තියෙනවා වාගේ තේරෙයි.

අන්න ඒ විදියට තමන්ට බාහිර දැකපු දේවල් තියෙනවා, හොඳ අය ඉන්නවා, නරක අය ඉන්නවා. නැතිනම් නෑදෑකමෙන්,ප්‍රඥප්තියෙන් සිහිකරන්න පුළුවන්කම තියෙනවා කියන මට්ටමේ අරමුණු ඇතිකමක් තමන් තුළ හැදිලා එහෙමයි කියලා ඔබ දන්නේ නැතිවුණහම ඔය විඤ්ඤාණය නැවත විපාක-නාමරූප දෙකට ආහාර ප්‍රත්‍යයෙන් ආහාර වෙනවා. මේ විඤ්ඤාණ

ආහාරය කුමකට ආහාර ද? විපාක-නාමරූප දෙකට ආපහු ආහාර යි. ආයෙත් නාමරූප දෙක නිසා කබලිංකාර ආහාරය වෙනවා. කබලිංකාර ආහාරය නිසා ස්පර්ශ ආහාරය වෙනවා. ස්පර්ශ ආහාරය නිසා වේදනා-සංඥා ඇතිවෙනවා. වේදනා-සංඥාවන්ට හිතනවා. හිතනවා කියන්නේ මනෝසංචේතනා යි. ආයෙත් මනෝ සංචේතනාආහාර නිසා ආයෙත් මේ විඤ්ඤාණ ආහාරය යි. මේක චක්‍රයක්.

යම් වෙලාවක ඔබට *නාමරූප පච්චයා විඤ්ඤාණං* - මේ නාමරූප දෙක නිසා දැනගත්තා කියලා දැනගත්තොත්, රූපය දැනගත්ත හැකි යි ඔබට ආහාර ප්‍රත්‍යයෙන්. මනොසඤ්චේතනා ආහාරය දැනගත හැකියි මේ ස්පර්ශ ප්‍රත්‍යයෙන්. ස්පර්ශය නිසා හටගත්ත වේදනා-සංඥාවන්ට යි හිතුවේ විඤ්ඤාණ ආහාරය දැනගත්ත හැකි යි. අර රූපය යි, මේ නාමය යි, මේ හිතපු එක යි, මේ නාමරූප දෙක නිසයි දැනගත්තේ කියලා යම් වෙලාවක දැනගන්නා කම, විඤ්ඤාණය කියන්නේ දැනගන්නවා කියන එක යි. මේ රූපය අම්මා කියලා දැනගැනිල්ල ඇතිවුනේ කොහොම ද, කියලා දැනගත්තොත්, රූපය අම්මා කියලා උපාදන කරන ගතිය නෑ. නාමය අම්මා කියලා උපාදන කරන ගතිය නෑ. ඇයි? රූපය අම්මා කියලා දැනගැනිල්ලක් තියෙයි. නැත්තේ නෑ. ඒ අම්මා කියන දැනගැනිල්ල ඇතිවුණේ මෙහෙම යි කියන එක දැන්දන්නවා.

ඒ නිසා අම්මා නෑ කියන්නේ නෑ. මේ රූපයට අම්මා කියලා හිතුවහම ඒ රූපයත්, නාමයත් දෙක එකට එකතු කරළා අම්මා කියලා දැනගැනිල්ලක් ඇතිවෙනවා. ඒක නො දන්නා කොට මේ රූපය ම අම්මා, නැතිනම් නාමය ම අම්මා, නැතිනම් නාමරූප දෙක අම්මා කියලා හිතාගෙන ඉන්නවා. මෙහෙම ලෝකයේ අම්මා කෙනෙක් හැදෙනවා කියලා දන්නා හින්දා නේ ඔය කියන්නේ.

නමුත් මේ නාමරූප දෙක නිසා මේ දැනගැනිල්ල ඇතිවුණා කියලා දන්න කොට, දකින කොට නාමරූප දෙක මේ විඤ්ඤාණයේ පිහිටලා නෑ. මත්තේ කම් රැස්වෙන්න ඉඩ නැහැ කියලා එයා දන්නවා. ඒ කියන්නේ විඤ්ඤාණය ඉඩ නැහැ කියන්නේ හරියට ඔය ඇත්තන් දැක්කොත්, අපි ඔය ටික හරියට දැක්කොත් අම්මා, තාත්තා, නෑදෑයෝ කියන ප්‍රඥප්ති වශයෙන් හෝ කැමැත්තෙන් හෝ, අකැමැත්තෙන් හෝ බලපු, අහපු කියන කිසි ම අරමුණු ටිකක් රූපය පැත්තේ තියෙනවා කියලා සිහිකරන්න බැහැ අපට. ඇයි? රූප ටිකට සිතේ ඇතිවෙච්චි ගති ටිකක් මේ දෙක ම එකතු කරළා දැනගත්තේ කියලා කියන කාරණාව තියෙනවා.

ඔන්න ඔය ටික මම පෙන්නන්නේ මේ අපි ඔක්කෝම කතාකරපු දර්ශන වලින් එක එක පැතිවලින්. ඒ කියන්නේ සතර ආහාරය තියෙන්නේ කියන තැනක, සමාහිත ස්වාමීන් වහන්සේ ත් කතා කළේ පෙනෙන දේ ඉඳලා ඔය දැනගැනිල්ල ඇතිවන තැන දක්වා යි. ඒ කියන්නේ මෙතැන මනෝ විඤ්ඤාණ මට්ටමට එනකල් මවිපාක, මනෝසඤ්චේතනා ආහාරයත් විපාක, විඤ්ඤාණයත් විපාක යි. අවිද්‍යාව ප්‍රත්‍ය වෙච්චි ගමන් ම මනෝසඤ්චේතනා ආහාරයත් ඒ විඤ්ඤාණයත් දෙක ම කම් වෙනවා අවිද්‍යා ප්‍රත්‍ය යි. එහෙම නැතිවුනොත් කම් ක්ෂය යි. කම් විඤ්ඤාණය පිහිටන්නේ නැහැ. පේනවා.

අපේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ විපාක නාමරූප දෙකක් තියෙන්නේ කියලා ඔය ඇත්තන්ට ඉගැන්වූවෙත් ඒ ස්කන්ධ ටිකේ සුඤ්ඤතාවය ඉගැන්වූවේ ම, උගන්නන්නේ ම ඒ එබඳු සුඤ්ඤතාවයක් තියෙන තැනක අප තුළ ඇති චේතනා නානත්වය මතයි, විඤ්ඤාණයාගේ දැනගැනීමේ නානත්වය ඇතිවෙලා තියෙන්නේ. හැබැයි ඒ චේතනාව, ඒ දැනගැනීම, කම්ය බවට පත්වුනේ අවිද්‍යාව නිසා යි. මොකක් ද? ධාතු නානත්වයක් තියෙන

තැනක චේතනා නානත්වය නිසා යි මේ දැනගැනීමේ නානත්වයක් තියෙන්නේ කියන කාරණාව නො දන්නාකම යි.

ඒකයි මතක් කළේ අපි කෙටියෙන් ගත්තොත් රූපයක් තියෙන තැනක, එතකොට රූපයක් පෙනෙනවා කියන තැනක දකින්න, ශබ්දයක් ඇහෙනවා කියන තැනක දකින්න ආහාර දෙකක්: කබලිංකාර ආහාරය යි, ස්පර්ශ ආහාරය යි. ඒ අරභයා කෙනෙක් කියලා හෝ, පුද්ගලයෙක් කියලා හෝ සත්ත්වයෙක් කියලා හෝ, කැමැත්තෙන් හෝ, අකැමැත්තෙන් හෝ හිතෙනකම මනෝසංචේතනා ආහාරයයි. එහෙම නැතිනම් බලන්න උත්සාහවත් වෙනකම *අජ්ඣොසාය තිට්ඨති*. අහන්න උත්සාහවත් වෙනකම නැතිනම් පෙනෙන පැත්තට නැඹුරුවෙලා ඉන්නකම, අහන පැත්තට නැඹුරුවෙලා ඉන්නකම මනෝසංචේතනා ආහාරය යි.

මම අම්මා, තාත්තා කියලා හිතුවත් එක යි. පෙනෙන දේට කකුළුවා ඇතිලියට දැම්මා වාගේ බලාගෙන ඉන්නකමත් එක යි. පෙනෙන දේට බලනවා. බලන්නේ දෙකක් නේ. පෙනෙන දේ බලනවා. පෙනෙනවා කියන සිද්ධාන්තය වෙනම එකක්. බලනවා කියනකම තමයි දැන් මනෝසඤ්චේතනා ආහාරය.

එතකොට ඒ පෙනෙන දේ ත්, පෙනෙන දේට හිතපු දේ ත්, නිසා විඤ්ඤාණය කියන කොට කබලිංකාර ආහාර, ස්පර්ශ ආහාර, මනෝසඤ්චේතනා ආහාර කියන කාරණා නිසා විඤ්ඤාණ ආහාරය ත් පෙනෙයි.

දැන් ඔබට ආහාරය නිරෝධ කරනවාද, ආහාරය නැවත විපාක-නාමරූප දෙකකට ආහාර ප්‍රත්‍යය කරගන්නවා ද කියන එක හිතන්න පුළුවන්. කර්ම කරගන්නවා ද කියන එක හිතන්න පුළුවන්. ඒක වෙන්නේ කොහොම ද? ආහාරයේ ඇතිවීම නැතිවීම දැක්කේ

නැතිනම්. තව පැත්තකින් ස්කන්ධයන්ගේ උදය-වැය දැක්කේ නෑ කියන එක කියන්නේත් ඔකට ම යි. ස්කන්ධයන්ගේ උදය වැය දැක්කේ නෑ කියන එකෙන් කියන්නේ ආහාරයේ ඇතිවීම-නැතිවීම දැක්කේ නෑ කියන එක ම යි.

එතැන දී තමයි ඔබට *නාමරූප පච්චයා විඤ්ඤාණං* කියලා අපි විඤ්ඤාණයේ උදය-වැය, නැතිනම් විඤ්ඤාණ ආහාරය ඇතිවෙච්චි හැටි විඤ්ඤාණ ආහාරය ඇතිවුණු නාමරූප ප්‍රත්‍යය නිසා මේ විඤ්ඤාණ ආහාරය ඇතිවෙනවා, කියන කොට ඒ වචනවලට සීමාවෙන්න එපා. *නාමරූප පච්චයා* කියන කොට නාම කියන කොට මෙතැන දී ඒ විජානන ලක්ෂණය නැතිනම් දැනගැනීමට හේතුවන ඇඟවීම නාමධර්ම යි. ඒ නාමධර්ම පතිතවෙච්චි රූපය. රූපය අරභයා මේ ඉදිරියෙන් තියෙන පෙනෙන රූපයට මට මෙතැන ඉඳන් හිතන්න පුළුවන් බිත්තිය කියලා. රූපය වෙනම. මම බිත්තිය කියලා හිතනවා. හිතපු ගමන් ම බිත්තිය කියලා දැනගන්නවා. මට මේ බිත්තිය කියලා දැනගැනිල්ල ඇතිවුණේ පෙනෙන දේ ත්, රූපය ත් දෙක එකට එකතුවෙලා යි.

දැන් අපි පොඩ්ඩක් බලන්න කෝ එක ම වස්තුවක් පෙනෙන කොට සමාන යි. නමුත්, සිංහළ, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ඉතාලි වගේ භාෂා කිහිපයක් කතා කරන එක්කෙනෙකුට එක වස්තුවක්, කෝප්පයක් ගන්න. මේ කෝප්පය පෙනුනොත් මට ඕක දකින කොට කෝප්පය කියලා දැනගනියි. දැන් මට මේ දැනගැනිල්ල එන්නේ මුලින් ම ඔය රූපයට "කෝප්පය" කියලා හිතුවහම ඒ රූපය යි, මෙහෙම හිතපු එකයි, මේ දෙක නිසා දැනගත්තහම මේ රූපය කෝප්පය කියන දැනගැනිල්ල ඇතිවුණේ මෙහෙම නේද කියලා දන්නේ නැතිකම නිසා, මේ දැනගැනිල්ල අර රූපයට ගැටගහලා අර රූපය කෝප්පය, කෝප්පය, කෝප්පය, කෝප්පය කියලා අවිද්‍යාව නිසයි මට දැන් ආශ්‍රව. ඒ නිසා තමයි, ඒ හුරුව

තමයි මට දැන් "කෝප්පය" කියලා එන්නේ. හැබැයි හුරුවට හේතුවක් වුණා අවිද්‍යාව. ඇස් ඉදිරිපිටට ආවේ සතුමහාධාතු රූපය යි. වණී සටහණ යි. ඒකට කෝප්පය කියලා හිතුවා. මේ හිතපුකම යි අර රූපය යි දෙක එකට එකතු කරළා නේ ද මේ කෝප්පය කියලා දැනගැනිල්ල තිබුණේ,කියලා *නාමරූප පච්චයා විඤ්ඤාණං*. දැනගන්නවා කියන එක සිංහල. *විඤ්ඤාණං* කියන්නේ දැනගත්තා කියන එක යි. මේ නාමය යි රූපය යි දෙක නිසායි දැනගත්තේ කියන එක දන්නේ නැතිකම යි. ඒ දන්නේ නැතිකම හේතුවුණා, විඤ්ඤාණය නිසා නාමරූප වෙන්න. මේ දැනගත්ත දේ නැවත නාමරූපදෙකටබැසගන්නවා.

ඒ කියන්නේ තව පැත්තකින් ගත්තහම අර රූපය කෝප්පය යි කියලා හිතුවා දැන්. දැන් හිතේ තියෙන දේ පැත්තකට දලා හිතේ තියෙන එකත් එක්ක ම තමයි අර රූපය කෝප්පය යි කියලා හිතුවා.

ඊට පස්සේ අපි ම රැවටුණා ඒක කෝප්පය කියලා හිතලා, හිතලා, හිතලා, හිතලා දැන් දැකපු ගමන් ම අපට හුරුවෙනවා. දැන් ඕකට කියන්නේ ආසවවලටහේතුවඅවිද්‍යාවකියලා යි.

ඊගාවට වෙන භාෂාවකින් කතා කරන කෙනෙක්, ඉංග්‍රීසියෙන් ගත්තොත්, එයාට "කප්" කියලා සිහිවෙයි. එයත් ඇස් ඉදිරිපිටට ඔය එන එකට "කප්" කියලා හිතුවහම මේ ඔක්කෝම අවිද්‍යාව නමැති ධර්මතාවය ඇතුළේ එකක්. පෙනෙන රූපයට තමන් ම හිතපු දේ දැනගත්තා නේ ද කියලා දන්නේ නැතිවුණහම එයත් "ආ කප් කියන්නේ මේකට" යි කියලා ඔන්න බාහිර රූපයට ඒක තබලා හුරුවුණහම ඉබේ ම එයාට "කප්" කියලා කියවෙයි.

දැන් බලන්න එක ම වස්තුව අරහයා කෙනා කෙනාට එක එක විදියේ දැනගැනීම් තියෙන්නේ කොහොම ද? තමන් තමන්ගේ

සිතේ ඇති නාමධර්ම ටික එකතුවෙච්චි නිසා ම නේ ද කියන එක තේරෙනවා නේ ද? එක ම විදියේ රූපයක් පෙනෙද්දී දැනුම් පරාසය වෙනස් වුණේ,කෙනා කෙනාගේ වෙනස් වෙන්න හේතුවුණේ කෙනා කෙනා තුළ ඒ රූපය අරභයා හිත මෙහෙයවාපු ආකාරයේ වෙනස්කම මත යි.

ඊට පස්සේ හැම සංයෝජනයක් ම තියෙන්නේ ත් ඔය මත යි කියන එක දැනගන්න.

ලස්සන කාන්තාවක් ඉඳි යි. මම ඇස් ඉදිරිපිටට එන කොට මගේ "නංගී" කියලා බලනවා. "නංගී" කියලා බලන හින්ද, ඒ රූපයත්, මේ නාමධර්ම ත් දෙක දැනගත්තහම මේ නංගී කියලා දැනගන්නවා. හැබැයි ඒ දැනගන්නා ආකාරයට අවිද්යාවඇතුළේවුනත්කෙලෙස්අඩුයි.

තව කෙනෙක් "දුවේ" කියලා බලන්න පුළුවන්. කෙලෙස් අඩු යි. "යාලුවා" කියලා බලන්න පුළුවන්. තව කෙනෙක් "ලස්සන ගෑණු ළමයෙන් නේ" කියලා බලන්න පුළුවන්. රාගය ඇතිවෙන විදියට හිත හසුරුවන්න ත් පුළුවන්.

එතකොට මේ විදියට රූපය අරභයා සිත හසුරුවන ආකාරය මත යි, මනස මෙහෙයවන ආකාරය මත යි, බැමි ලෙහෙනවා ද, බැඳෙනවා ද කියන එක තියෙන්නේ.

මනෝ පුබ්බඞ්ගමා ධම්මා, මනෝ සෙට්ඨා මනොමයා
මනසා චේ පදුට්ඨේන භාසති වා කරොති වා -
මනසා චේ පසන්නෙන භාසති වා කරොති වා

කියලා බුදුරජාණන් වහන්සේ මනස සියලු ධර්මයන්ට පෙරටුව ගමන් කරනවා සිතිවිලි උපදවන්නා ද වෙනවා. කරන්නා ද වෙනවා. යමෙක් දුෂ්ඨ වූ සිතින් සිතීම්-කීම්-කිරීම් කළොත්,

ප්‍රසන්න වූ සිතින් සිතීම්-කීම්-කිරීම් කළොත් කියලා දෙකට බෙදනවා නේ. ඒ බෙදන එකට පෙන්නනවා. මොකක් ද? මනස මුල් කාරණාව වෙනවා කියලා. මනස මුල් කාරණාව වෙනවා. රූප-ශබ්ද-ගන්ධ-රස-පොටඨබ්බ තමයි ඒකට ආරම්මණ. ඉතින් එතැන දී ලෝකය කියලා කියන්නේ හොඳට නරකට දෙකට හිතලා, නරක දේවල් හිතන්නේ නැතුව හොඳ දේවල් හිතලා බලන්න කියන එක යි. නමුත් යථාර්ථය කියලා කියන්නේ හොඳට හිතලා දැනගත්තා, නරකට හිතලා දැනගත්තා, කියන තැනක වුණේ මොකක් ද කියලා බලන්න. එච්චර යි. ඔබ හොඳට හිතුවා කියන තැනක ද, නරකට හිතුවා කියන තැනක ද යම් දැනගැනිල්ලක් ඇතිවුණා නම් ඒ දැනගැනිල්ල ඇතිවෙන්නේ කොහොම ද කියන එක බලන්න. එතැන ම තියෙන හොඳ නරක දෙකෙන් අවුල අතහැරෙනවා.

හොඳ නරක දෙක ම අවිද්‍යාව පැත්තේ. හොඳට කියලා හිතුවහම හොඳ දේ පවතිනවා. නරක දේ හිතුවහම නරක දේ පවතිනවා.

හරි දැන් මේ ඔන්න ඔය වාගේ ධර්මතාවයක් තමන් තුළ තියෙනවා කියන එක පෙන්නන්න තමයි, මේ හැම දේශනාවක ම විපාක ධර්මතා ටික, ශූන්‍යතාවය ඔබට පෙන්නන්නේ. විපාක ධර්මතාවයක් පුරාණ කර්මයෙන් හටගත්තේ, සතර ආහාර යි කිය කියා මේ පය ගහලා පෙන්නන්නේ නැවත නැවත, ඒ ටිකේ ශූන්‍යතාවය තිබුණොත් තමයි ලෝකයක් නිර්මාණය වෙන විදියට සිතීම්-කීම්-කිරීම් කළේ තමන් ම යි. තමන් සිතපු ටික යි, බාහිර අරමුණු ටිකයි දෙක එකට කරළා දැනගත්තු එක යි මේ විඤ්ඤාණයේ මායාව කියලා, විඤ්ඤාණය නැතිනම් දැනගැනිල්ල, නැතිනම් මේ මායාකරයා හැදුනේ මෙහෙම යි කියලා දැනගත්තොත් තමයි ඔබ යම් දවසකදී හරි "එහෙනම් මම දැනගත්ත දේ බාහිර තියෙනවා, ඉන්නවා කියලා දකින එක වැරැදි යි නේ ද? එහෙනම් මේක ගෙවාගන්න උත්සාහවත් වෙන්න ඕන. මේ වැරැද්ද තියෙන තාක්

සුවපත් වෙන්න බැහැ. දුකෙන් නිදහස් වෙන්න බැහැ. මේ වැරැද්ද තියෙන්නේ නැවත දුක්වූ රූපය හැදෙන විදියට යි".

ඒ කියන්නේ වෙන මොකුත් නෙවෙයි. ඔබට ඔය වැරැද්ද තිබුණොත් දුකෙන් එතෙරවෙන්න බැහැ කියන්නේ. ඔය විදියට තිබුණහම අම්මා-තාත්තා-අය්යා-අක්කා-දුව-පුතා රන්-රිදී-මුතු-මැණික් වටිනා නොවටිනා ලෝකයක් හදනවා. බලන්න, ඇස් ඉදිරිපිටට රූපයක් එනවා. "මේක ඩොලර් මිලියන ගණනක් වටිනවා නේද" කියලා හිතුවා. පෙනෙන දේ යි, වටිනාකමට හිතපු එක තමයි, දැන් ඔය හිත හසුරුවනකම චේතනාව. පෙනෙන දේ යි, චේතනාවයි දෙක මුල්කරගෙන දැනගත්තහම ඔබට කීයටවත් ඒ අවස්ථාවේ සිහිය එන්නේ නැහැ. පෙනෙන දේට වටිනාකමක් කියලා මේ නාමරූප දෙක නිසා දැනගත්තා නේ ද. තමන් තුළ දකිනා මේ පෙනෙන දේට වටිනාකමක් දීලා දැනගන්නකමක් ඇතිවුණා කියලා ඔබට කිසි වෙලාවක පෙනෙන්නේ නැහැ.

ඊට පස්සේ කෙලින් ම ඔබට පෙනෙන්නේ, මේ විඤ්ඤාණය මායාවක් කියන්නේ, ඒ රූපය වටිනවා ම යි කියලා යි. ඊට පසුව වටිනා රූපය ඔබ රකින්න යයි. රකින්න ගියහම, ආරක්ෂා කරන්න ගියහම දඬු මුගුරු ගන්න වෙයි. දඬු මුගුරු ගන්න ගියහම කළහ කෝලාහල, හා හූ කියන නපුරු වචන.

ඕකට හොඳ කාරණාවක් තියෙනවා. **නව ආකාර තෘෂ්ණා මූලික** ධර්ම කියලා කොටසක් තියෙනවා. අන්න ඒ ටික බලන්න. බුදුරජාණන් වහන්සේ හොඳට පෙන්නනවා තෘෂ්ණාව නිසා මේ ලෝකයේ දඬු මුගුරු ගන්න තැන දක්වා.

ඒ විතරක් නෙවෙයි, නැතිවුණහම අඬන්න වැලැපෙන්න දේවල්, රකින්න ආරක්ෂා කරන්න දේවල්, ඔබට හැදිලා තියෙන්නේ, ඉතුරුවෙලා තියෙන්නේ ඔන්න ඔය නිසා යි.

ඉතින් ඒ හැම ධර්ම දේශනාවකින්ම කියලා දෙන්න ඔය ඇත්තන්ට බාහිර ලෝකයේ ශූන්‍යතාවය යි. ඒකෙන් කියලා දෙනවා එක දෙයක්: එබඳු ශූන්‍යතාවයක් තියෙන තැනක කැමැත්ත අකැමැත්ත වටිනා නොා වටිනාකමට තමන් මනසෙන් කොටසක් පුරවලා මේ නාමය යි, මේ රූපය යි කියනදෙකයිදැනගන්නෙ.මෙන්න මේ නාමරූප නිසා විඤ්ඤාණය වුණා කියලා දැනගත්තකම මඔබටවිමුක්තියවෙනවා.

ඔබ මිදුනේ මොකෙන් ද? හැම වටිනා දෙයින් ම සහ හැම නොා වටිනා දෙයින් ම. හැම වටිනා දෙයින් ම හැම නොා වටිනා දෙයින් ම මිදුණහම ඔබේ ඒ විමුක්තිය නැතිවෙන්න තැනක් නැහැ. ඔබට දුකක් එන්න තැනක් නැහැ. සැපක් එන්න තැනකුත් නැහැ. සැපක් තිබුනොත් ඒක නැතිවෙන නිසා, දුකක් තිබුනොත් දුකක් ම නිසා, ඒ දුක යි සැපයි දෙකෙන් ම එතෙරවීම ම සැප ක්.

එතැන සැප සහ දුක කියන එක තව බෙදනවා. ලාභය, යසස, ප්‍රශංසාවය, සැපය කියලා. සැපය කියන එක වර්ග කළා. අළාභය, අයස, නින්දාව, දුක කියලා දුක කියන එක කොටස් හතරකට ත්, සැප දුක්, හොඳ නරක කියන දෙක හතර හතර දෙපැත්තට බෙදනවා. ඕකට කියනවා අට ලෝ දහම කියලා. ඔබට හොඳ සහ නරක තියෙනවා නම් මේ ධර්මතා අතර තියෙයි. ඔබට යම් කලෙක හොඳ සහ නරක කියන දෙක නැතිනම් මේ ධර්මතා අට, අටලෝදහම තමයි නැත්තේ. *ඵුට්ඨස්ස ලොක ධම්මෙහි චිත්තං යස්ස න කම්පති* - ලෝක ධර්මතා අටෙන් ස්පර්ශ කරන ලද මනසට මොකුත් කම්පා නොා වීමක් කියලා කියන්නේ. ලෝකයාට ලාභ-අලාභ-යස-අයස-නින්ද-ප්‍රශංසා-සැප-දුක් කියන ධර්මතා ලැබෙන තැනක ත්, ලැබෙද්දි ත් කම්පා නොා වන යථාභූත ඥානය කෙනෙකුට තියෙනවා නම්, අන්න ඒක මංගල කාරණාවක්. ඒක හදාගන්න වෙන්නේ කවදාම හරි දවසක මෙන්න මේ වගේ අවබෝධයකින් ම යි.

ඒ සඳහා යි ඔබට ස්කන්ධ-ධාතු-ආයතන-ඉන්ද්‍රිය-පටිච්චසමුප්පාද ඕවා කියවන්න කියන්නේ ම ඔය ස්කන්ධ ටිකේ සුඤ්ඤතාවය පෙන්නන්න යි. පැහැදිළි කරන්න යි. ඔප්පු කරන්න යි. ඒ ටික පෙන්නුවහම ඊගාවට එයාට ඉතුරුවෙනවා අපේ කෙලෙස් ටික ඒකට එකතු කළා නේ ද මේ විඤ්ඤාණය නමැති මායාකාරයා හදලා තියෙන්නේ. එතකොට උත්තරයක් එනවා, භාවනා කරනවා කියලා හැම වෙලාවේ ම වෙලා තියෙන්නේ එක දේක ඇත්ත දකින්න යි. අකැමැති කෙනෙක් පෙනෙනවා නම්, අකැමැති කෙනෙක් නෑ කියන්න එපා. අකැමැති කෙනෙක්, අකැමැති දේ හැදුවේ කොහොම ද කියලා බලන්න. මෙයා දරුවා කියලා පෙනෙනවා නම්, මේ රූපය දරුවා කියලා පෙනෙනකම හැදුනේ කොහොම ද කියලා බලන්න. මේක අඹ ගහක් නම්, මේ රූපය "අඹගහ" කියනකම හැදුනේ කොහොම ද කියලා බලන්න. මේ කය මම නම්, මම කියලා ඔබට පෙනෙනවා නම් මේ කය මම කියලා පෙනෙනවා කියන එක නෑ කියන්න එපා. මම කියලා කෙනෙක් නෑ කියන්නත්එපා. එතකොට උච්ඡේද වාදය යි. ඉන්නවා කියන්නත් එපා. එතකොට ශාස්වත වාදය යි. ඉන්නවා-නෑ කියන්න ත් එපා. එතකොට ශාස්වත-උච්ඡේද යි. නෑ-ඉන්නවා කියන්නත් එපා. එතකොට උච්ඡේද-ශාස්වත යි. මම කියන එක හැදුනේ කොහොම ද කියලා බලන්න. මේ ***නාමරූප පච්චයා විඤ්ඤාණං*** කියන කාරණාව : ඔච්චර ම යි ඔබට තියෙන භාවනාව.

ශීලයක පිහිටන්න. හොඳට සති නිමිත්තේ සිත තියාගෙන ආනාපානසතිය, බුදුගුණ, අශුභය, මරණය, මෛත්‍රිය ආදී කමටහණක් හොඳට වඩන්න. 'හිත කොහාටවත් යන්න දෙන්නේ නෑ' කියලා සති නිමිත්තේ සිත තියගෙන ඉන්නවා. හිත අහකට ගියොත් ආපසු මතක් කරළා සති නිමිත්තට ගන්නවා. ආයෙත් අහකට ගියොත් ආයෙත් මතක්කරලා ගන්නවා. අරගෙන හොඳට හිත වඩනවා.

කලින් කලට බාහිර සිහි නුවණින්, 'දුව' කියලා සිහිවුණොත්, දුව හැදුණු හැටි බලන්න. ඒ රූපය කන-බොන ආහාරයෙන් හැදුණු, කුණප කොටස් ටිකක්. සතරමහාධාතු යි. එබඳු රූපයක් ඇස් ඉදිරිපිටට එනකොට ඒ රූපයට 'දුව' කියලා හිතුවහම ඒ රූපයත්, මේ හිතපු එකත් දෙක ම එකට එකතු කරළා නේ ද ඒ රූපය 'දුව' කියන දැනගැනිල්ල ඇතිවුණේ. තාම ඒ රූපය "දුව" ම යි මගේ වුණාට ටික ටික හුරු කරන්න. ඔප්පු කරළා පෙන්නන්න. ඇයි ඒ රූපය මට දුව වුණාට තව කෙනෙකුට "දුව" හැටියට පෙනෙන්නේ නැහැ නේ. ඇස් ඉදිරිපිටට ඒ රූපය එන කොට එතැනින් වෙන විදියකට හිතුවා නම්, ඒ රූපය ත් එතැන හිතපු විදියට ත් එයාට දැනෙනවා මිසක, එතකොට ඒකෙන් පෙනෙන්නේ "හිතන හිතන විදියට දැනගත්තා මිසක, පෙනෙන දේ දැනගත්තා නෙවෙයි" කියන එක නේ ද කියලා ඔහොම අරමුණු ටිකක් ඔන්න හොඳට පෙන්නනවා.පෙන්නලා ආයෙත් ආනාපානසතිය වඩනවා. නැතිනම් ආයෙත් බුදුගුණ භාවනාව ගන්නවා. ආයෙත් මෛත්‍රී භාවනාව කරනවා. ආයෙත් හිත අහකට යන කොට, "නෑ කොහොටවත් යන්න දෙන්නේ නෑ" කියලා මතක් කරළා සති නිමිත්තට අරගෙන හොඳට මෛත්‍රී කමටහණ වඩනවා. ආපහු හිත අහකට ගියොත් ආයෙත් යන්න දෙන්නේ නැහැ. ගන්නවා.

මේ විදියට හොඳට මෛත්‍රී කමටහණ වඩලා ආයෙත් ඔය වගේ බාහිර කෙනෙක් කියලා පුද්ගලයෙක් කියලා සිහිවෙන අරමුණු ගත්තහම හොඳට රූපයේ අනාත්ම ස්වභාවයට පෙන්නලා, එබඳු රූපය අරභයා මේ විදියට හිතපුකම හින්ද මේ රූපය යි නාමය යි, මේ *නාමරූප පච්චයා විඤ්ඤාණං* - "මේ නාමරූප දෙක නිසා නේ ද මට ඒ රූපය කෙනෙක් කියන දැනගැනීම. පුද්ගලයෙක් කියන දැනගැනීම. පූසා කියන දැනගැනිම, බල්ලා කියන දැනගැනීම, ඇතිවුණේ" කියලා බලන්න.

කාලයක් ඔහොම බලන කොට තමන්ව ඇතිවෙච්චි හැටිත් බලන්න. රූපය හොඳට කුණප කොටස් ටිකක්, ධාතු මාත්‍රයක්, ආහාරයෙන් හැදෙන්නේ කියලා බලන්න. එබඳු රූපය ඇස් ඉදිරිපිටට තියාගෙන "මම" කියලා හිතුවහම, පෙනෙන රූපය යි මම කියලා හිතපු එක යි දෙක ම එකට එකතු කරළා මේ මම කියලා දැනගත්තා. දැන් මාව සිහිකරනවා කියලා අර සටහණ ඕනෑ වේලාවක විඤ්ඤාණය අත්දැකීම සිහිකරන්න පුළුවන්. විඤ්ඤාණයට අල්ලලා දුන්නා නේ දැන් මේ රූ සටහණ 'මම' කියලා. අවිද්‍යා ප්‍රත්‍යයෙන් පෙන්නුවේ නෑ නේ මේක, මේ දැනගැනිල්ල ඇතිවුණේ මෙහෙම යි කියලා. ඒක ම මම, මම, මම, මම කියලා ඒ අවිද්‍යාවෙන් ආපු උත්තරය ම භාවිතා කළා මිසක, සිහි කරන එකට අවිද්‍යාව ප්‍රත්‍ය වෙන්න දුන්නා මිසක, අවිද්‍යාව නිරුද්ධ කරන්න උත්සාහවත් වුණේ නැහැ.

ඒ හින්ද මෙතැන පෙනෙන දේ අරභයා සිහිකරළා දැනගන්නවා කියනකම නෙවෙයි දෝෂය. අවිද්‍යාව ප්‍රත්‍යවෙන එක යි. රහතන් වහන්සේට පුළුවන් මේ පෙනෙන දේට නම කියලා හිතන්න. හිතුවහම ඒක නම යි කියලා දැනගන්නත් පුළුවන්. හැබැයි මේ *නාමරූප පච්චයා විඤ්ඤාණං* කියලා දන්න හින්ද මම කියන්නේ මේ රූපය යි. මම කියන්නේ එක කියලා ආපහු මම කියන එක අර්ථ දක්වන්න යන්නේ නැහැ. මේ නාමරූප දෙක නිසා මම කියන දැනගැනීමක් ඇතිවෙයි. එච්චර යි. මම කියන්නේ රූපය, මම කියන්නේ නාමය කියලා මේ විඤ්ඤාණයට ආපසු නාමරූප දෙක පෙන්නන්නේ නෑ. පිහිට ලබන්නේ නෑ.

එතකොට විඤ්ඤාණය නො පිහිටියා කියයි. මේ විඤ්ඤාණයට, රූපය හෝ වේදනාව හෝ සංඥාව හෝ සංඛාරය කියයි. රූප වේදනා සංඥා කියන ටික තියෙන්නේ ස්පර්ශ ආහාරය කියන තැන යි. සංඛාරය කියලා කියන්නේ මනෝසඤ්චේතනා ආහාරයට යි. මේ විඤ්ඤාණයට ඔය දෙකේ පිහිටීම ලබා දුන්නේ නැත්නම්

විඤ්ඤාණය නො පිහිටියා. ඒ නිසා විඤ්ඤාණය නො පිහිටනවා නම් මේ ජීවිතය ම සියලු කෙලෙසුන්ගෙන් වෙන්වීම වෙනවා.

එතකොට නො පිහිටි විඤ්ඤාණයෙන් කළුරිය කළා වෙනවා. ස්කන්ධ පරිහරණය කරද්දීම ස්කන්ධ ටිකේ විඤ්ඤාණය පිහිටන්නේ නැති ශාස්ත්‍රය ඉගෙනගෙන තිබුනොත් තමයි,චරමක විඤ්ඤාණය, අන්තිම උපදින සිතත් නාමරූප දෙකේ පිහිට නො ලබන්නේ. මේ නාමරූප දෙකේ පිහිට විඤ්ඤාණය ලබලා, විඤ්ඤාණයේ පිහිට නාමරූප දෙක ලැබුවොත් ආපහු ආයතන හැදෙනවා ම යි. මේ නාමරූප දෙකේ පිහිට විඤ්ඤාණය ලබලා විඤ්ඤාණය නාමරූප දෙකේ පිහිට නො ලැබුවොත් ඔබට දැන් අම්මා වෙච්ච, දුව වෙච්ච, පුතා වෙච්ච රූපායතන නැතිවෙයි. ඒ ස්පර්ශයෙන් ඔබට අම්මා බලලා, දරුවා බලලා සතුටුවෙන්න පුළුවන්කමකුත් තියෙයි. ජරා-මරණ දුක එන්න පුළුවන් ඔක්කොමකම තියෙයි.

එතකොට මෙන්න මේ විදියට නුවණින් බැළුවොත් මම දන්නවා ඒකාන්තයෙන් ම හැම කෙනෙකුට ම වැඩි දවස් නො ගොස් මේ ශ්‍රේෂ්ඨ දර්ශනය පහළවෙනවා ම යි. ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මේ ස්කන්ධයන්ගේ උදය-වැය නො දැන අවුරුදු සීයක් ජීවත්වුනත්, හිස් ජීවිතයක්. ස්කන්ධයන්ගේ උදය-වැය දැනගෙන එක දවසක් ජීවත්වුණත් වටිනවා කියලා. මොකද,*නාමරූප පච්චයා විඤ්ඤාණං* - ස්කන්ධ ටිකේ ඇත්ත දැනගත්තහම යාථාභූත ස්වභාවය යි. *නාමරූප පච්චයා විඤ්ඤාණං* වෙන හැටි දන්නේ නැහැ කියන්නේ *නාමරූප පච්චයා විඤ්ඤාණං* කියන තැන නො දන්නා නිසා යි අපට විඤ්ඤාණයට හසුවෙන ලෝකයක් ඉදිරියෙන් හම්බවෙන්නේ.

ඉතින් ඒ ටිකත් මතක් කරළා ඔය පින්වතුන් භාවනා කරන්න ඔන්න ඕකයි මම කරන භාවනාව මම කියන්නේ. අද මම කියාපු විදියට ශීලයක පිහිටන්න. සති නිමිත්තේ සිත පිහිටුවාගෙන සමථ

කමටහණක් වඩන්න. අරමුණක් සිහිවුණොත්, දැනගත්තොත්, දරුවා කියලා දැනගත්තොත් බාහිර වස්තුවක් ගැන ඔබට සිහිකරන්න දැනගැනිල්ලක් ඇති. ඒ දැනගැනිල්ල ඇතිවුනේ කොහොම ද කියලා බලන්න. එච්චර යි. 'නෑ' කියන්න යන්න එපා. 'තියෙනවා' කියන්න ත් යන්න එපා. දරුවා කියලා සිහිවුණොත් දරුවා කියන දැනගැනිල්ල ඔබට ඇතිවුනේ කොහොම ද කියලා බලන්න. අම්මා කියලා සිහිවුණොත් අම්මා කියන දැනගැනිල්ල ඇතිවුනේ කොහොම ද කියලා බලන්න.

ඉතින් ඔන්න ඔය වගේ ඇත්ත බැළුවහම යි ලෝකයෙන් මිදෙන්න පුළුවන්කම හම්බවෙන්නේ. බාහිර සතරමහාධාතු තියෙන තැනක අම්මා-තාත්තා-දුව-පුතා-අයියා-අක්කා කියලා, සතරමහාධාතුවේ ලෝකයක් මවාගෙන ලෝකයා දුක් විඳින කොට ඒ ලෝකය ම, ඒ සතරමහාධාතුව ම ඇසුරු කරමින් ඔබ ඒ ලෝකයාගෙන් එතෙරවෙලා ඒ සියලු ලෝකයෙන් ම මිදිලා සියලු ජරා-මරණ දුකෙන් ද මිදිලා නිවීමක් හදගන්න පුළුවන්. මිදිලා ජීවත්වෙන්න පුළුවන්.

ඒකයි අර නව කර්මයාගේ ක්ෂය කිරීමෙන් විමුක්තිය ස්පර්ශ කරයි ද කියලා පෙන්නුවේ. එතකොට විපාක ස්කන්ධ ටික පරිහරණය කරනවා කර්ම රැස්වෙන්න දෙන්නේ නැහැ. පෙනෙනවා. පෙනෙන දේට හිතනවා. ඒත් කර්ම රැස්වෙන්න දෙන්නේ නැහැ. පෙනෙනවා. පෙනෙන දේට මම "බිත්තිය" කියලාත් හිතුවා. හිතලා දැනත් ගත්තා. හැබැයි කර්ම රැස්වෙන්නේ නැහැ. මම ටක් ගාලා නුවණ එනකොට බිත්තියක් අල්ලන්නේ නැහැ. අල්ලන්න බිත්තියක් ඉතුරු කරන්නේ නැහැ. ඒ රූපයට බිත්තිය කියලා හිතලා දැනගත්තහම දැනගත්ත දේ ඊට එහාට යන්න දෙන්නේ නැහැ. ආපහු විඤ්ඤාණය-නාමරූප දෙකට පරාවර්තනය වුණොත් නාමරූප පච්චයා සලායතන, සලායතන පච්චයා ඵස්ස. එහෙම වුණොත් බිත්තිය වූ ආයතනයක් හම්බවෙයි මට. ඒ ආයතනය

ස්පර්ශ වෙයි මට. එහෙම වුනොත් සියලු ජරා-මරණ දුක ම හම්බවෙනවා. හැබැයි දෙවනුවත් යන්න එපා කියන එක යි හැමවෙලේ ම මතක් කරන්නේ.

ඉතින් ඒ නිසා දන්න විදියට ටිකක් හැමදෙනා ම භාවනා කරන්න. හොඳයි එහෙනම් හැමදෙනා ම කල්පනා කරගන්ට අද දවස පුරාවට ම ඉතා වටිනා කුසල කර්ම රාශියක් ම සිද්ධකරගත්තා. උදෑසන ඔබ අප සියලු දෙනාට ම අනුකම්පාවෙන් අපේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ ධර්ම දේශනාවක් පවත්වා වදාළා. සමාහිත ස්වාමීන් වහන්සේ අපට ධර්ම දේශනාවක් අනුශාසනාවක් කරලා දුන්නා.

ඒ වාගේ ම මටත් හැකි විදියට ස්වාමීන් වහන්සේලා පෙන්නාපු ඒ ධර්මතා ටිකේ යථාර්ථයත්, ඒක පෙන්නුවේ කුමන අර්ථයක් සඳහා ද කියන එකත් පෙන්නලා එතැන ඉඳලා කර්ම කෙලෙස් ඇතිවන හැටි හා කර්ම ක්ෂය කරගන්න, කෙලෙස් දුරුකරගන්න කළ යුත්තේ මොකක් ද කියන එක හරහා භාවනා කරන හැටි ත් මම කියලා දුන්නා. මම හිතන්නේ ඔබට නුවණක් තියේ නම් ඔබට ඇත්තට ම මේ වෙන කොට භාවනා කරනවා කියන එක තේරෙන්න ඕනේ.

ඉතින් මේ තුළින් විශාල කුසලයක් ජනිත වුණා. ඒ සියලු කුසල් ලෝකයත් සම්බුද්ධ ශාසනයත් ඔබවත් අපවත් ශාසනයත් ආරක්ෂා කරන්නා වූ ශාසන මාමක සම්මාදිට්ඨික සියලු දෙවියෝ මේ පින් අනුමෝදන් වෙත්වා. දෙවියන්ගේ දිව ඉසුරු වඩා වර්ධනය කරගනිත්වා නිවනින් සැනසෙත්වා කියලා අපි සාදු නාදයක් දී පින් අනුමෝදන් කරමු.

තෙරුවන් සරණ යි.

පිට කවරයේ ඇතුල් පැත්ත.

භාවනා කරනවා කියලා හැම වෙලාවේ ම වෙලා තියෙන්නේ එක දේක ඇත්ත දකින්න යි. අකැමැති කෙනෙක් පෙනෙනවා නම්, අකැමැති කෙනෙක් නෑ කියන්න එපා. අකැමැති කෙනෙක්, අකැමැති දේ හැදුවේ කොහොම ද කියලා බලන්න. මෙයා දරුවා කියලා පෙනෙනවා නම්, මේ රූපය දරුවා කියලා පෙනෙනකම හැදුනේ කොහොම ද කියලා බලන්න. මේක අඹ ගහක් නම්, මේ රූපය "අඹගහ" කියනකම හැදුනේ කොහොම ද කියලා බලන්න. මේ කය මම නම්, මම කියලා ඔබට පෙනෙනවා නම් මේ කය මම කියලා පෙනෙනවා කියන එක නෑ කියන්න එපා. මම කියලා කෙනෙක් නෑ කියන්නත්එපා. එතකොට උච්ඡේද වාදය යි. ඉන්නවා කියන්නත් එපා. එතකොට ශාස්වත වාදය යි. ඉන්නවා-නෑ කියන්න ත් එපා. එතකොට ශාස්වත-උච්ඡේද යි. නෑ-ඉන්නවා කියන්නත් එපා. එතකොට උච්ඡේද-ශාස්වත යි. මම කියන එක හැදුනේ කොහොම ද කියලා බලන්න. මේ *නාමරූප පච්චයා විඤ්ඤාණං* කියන කාරණාව : ඔච්චර ම යි ඔබට තියෙන භාවනාව.

ශීලයක පිහිටන්න. හොඳට සති නිමිත්තේ සිත තියාගෙන ආනාපානසතිය, බුදුගුණ, අශුභය, මරණය, මෛත්‍රිය ආදී කමටහණක් හොඳට වඩන්න. 'හිත කොහාටවත් යන්න දෙන්නේ නෑ' කියලා සති නිමිත්තේ සිත තියගෙන ඉන්නවා. හිත අහකට ගියොත් ආපසු මතක් කරළා සති නිමිත්තට ගන්නවා. ආයෙත් අහකට ගියොත් ආයෙත් මතක්කරලා ගන්නවා. අරගෙන හොඳට හිත වඩනවා.



This document was created with the Win2PDF “print to PDF” printer available at
http://www.win2pdf.com

This version of Win2PDF 10 is for evaluation and non-commercial use only.

This page will not be added after purchasing Win2PDF.

http://www.win2pdf.com/purchase/